# සීමාසහිත ලංකා නැව් සංස්ථාව

***(1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා සහ රජය සතු ව්‍යාපාරික ආයතන රජයේ සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ 1992.06.01 වන දින සිට සමාගමක් බවට පරිවර්තනය කර ඇත)***





# වාර්ෂික වාර්තාව

# 2020/2021

## ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රවාහකයා

# සී.ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්

# 2020/2021


| | පිටු අංකය |
|---|---|
| පටුන | 1 |
| දැක්ම හා මෙහෙවර ප්‍රකාශය | 2 |
| පිළිගැන්වීමේ ලිපිය | 3 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 4-5 |
| කළමණාකරණ කණ්ඩායම | 6-7 |
| සභාපතිවරයාගේ සමාලෝචනය | 8 -10 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 11 -12 |
| තිරසාරත්ව වාර්තාව | 13 -15 |
| විගණන කමිටුවේ වාර්තාව | 16 -20 |
| තුති ප්‍රණාමය කාර්ය මණ්ඩලයට ස්තුතිය | 21 |
| ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 22 -38 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 39 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 40 -41 |
| කොටස් ආයෝජන වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 42 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 43 -44 |
| මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් | 45 -83 |
| පරිපාලන වියදම් | 84 -85 |

සී.ස. ලංකා නැව් සංස්ථාව

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

**2020/2021**

දැක්ම හා මෙහෙවර ප්‍රකාශය :

# දැක්ම

දේශය වෙනුවෙන් බලාපොරොත්තු නැංවිය හැකි ඵලදායි ජාතික නාවික ඇණියක් ස්ථාපනය කිරීම සහ නාවික සේවා සම්පාදන පහසුකම් සැලසීම.

---

# මෙහෙවර

ජාතික නාවික ප්‍රවාහකයා වශයෙන් ශ්‍රී ලංකාවේ ආනයන, අපනයන සහ දේශීය වශයෙන් මුහුදුබඩ වෙළඳාම් ආශ්‍රිත භාණ්ඩ හා සේවා සම්පාදන අවශ්‍යතා සැලසීම.

---

**සී.ස. ලංකා නැව් සංස්ථාව වාර්ෂික වාර්තාව සහ ගිණුම්**

**2020/2021**

**පිළිගැන්වීමේ ලිපිය**

ගරු වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,
වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය,
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ 01.

අමාත්‍යතුමනි,

රාජ්‍ය සංස්ථා සහ රජය සතු සමාගම් රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීම සඳහා වූ 1987 අංක 23 දරන සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව 2020.04.01 දින සිට 2021.03.31 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සමාගමේ ක්‍රියාකාරකම් පිළිබඳ සම්පාදිත වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය මෙයින් ඉදිරිපත් කරමි.

මීට
විශ්වාසී,

ඩබ්ලිව්.එස්. වීරමන්
සභාපති

සී.ස. ලංකා නැව් සංස්ථාව
අංක 27, යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල
ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවත
කොළඹ 01.
30.09.2022

**<u>ශ්‍රී.ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්</u>**

**2020/2021**

**අධ්‍යක්ෂ මණ්ඩලය**

**2020.04.01 සිට 2021.03.31 දක්වා**

ඩබ්ලිව්. එස්. වීරමන් මහතා
සභාපති
2019.12.20 සිට අද දක්වා

දිමුත් ෂාගොඩආරච්චි මහතා
විධායක අධ්‍යක්ෂක
2020.10.08 සිට අද දක්වා

ඩි .එච් .එස් . පුල්ලපෙරුම මිය
අධ්‍යක්ෂක/ භාණ්ඩාගාර නියෝජිත
2020.01.11 සිට අද දක්වා

වෛද්‍ය අයි.ඩී.එම්. රත්නායක මහතා
අධ්‍යක්ෂක
2019.12.20 සිට 2020.10.08 දක්වා

වෛද්‍ය ජී.ඒ.ජේ. සංජීව බණ්ඩාර මහතා
අධ්‍යක්ෂක
2019.12.20 සිට 2020.10.08 දක්වා

ජේ.එම්. ජයතිලක මහතා
අධ්‍යක්ෂක
2019.12.20 සිට 2020.10.08 දක්වා

පි.එන්.ජී. දර්ශන සිල්වා මහතා
අධ්‍යක්ෂක
2019.12.30 සිට 2020.10.07 දක්වා

ශෙහාරා ජයවර්ධන මිය
අධ්‍යක්ෂක
2020.10.07 සිට අද දක්වා

හාතිය උඩුමලගල මහතා
අධ්‍යක්ෂක
2020.10.08 සිට අද දක්වා

රංග ගුණවර්ධන මහතා
අධ්‍යක්ෂක
2020.10.07 සිට අද දක්වා

මෙවන් පීරිස් මහතා
අධ්‍යක්ෂක
2020.10.08 සිට අද දක්වා

**සමාගම් ලේකම්**
මල්කාන්ති ගුණසේකර මහත්මිය
ACCS හි ආශ්‍රිත සාමාජික
කම්කරු සබඳතා සහ මානව සම්පත් කළමණාකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාධාරී
කොළඹ විශ්ව විද්‍යාලය

**අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්**
පි. සමරනායක මහතා
නීතිඥ, විද්‍යාවේදී (B.Sc)(විශේෂ)
2020.09.28 දින දක්වා

**අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්**
වයි.ටී. ප්‍රබෝධිත මහතා
නීතිඥ, BASL හි යාවජීව සාමාජික
විද්‍යාවේදී (B.Sc)
2020.09.28 දින සිට අද දක්වා

**බැංකුකරුවන්**
මහජන බැංකුව - ආයතනික බැංකු අංශය
ලංකා බැංකුව
කොමර්ෂල් බැංකුව පී.එල්.සී

**විගණකවරු**
විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, නො. 306 / 72 පොල්දූව පාර, බත්තරමුල්ල.

**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම**

සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම 11 (එකොළහ) ක් පවත්වන ලදී.

**ලියාපදිංචි කාර්යාලය**
සී/ස ලංකා නැව් සංස්ථාව
අංක 27, යෝනක ඉස්ලාමීය සංස්කෘතික ගොඩනැගිල්ල
රසීක් ෆරිඩ් මාවත
කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථනය +94 112328772/3
ෆැක්ස් +94 112449486
විද්‍යුත් කැපැල cscl@cscl.lk
වෙබ් අඩවිය www.cscl.lk

## සී.ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

## 2020/2021

**<u>කළමනාකරණ කණ්ඩායම</u>**

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී 2021.01.07 දක්වා**
**සාමාන්‍යාධිකාරී 2021.01.08 සිට අද දක්වා**
සී. ජයසිංහ මහත්මිය
එෆ්.අයි.සී.එස්, එම්.අයි.එල්.ටී - එක්සත් රාජධානිය
විද්‍යාපති - (ජාත්‍යන්තර නාවික කටයුතු) - එක්සත් රාජධානිය
නාවික කටයුතු පිළිබඳ ඩිප්ලෝමාධාරී (ඔස්ලෝ)

**නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (වැඩබලන) (නෛතික හා රක්ෂණ/ මානව සම්පත්)**
පි. සමරනායක මහතා (නීතිවේදී)
විද්‍යාවේදී (විශේෂ)

**නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (වෙළඳ)**
වයි. එස්. වෙත්තසිංහ මහත්මිය
විද්‍යාවේදී (සාමාන්‍ය)
නාවික විද්‍යාපති - ඩබ්ලිව්.එම්.යූ (මැල්මෝ - ස්වීඩන්)
එම්.අයි.එල්.ටී - එක්සත් රාජධානිය

**නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (නෛතික හා රක්ෂණ/ මානව සම්පත්)**
එස්.ඒ.එස්.කේ. ජයසේකර මහත්මිය (නීතිවේදී)
විද්‍යාවේදී, විද්‍යාපති ජාත්‍යන්තර ව්‍යාපාර සහ වාණිජ නීතිය
බටහිර ලන්ඩන් විශ්ව විද්‍යාලය

**සහකාර සමාන්‍යාධිකාරී (මූල්‍ය)**
ජී.එම්. විකුම් ප්‍රදීප මහතා
වාණිජ විද්‍යාවේදී (විශේෂ) ගෞරව, එල්.අයි.සී.ඒ
නාවික විද්‍යාපති - ඩබ්ලිව්.එම්.යූ (මැල්මෝ - ස්වීඩන්)

**එතෙර සඳහා පත්කළ නිලධාරී**
කැප්ටන් නිෂ් විජයකුලතිලක මහතා
Master Mariner, MBA (Col), CMILT, AFNI(Uk)
IMO Maritime Ambassador, UNA සාමාජික

**තාක්ෂණික අධිකාරී 2021.03.05 සිට අද දක්වා**
ලීල් සෙනෙවිරත්න මහතා
නාවික ඉංජිනේරු නිලධාරී (1 වැනි පන්තිය)
ISM & ISPS අභ්‍යන්තර විගණක
එක්සත් රාජධානියේ නාවික ඉංජිනේරු විද්‍යා හා තාක්ෂණික ආයතනය (IMAREST) සාමාජික
ශ්‍රී ලංකා ප්‍රධාන ඉංජිනේරු සංගමයේ (SOCEM) සාමාජික
ශ්‍රී ලංකා වෘත්තීයවේදී සංගම් සංවිධානයේ (OPA) සාමාජික

**කාර්මික අධිකාරි 2021/ 03/ 01 සිට අද දක්වා**

වරක වික්‍රමනායක මහතා

වරලත් ඉංජිනේරු (එක්සත් රාජධානිය), වරලත් නාවික ඉංජිනේරු (එක්සත් රාජධානිය)

ආයතනික ඉංජිනේරු ශ්‍රී ලංකා

ප්‍රධාන ඉංජිනේරු නිලධාරි වශයෙන් ප්‍රවීනතා සහතිකය (COC Class 1 Unlimited )

නාවික ඉංජිනේරු විද්‍යා සහ තාක්ෂණික (IMAREST) ප්‍රවීනතා සහතිකය

එක්සත් රාජධානියේ -AFNI අධි සාමාජික

AMRINA හා ආශ්‍රිත සාමාජික

ආයතනික ඉංජිනේරු ආයතනයේ ( SL -MIIESL.) සාමාජික

**අභ්‍යන්තර විගණක**

වයි. පොන්නම්පෙරුම මහතා

එල්.අයි.සී.ඒ, එෆ්.එම්.ඒ.ඒ.ටි

නාවික කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධිධාරි (ඔස්ලෝ)

**නැව් කුලියට දීම සහ එජන්සි සේවා කළමණාකරු**

අයි. දන්තනාරායන මහතා

විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ (විශේෂ) ගෞරව - නාවික කටයුතු පිළිබඳ විද්‍යාපති ( මැල්මෝ - ස්විඩන් )

එම්.අයි.එල්.ටි. එක්සත් රාජධානිය - එල්.අයි.සී.ඒ

**කළමනාකරු (ලේඛණකරණය)**

කේ.එල්.එම්. මධුරාජා මහතා

වාණිජ විද්‍යාවේදී (විශේෂ) ගෞරව උපාධිය

නාවික විද්‍යාපති - WMU (මැල්මෝ-ස්විඩන්)

**කළමානාකරු (නැව්, භාණ්ඩ හා සේවා සම්පාදන, NVOCC)**

එන්.පී. කල්පගේ මහතා

ශාස්ත්‍රවේදී (විශේෂ)

නාවික විද්‍යාපති - WMU (මැල්මෝ - ස්වීඩන්)

**වැඩබලන කළමනාකරු (මානව සම්පත්)**

එම්. ගුණසේකර මහත්මිය

සමාගම් ලේකම් - ACCS හි ආශ්‍රිත සාමාජික

කම්කරු සබඳතා හා මානව සම්පත් කළමණාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී
කොළඹ විශ්ව විද්‍යාලය

**පරිපාලන ප්‍රධානි**

එම්.ආර්.එල්.පි.පි. ගුණරත්න මහතා

කළමණාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරි - විවෘත විශ්ව විද්‍යාලය
ව්‍යාපාරික තොරතුරු ඩිප්ලෝමාධාරී

සී/ස ලංකා නැව් සංස්ථාව වාර්ෂික වාර්තාව සහ ගිණුම්

**2020/2021**

## සභාපතිවරයාගේ සමාලෝචනය

ශ්‍රී ලංකාවේ ජාතික නාවික ප්‍රවාහකයා වන සී/ස ලංකා නැව් සංස්ථාවේ 2021 මාර්තු 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද ගිණුම් සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය සමඟින් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

කොවිඩ්-19 වසංගතය දුරුකර ගැනීමේ අභියෝගයට මුහුණ දීමට සිදුවූ බැවින් 2020/21 වර්ෂය තවත් සුවිශේෂී මූල්‍ය වර්ෂයක් විය. මෙකී දුෂ්කර කාලසීමාවන් හිදී ද සියලු අංශ වල මෙහෙයුම් කටයුතු අඛණ්ඩව ඉදිරියට ගෙන යාමට සහ තම බැඳියාවන් සියල්ලක්ම ඉටු කිරීමට නැව් සංස්ථාව සමත් වී තිබෙන බව සඳහන් කරනු කැමැත්තෙමි.

## වියලි තොග නාවික වෙළඳපොල

Clarkson Research Services ආයතනයට අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2020 වියලි තොග වෙළඳාම සම්බන්ධයෙන් අඩුවක් විද්‍යාමාන විය. 2020 මුල් කාර්තුව සඳහා Clarkson දත්ත අනුව කොරෝනා වෛරසය ඇතිවීම හේතුකොටගෙන නැව් තැනීමේ කර්මාන්තය කෙරෙහි කැපී පෙනෙන බලපෑමක් ඇතිවිය.

ලංකා නැව් සංස්ථාවේ නාවික යාත්‍රා වලින් අය කෙරුනු කුලී අනුපාතයන් සාපේක්ෂක වශයෙන් ඉකුත් මූල් වර්ෂයට වඩා අඩුවිය.

## මෙහෙයුම් කටයුතුවල නැව් යෙදවීම

අප්‍රේල් මස සිට සැප්තැම්බර් මැද දක්වා වූ නිරිත දිග මෝසම් කාලය තුල සී/ස ලංකා නැව් සංස්ථාව සතු Ceylon Breeze සහ Ceylon Princess නෞකා දෙක සිංගප්පූරුවේ පිහිටා තිබෙන වාණිජ කළමනාකරණ සමාගමක් යටතේ ජාත්‍යන්තර කුලී වෙළඳපොලෙහි සාර්ථකව යොදවා තිබූ අතර 2020/21 වර්ෂය තුල උපරිම ප්‍රයෝජ්‍යතාවක් වාර්තා කිරීමට සමත් විය.

මෝසම් රහිත කාලය තුල RCBT, දකුණු අප්‍රිකාව සහ පුත්තලම තාප බලාගාරය අතර, ලංකා විදුලිබල මණ්ඩලය වෙනුවෙන් මෙම නාවික යාත්‍රා ගල් අඟුරු ප්‍රවාහණ කටයුතුවල යොදවන ලදී.

## රාජ්‍ය අංශයේ ආනයන

අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව රාජ්‍ය අංශයේ නාවික භාණ්ඩ ප්‍රවාහණය කිරීමේ කටයුත්ත ලංකා නැව් සංස්ථාවට පවරන ලදී. ඒ අනුව බහාලුම්ගත භාණ්ඩ , මෝටර් රථ, විසිරි තොග හා අධිබරැති ගණයේ නැව්බඩු, සාමාන්‍ය නැව්බඩු ඉඩකුලී හා යාත්‍රා පදනමින් හා තෙවැනි පාර්ශව නැව් යොදා ගනිමින් ලොව පුරා භාණ්ඩ ප්‍රවාහණය කරන ලදී.

## මූල්‍ය කාර්ය සාධනය

වත්කම් අපවය වීම නොසලකා 2020/21 වර්ෂය තුලදී සමාගම විසින් රු.බිලියන 1.06 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කරනු ලැබිය. රුපියල් මිලියන 161.70 ක් වටිනා වත්කම් අපවය වීම ගණන් බැලීමෙන් පසුව 2020/21 දී මෙහෙයුම් ලාභය රු. මිලියන 903.96 ක් සමාගම විසින් උපයන ලදී. 2019/20 වර්ෂය සමඟ සසඳන කල, මෙහෙයුම්වලින් ලද ලාභය ආසන්න වශයෙන් 7% කින් වැඩි විය. කෙසේ නමුත් මූල්‍ය වියදම් ගැලපීමෙන් පසුව, ( එනම් මහජන බැංකුවෙන් ලබාගත් ණය සඳහා පොලිය සහ ණය සම්බන්ධයෙන් දැරීමට සිදුවූ විණිමය පාඩුව ) ,  බද්දෙන් පසු පාඩුව 2020/21 දී රු. මිලියන 527.12 ක් විය. මෙය 2019/20 වර්ෂයේ බද්දෙන් පසු පාඩුව බිලියන 1.09 හා සසදන කල ආසන්න වශයෙන් (51%) ක අඩුවීමකි.

2020/21 කාලසීමාව තුල රු. බිලියන 3.09 ක සමස්ත ආදායමක් අත්කර ගැනීමට ලංකා නැව් සංස්ථාව සමත් විය. 2019/20 මූල්‍ය වර්ෂය සමඟ සසඳා බලන විට මෙය ( 20%) වසරින් වසර ඇතිවන අඩුවීමකි. වාර්තා වූ ඍජු මෙහෙයුම් වියදම්වල වටිනාකම 2020/21 රු. බිලියන 2.04 ක් වූ අතර එම වියදම් 2019/20 වර්ෂයේදී රු. බිලියන 2.64 ක් විය. ඒ අනුව ඍජු මෙහෙයුම් වියදම් 2020/21 වර්ෂයේදී ආසන්න වශයෙන් (23%) කින් අඩුවිය. 2020/21 වර්ෂය තුල පැවති ගෝලීය කොවිඩ් - 19 වසංගත තත්ත්වය 2020/21 වර්ෂයේ ආදායම අඩුවීම කෙරෙහි බලපෑවේය.

## ලංකා නැව් සංස්ථාවේ නාවික යාත්‍රා මෙහෙයුම් කටයුතුවල යෙදවීම තුලින් ආදායම

නිරිතදිග මෝසම් කාලය තුල වාණිජ කළමනාකරණ ගිවිසුමක් යටතේවූ ලංසු ක්‍රියාවලියක් හරහා තෝරාගත් කුලී මෙහෙයුම් කරුවෙකු (Chaterer) ලංකා නැව් සංස්ථාවේ නාවික යාත්‍රාදෙක මෙහෙයුම් කටයුතුවල යෙදවීම මඟින් 2019/20 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 2020/21 වර්ෂයේදී ආසන්න වශයෙන් (0.8%) ක ආදායම් අඩුවීමක් වාර්තා විය. නැව් මඟින් උපයා ගන්නා ලද සමස්ත ආදායම රු. මිලියන 587 ක් විය.

2019/2020 දිනකට ලැබූ එ.ජ. ඩොලර් 10,941.67 ක් වූ කුලී ආදායමට අනුව 2020/2021 වර්ෂයේ නාවික යාත්‍රා දෙකෙන් දිනකට ලැබූ කුලී වටිනාකමේ සාමාන්‍යය දිනකට එ.ජ. ඩොලර් 7,283 ක් විය.

ඉකුත් වර්ෂය සමඟ සසඳා බලන කල සමාගම සතු නැව් දෙක මඟින් ගල් අඟුරු ප්‍රවාහණය කිරීම හරහා 2020/21 වර්ෂයේ දී ලද ආදායම (13%) කින් අඩුවිය. වාර්ෂික ධාරිතාව වන ගල් අඟුරු මෙ.ටො. මිලියන 2.229 න් මෙ.ටො. මිලියන 0.552 ක්ම ලංකා ගල් අඟුරු සමාගම/ ලංකා විදුලිබල මණ්ඩලය වෙනුවෙන් ප්‍රවාහණය කරන ලද්දේ සමාගම සතු නාවික යාත්‍රාදෙක මඟින් වූ අතර එයින් රු. බිලියන 1.42 ක ආදායමක් 2020/21 වසරේදී උපයා ගැනීමට හැකිවිය.

තෙවැනි පාර්ශවයේ නාවික යාත්‍රා යොදා ගනිමින් ගල් අඟුරු ප්‍රවාහණ කටයුතු සිදු කිරීම සහ ගොඩබෑම් කටයුතු සිදු කිරීමේ ක්‍රියාවලිය හරහා ඒජන්සි කොමිස් ගාස්තු සහ ඇමතුම් කොමිස් වශයෙන් ලද ආදායම 2020/21 වර්ෂයේදී (12%) කින් අඩුවී තිබිණි.

සමාගම විසින් උපයාගත් ආදායමෙන් 65% ක් නියෝජනය වූයේ ලංකා නැව් සංස්ථාව සතු ස්වකීය නාවික යාත්‍රා මෙහෙයුම් කටයුතු තුලිනි.

## නෞකාමය නොවන පොදු ප්‍රවාහණ කටයුතු වලින් ( NVOCC ) ලැබුණු ආදායම

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී නෞකාමය නොවන පොදු ප්‍රවාහණ ( NVOCC ) කටයුතු වලින් ලද ආදායම රු. බිලියන 1.06 සිට රු. මිලියන 597.83 දක්වා අඩු අගයක් පෙන්නුම් කලේ 2020/21 කාලසීමාව තුල විශේෂ නාවික භාණ්ඩ නැව්ගත කිරීම් සංඛ්‍යාව අඩුවීම නිසාය. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව (43%) ක පහත වැටීමකි. තවද, 2020/21 කාල වකවානුව තුල ලොව පුරා පැවති වසංගත තත්ත්වය හේතුකොටගෙන ඇතැම් වරායන් වසා දැමීමට සිදුවීම වරායන්හි කාර්යමණ්ඩල අඩුවීම නිසා කාර්යක්ෂමතාව අඩුවීම මත ඇතිවූ වරාය තදබදය, බහාලුම් හිඟතාවය ගෙන්ගෙට පහසුකම් සැලසීම සඳහාවූ ප්‍රවාහණ විධික්‍රම නොමැතිවීම නිසා මෙහෙයුම් කටයුතුවලින් ලැබීමට තිබූ ලාභය පහත වැටුණි.

## ව්‍යවහාර මුදල අවප්‍රමාණය වීම

එ.ජ. ඩොලරයට අනුව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම නිසා සමාගමට ආර්ථික වශයෙන් අහිතකර බලපෑමක් එල්ල විය. 2020/21 වර්ෂයේදී ආසන්න වශයෙන් 5% කින් විනිමය අනුපාතය අවප්‍රමාණය විය. 2015/2016 වර්ෂයේදී මහජන බැංකුවෙන් ලබාගත් (නැව් තැනීම සඳහා) ණය සමඟ සසඳන කල විනිමය අනුපාතය 2020/21 දී 38% කින් අවප්‍රමාණය විය. මෙයින් ඇතිවූ ඍජු බලපෑම හේතුකොටගෙන නැව් තැනීම සඳහා ලබාගත් එකී ණය සම්බන්ධයෙන් රු. මිලියන 684.46 ක විනිමය පාඩුවක් (ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති ප්‍රකාරව වාර්ෂික ගිණුම්වල අනිවාර්යෙන් සඳහන් කල යුතු) සිදුවිය.

කෙසේ නමුත් නාවික යාත්‍රා තැනීම සඳහා ලබාගත් එකී ණය වෙනුවෙන් සම්පූර්ණ පොලී වාරිකය වන රු. මිලියන 756.81 ක මුදල 2020/21 වර්ෂයේදී සම්පූර්ණයෙන් ගෙවා දැමීමට සංස්ථාව සමත් විය.

තවද, කැපීපෙනෙන විනිමය පාඩුව හා ණය පොලී වාරිකය හේතුවෙන් 2020/21 වර්ෂයේදී රු. මිලියන 813.32 ක වාර්ෂික පාඩුවක් දැරීමට සිදුවිය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මෙකී පාඩුව (30%) කින් අඩුවී තිබේ.

## සේවක සේවිකාවන්

2021.03.31 දිනට සමාගමේ මුළු සේවක සංඛයාව 122 ක් වූ අතර 2020/21 වර්ෂය සඳහා වැටුප් හා වේතන සඳහා වියදම් වූ මුදල රු. මිලියන 129.15 ක් විය. පරිපාලන වියදම් රු. මිලියන 215.8 ක් වූ අතර 2019/20 වර්ෂය සමඟ සසඳන කල ආසන්න වශයෙන් එය (0.4%) අඩුවීමක් පෙන්නුම් කළේය.

නාවික ක්ෂේත්‍රය තුල ඇතිවන තාක්ෂණික ප්‍රවණතාවන් අනුව කටයුතු කිරීමට වෘත්තීය මට්ටමින් හා දක්ෂ අයුරින් නැව් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු සිදුකිරීම සඳහා මැනවින් පුහුණුව ලත්/ පළපුරුදුකම් සහිත කාර්ය මණ්ඩලයක් නැව් සංස්ථාව තුල තිබීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබේ.

එබැවින් වාර්ෂිකව කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ කාර්යභාරයන් උදෙසා රු මිලියන 2 ක් වෙන් කර ඇති අතර එයින් රු. 227,775 ක මුදලක් 2020/21 වර්ෂයේදී කාර්ය මණ්ඩල සාමාජිකයන් 15 දෙනෙකු නාවික හා මූල්‍ය වැඩසටහන් යටතේ පුහුණු කිරීම සඳහා සමාගම විසින් වැයකොට ඇත.

## සමාගමේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
## 2020/2021

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අතිවිශේෂ මහා සභා රැස්වීමේදී ඉදිරිපත් කරනු පිණිස විගණනය කරන ලද තම ගිණුම් සහිත වාර්තාව ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රීතියෙන් ඉදිරිපත් කර සිටී.

### වර්ෂයේ සමාලෝචනය

පිටු අංක 08 සිට 10 දක්වා සභාපතිගේ සමාලෝචනය යටතේ විස්තර කොට දැක්වෙන්නේ ප්‍රවර්තන මූල්‍ය වර්ෂ තුළ සහ මෙම වාර්තාවේ දිනට,මුහුණදීමට තිබෙන ඉදිරි අභියෝගයන්ය. මෙම වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන තුලින් පිළිබිඹු වන්නේ සමාගමේ කටයුතු වල තත්ත්වයයි.

### ප්‍රධාන ක්‍රියාකාරකම්/ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු

සමාගමේ ප්‍රධාන කටයුතු වන්නේ නැව් බඩු මුහුදු මගින් ප්‍රවාහනය කිරීම, ඒ ඒ ස්ථාන දක්වා ඒවා බෙදාහැරීම, නැව් බඩු ප්‍රවාහනය සඳහා රැස් කිරීම, ශ්‍රී ලංකික තානාපති කාර්යමණ්ඩලයන් හී ගෘහස්ත හා පෞද්ගලික බඩු බාහිරාදිය එක් එක් රටවල් කරා ගෙන යාම, රේගුව (customs house) ආශ්‍රිතට ඒජන්සි කටයුතු නාවික නියෝජ්‍ය ආයතන සේවා, නැව් හිමියන්, කළමණාකරුවන් හා මෙහෙයුම් කරුවන්, නැව් කුලියට දෙන තැනැත්තන් සමග කටයුතු කිරීම වේ.

ලංකා නැව් සංස්ථාව සියලු ආකාරයේ බහාලුම්ගත ද්‍රව්‍ය, ගල් අඟුරු, විසිරි තොග ගල් අඟුරු තොග, වාහන, ව්‍යාපෘතිවලට අදාළ නාවික භාණ්ඩ හා බරැති නාවික භාණ්ඩ වැනි දෑ ප්‍රවාහණය කිරීමෙහි නිරත වේ.

### මූල්‍ය ප්‍රකාශ

2007 අංක 07 දරණ සමාගම් පණතේ 151 වගන්තියේ නියමයන් ප්‍රකාරව පිළියෙල කරන ලද වාර්ෂික වාර්තාවේ පිටු අංක 39 - 83 දක්වා වූ පිටුවල මූල්‍ය ප්‍රකාශ දැක්වේ.

### ස්වාධීන විගණනකරුවන්ගේ වාර්තාව

මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකයින්ගේ වාර්තාව මෙම වාර්තාවේ 22 - 38 වැනි පිටුවල සඳහන් කොට ඇත.

ගිණුම් ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීම් සටහන්

සමාලෝචනයට අදාල වර්ෂය තුලදී සමාගම විසින් අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති වල වෙනසක් සිදු වී නැත. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී භාවිත කරන ලද ගිණුම් ප්‍රතිපත්ති හා පැහැදිලි කිරීම් සටහන් පිටු අංක 45 සිට 83 දක්වා සඳහන් කොට ඇත.

මූල්‍ය ප්‍රතිඵල / ලාභ සහ විසර්ජන

විස්තීරණ ආදායම් ප්‍රකාශය 39 පිටුවේ දැක්වේ.

දේපල, පිරියත හා උපකරණ

සමාලෝචනයට අදාල වර්ෂය තුළදී සමාගම රු.මිලියන 1,750 ක්, දේපල, පිරියත හා උපකරණ යන විෂයන්හි ආයෝජනය කොට ඇත. මූල්‍ය ප්‍රකාශ සඳහා වූ අංක 10 දරණ සටහන මගින් වර්ෂය තුළදී දේපල, පිරියත හා උපකරණ සංසරණය පිළිබඳ විස්තර දැක්වේ.

ආයෝජන

2021 මාර්තු 31 දිනට සමාගම විසින් සිදුකරන ලද දිගුකාලීන ආයෝජන පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ සඳහා වූ අංක 13,14,15 සහ 16 සටහන් වල 64 සිට 68 දක්වා පිටුවල සඳහන් කොට ඇත.

ලාභාංශ

2021 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා ලාභාංශ ගෙවීම අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ නොකරයි.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2007 අංක 07 දරන සමාගම පනතේ නියමයන් ප්‍රකාරව 2021 මාර්තු 31 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.50,000,000.00 ක් වේ. 71 පිටුවේ ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විස්තර අංක 23 සටහන මගින් දක්වා ඇත.

ක්‍රියාත්මක සමාගමක් බව

සමාගමේ ව්‍යාපාරික සැලැස්ම අධ්‍යක්ෂ වරුන් විසින් සමාලෝචනය කරනුලැබ තිබෙන අතර ක්‍රියාත්මක සමාගමක් වශයෙන් ඉදිරියේදී තවදුරටත් පැවතීම සඳහා ප්‍රමාණවත් සම්පත් ඊට ඇති බවට ඔවුන් සෑහීමකට පත්ව සිටිති. එබැවින්, මූල්‍ය ප්‍රකාශය එම පදනම මත පිළියෙල කරන ලදී.

සී/ස ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2020/2021

## තිරසාරත්ව වාර්තාව

ශ්‍රී ලංකාවේ ජාතික නාවික ප්‍රවාහකයා වන, ලංකා නැව් සංස්ථාව, අවුරුදු 50 වැඩි නව දිගු ගමන තුල, පාරිසරික, සාමාජීය , පාලන යනාදිය සම්බන්ධයෙන් වන කාරණාවන්හි දී නොයෙක් පියවර තුල සංවර්ධනාත්මකව පැවතෙමින් පුළුල් පරාසයක් කරා විහිද ගියේය. 2015 වර්ෂයේදී රටවල් 193 ක් විසින් තිරසාර සංවර්ධනය උදෙසා 2030 න්‍යාය පත්‍රය සහ ඊට වූ තිරසාර සංවර්ධන ඉලක්ක 17 යෝජනා සම්මත කරගන්නා ලදී. එකී සංවර්ධන ඉලක්ක මගින් වත්මන් සහ අනාගත පරම්පරාවන් සඳහා වඩාත් යහපත් මෙන්ම සාධාරණ ලෝකයක් වෙත පරිවර්තනය වීමට අවශ්‍ය සැලැස්මක් සපයා ඇත. මෙකී තිරසාර අරමුණු හරහා එහිවූ ඉලක්ක මගින් දරිද්‍රතාවය සහ කුසගින්න සමනය කිරීම , සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපනය, යුක්තිය හා රැකියා අවස්ථා ලබා ගැනීමට ඇති ප්‍රවේශයන් පුළුල් කිරීම අපේක්ෂා කරන අතර පාරිසරික හානි වලින් අපේ ලෝකය ආරක්ෂා කිරීමද වේ. අපගේ ප්‍රධාන කාර්ය වන වියලි තොග ප්‍රවාහණයට ඇතුලත් වන දෑ නම් ලෝක ප්‍රජාවට අවශ්‍ය ආහාර බලශක්තිය මෙන්ම ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රවාහණය කිරීමය. අප සතු නැව් දෙක එනම් Ceylon Breeze සහ Ceylon Princess යන වියලි තොග ප්‍රවාහණ යාත්‍රාවන් ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කරන්නේ තිරසාරත්ව රාමුව තුල දක්වා ඇති පාරිසරික තිරසාරත්වය සමාජීය තිරසාරත්වය සහ ආර්ථික තිරසාරත්වය පිළිබඳවය.

## පාරිසරික තිරසාරත්වය

සාගරීය ප්‍රවාහණය ආශ්‍රිත පාරිසරික අවදානම් වශයෙන් විෂ රසායනික හා විෂ සහිත දෑ පරිසරයට මුදා හැරීම දැක්විය හැකිය. නාවික කර්මාන්තය වූ කලී බොහෝ ජාත්‍යන්තර සම්මුති, වරාය රාජ්‍ය හා ධජ රාජ්‍ය ( Port State and Flag State ) නියමතාවලට අනුව යාත්‍රා මෙහෙයුම් නියාමනය වන එකකි. නිදසුනක් වශයෙන් ගතහොත්, එක්සත් ජනපදයේ මුහුදු සීමාව තුල අපගේ නැව් ක්‍රියාත්මක වනවිට Oil Pollution Act of 1990, The Comprehensive Environmental Response, Compensation Liability Act and the International Convention for the Control and Management of Ships' Ballast Water and Sediments යනාදී සියලු අනතුරුදායක මුදාහැරීම් සහ එවැනි විය හැකි බැහැර ගලායාම් වලට අදාළ රෙගුලාසිවලට යටත්විය යුතුය. ජාත්‍යන්තර හා දේශීය මට්ටමින් අපේ යාත්‍රා ගමනාගමනය කෙරෙන මුහුදුවල සහ අපේ නැව් ළඟාවන ලොවපුරා පිහිටි වරායන් මීට සමාන නීතිරීති පද්ධති ඇත. අපගේ නාවික යාත්‍රා සමූහයෙන් 2020-21 කාලය තුල මෙවැනි අනතුරුදායක බැහැර ගලායාම් ( Spills) සිදුවී නොමැත. International Convention for the Prevention of Pollution from Ships ( Marpol Convention ) සම්මුතියේ VI ඇමුණුමේ අවධාරණය කරනු ලැබූ ඇති පරිදි 2005 සිට නැව් වලින් නිකුත්වන සල්ෆර් අඩංගු ගෑස් ( SOX ) අඩුකිරීම සඳහා නීති රෙගුලාසි ජාත්‍යන්තර නාවික සංවිධානය (IMO) විසින් ක්‍රමක්‍රමයෙන් දැඩිකොට ඇත. 2020 ජනවාරි 01 දින සිට, විමෝචන පාලන ප්‍රදේශවලින් බැහැර කලාපවල මෙහෙයුම් කටයුතුවල නිරත නැව් මගින් භාවිතා කරන ඉන්ධනවල (fuel oil) ගෙන්දගම් සංයුතියේ සීමාව 3.50% සිට 0.50% දක්වා අඩුකරන ලදී. නැව්වලින් මුදා හැරෙන ගෙන්දගම් අඩංගු ගෑස් සම්බන්ධයෙන් ක්ෂණිකව ක්‍රියාත්මක කරන ලද අඩුකිරීම් තුලින්, වෙසෙසින්ම මුහුදුබඩ ජනගහනය සහ වරායන් අසල ජීවත්වන ජනතාවට කැපී පෙනෙන සෞඛ්‍ය හා පාරිසරික ප්‍රතිලාභ අත්විඳීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නාවික ඉන්ධනවල අඩංගු විය යුතු ගෙන්දගම් සීමාව 2020 දි හඳුන්වා දීමත් සමඟ ඉතා අඩු ගෙන්දගම් සංයුතියක් (0.5%) ඇති නාවික ඉන්ධනවලට අපගේ නාවික යාත්‍රා දෙකම සාර්ථක අයුරින් පරිවර්තනය විය. ජාත්‍යන්තර නාවික සංවිධානය විසින් පෙන්වා දි ඇති පරිදි හානිදායක SOX විමෝචන මට්ටම් අඩු කිරීමේ ඉලක්ක සපුරා ගැනිමට එයින් සහාය ලැබේ. එකී හානිදායක NOX විමෝචන මට්ටම් අඩුකර ගැනිම සඳහා අපගේ නැව් ගොඩනඟා ඇත්තේ අති නවීන (Control Algorithms) අනිවාර්යයෙන්ම සවිකර ඇති ඉලෙක්ට්‍රොනික් පාලක පද්ධතියකින් ක්‍රියාත්මක වන ප්‍රධාන එන්ජින් සහිතවය.

විශාල බඩු නැව් මුහුදු ගමන්වල යෙදෙන විට ඒවායේ චලනය අඩුකර ගැනීමට සහ බර පාලනය කර ගැනීමට Ballast Water යොදා ගැනේ. නැවේ ආරක්ෂාව සඳහා එය අත්‍යාවශ්‍ය වුවද නැවෙන් බැහැර කෙරෙන Ballast ජලය තුල සිටින ආක්‍රමණික සත්ත්ව විශේෂ සාගරික පරිසරයට එකතු විය හැකිය. අපගේ නැව් දෙක සඳහා එකී ජලය සුදුසු පරිදි බැහැර කිරීමේ පද්ධතියක් සවිකොට තිබෙන අතර අන්තර් ජාතික පාලන ප්‍රමිති අනුව පනවා ඇති රෙගුලාසිවලට අනුව මෙහෙයුම් කටයුතු වල නිරත වේ. නැවකින් මාරු කල අපජලය හෝ විෂහරණය කල අපජලය අනුමත ක්‍රම පද්ධතියක් යොදාගනිමින් බැහැර කලයුතු වන්නේ වඩාත් ආසන්න ගොඩබිමේ සිට නාවික සැතපුම් 03 ක නොඅඩු දුරක සිටය. වඩාත් ආසන්න ගොඩබිමේ සිට නාවික සැතපුම් 4 ට නොඅඩු වේගයකින් ගමන්කරන නෞකාවකින් බැහැර කෙරෙන අපද්‍රව්‍ය පරිපාලන අධිකාරිය විසින් අනුමත කරනු ලැබිය යුතුවේ. සංස්ථාව සතු නැව් දෙකෙහිම අපජලය සුදුසු අයුරින් බැහැර කිරිම සඳහා යන්ත්‍රසූත්‍ර සවිකොට ඇති අතර උපරිම වැඩකිරීමේ ධාරිතාවකින් නඩත්තු කරනු ලබමින් තිබෙන අතර නිශ්පාදකයාගේ උපදෙස් වලට, මාර්ගෝපදේශයන්ට අනුගතව ක්‍රියාත්මක වේ. මැෂින් කාමරවල එකතුවන මඩ මිශ්‍රිත කළුතෙල් වෙරළේදී බැහැර කිරීමේදී පරිසරයට බලපෑමක් නොවන පරිදි අවම මට්ටමකින් සිදු කෙරේ. ඒවා පසුව පිරිපහදු කොට කාර්මික බොයිලේරු සඳහා නැවත භාවිතා කෙරේ. කර්මාන්තශාලා වලින් හෝ වෙනත් මානව ක්‍රියාකාරකම් වලින් ඇතිවන වායුමය බ්‍රෝමයින් හෝ ක්ලෝරීන් අඩංගු සංයෝග නිසා ඉහල වායු ගෝලයේ පවතින ඕසොන් ස්ථරය ක්‍රම ක්‍රමයෙන් තුනීවීම හේතුවෙන් ඕසෝන් ස්ථරය හැකිලේ එබැවින් ඕසෝන් ස්ථරය හැකිලීමේ අඩු සම්භාවිතාවක් ඇති ශීතකාරක වායු අපගේ නැව් තුල භාවිතා කෙරේ.

<u>සමාජීය තිරසාරත්වය</u>

රුදුරු වසංගතයකට සමස්ත ලෝකයම නතුවූ අවස්ථාවක අපගේ සියලු සේවක සේවිකාවන් වෙනුවෙන් වඩාත් සුරක්ෂිත සේවා ස්ථානයක් පවත්වා ගැනීමට වෙහෙස දරන ලද්දේ සැමට පළමුව ආරක්ෂාව අතිශයින් වැදගත් වූ බැවිනි. පළමුව හැකි තරම් දුරට අපගේ සේවා ස්ථානයට වෛරසය ඇතුළුවීම වලක්වා ගැනීමට කළ හැකි සියල්ල සිදු කිරීමට සිදු වූ අතර දෙවැන්න නැව් තුල මෙන්ම වැඩකරන පරිසරය තුල එය පැතිරීම වලක්වා ගැනීමය.

2020 කොවිඩ් 19 වසංගතය නිසා පැනවූ සීමාකාරක නිසා කොටස්ධාරීන් මුහුණට මුහුණලා සම්බන්ධවීමට බාධා ඇතිවූ හෙයින් බොහෝ කර්මාන්තායතන රජයන් හා නියාමකයන්, ප්‍රජා නියෝජිතයන් හා සිවිල් සමාජය සමඟ අපි සම්බන්ධ වී ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් අනුමත 2006 සාගර කම්කරු ප්‍රඥප්තියට අනුව අප කටයුතු කළෙහ. නැව්වල සේවයේ නිරත නැවියන්ගේ වැඩකිරීමේ සේවා නියුක්ති කොන්දේසි නැව්තුල වැඩෙහි නිරතවනවිට ලබාදියයුතු පහසුකම්, සෞඛ්‍ය හා ශුභසාධනය රැකීම සඳහා වූ අවම නියමයන් මෙම සම්මුතිය මඟින් අවධාරණය කොට ඇත. ජාත්‍යන්තර වෙළඳ කටයුතුවල නිරත ටොන් 500 ට වැඩි ( Gross Ton ) සියලු නැව් විසින් Maritime Labour Certificate සහ Declaration of Maritime Labour Complaince ලබා දීමට නියම කරනු ලැබ තිබේ.

අපගේ සියලු නාවික යාත්‍රා මෙන්ම ඒවායේ සේවක පිරිසද එකී නියමතාවලට අනුකූලව කටයුතු කරන අතර ඒ අනුව ඒවා පවත්වා ගැනීමට අපේක්ෂා කරමු.

ආරක්ෂාකාරී වැඩකරන පරිසරයක් සලසා දෙමින් අපගේ සේවක පිරිසේ යහපත මෙන්ම නාවික යාත්‍රාවල ආරක්ෂාව සඳහා අවැසි ක්‍රියාමාර්ග ගැනීම නොකඩවා පවත්වා ගැනීමට අප නිරතුරුවම ප්‍රයත්න දරමින් සිටිමු. අපගේ මෙහෙයුම් කටයුතුවලදී සිදුවන අනතුරු අවම කරගැනීම පිණිස ධජලත් රාජ්‍යවල නෞකාවන් මෙහෙයවීමේ නියමතාද (Flag States Safe Manning Requirements) ඉක්මවා අවශ්‍ය පමණට වඩා කාර්යමණ්ඩල ඒ සඳහා යොදවා ඇත. සැමවිටම අපගේ ඉලක්ක වූ කලී අපගේ කටයුතු ආරක්ෂාකාරීව මෙහෙයවීම වන අතර අපගේ ජනතාව හා බලපෑමට ගොදුරු වූ කොටස්කරුවන් ආරක්ෂා කිරීමය. අපගේ නාවික ඇණියේ ආරක්ෂාවට අඛණ්ඩව වැඩි දියුණු කිරීම සඳහා අදාළ අංශ සියල්ල පිළිබඳව ප්‍රශස්ත වශයෙන් විශ්ලේෂණයක් කල හැක්කේ වැඩිදියුණු කල දත්තවල නිරවද්‍යතාවය මත වන හෙයින් වැලකී ගිය සියලු අනතුරු පිළිබඳව අවධාරණය කිරීම නොකඩවා සිදු කරන ලදී.

යම්කිසි වැදගත් කාර්යයක් ආරම්භ කිරීමට සැලසුම් කිරීමට පෙර විධිමත් අවදානම් තක්සේරුවක් කිරීම හරහා එකී කාර්ය සිදුකිරීමෙන් ආරක්ෂාවට, පරිසරයට, සමාජයීය වශයෙන් හා ව්‍යාපාරික වශයෙන් ඇතිවන බලපෑම සොයා බැලේ.

සියලු පියවර ගනු ලබන්නේ අවදානම් තත්ත්වයන් සමනය කිරීම සඳහා වන අතර ගනු ලබන අතිරේක පියවර ක්‍රියාත්මක කිරීම, සමායෝජනය කිරීම හා ඒවාට සහාය සැලසීම කරනු ලබන්නේ ලංකා නැව් සංස්ථා මෙතෙර කණ්ඩායම ( Shore Team ) විසිනි.

අපගේ සමාජ වගකීම් ක්‍රියා රාමුව තුලින් අදාළ සියලු නීතිරීති හා රෙගුලාසි ආවරණය කෙරෙන අතර රජයේ නීතිරීති හා රෙගුලාසි වලට අනුව සේවකයින් ව්‍යාපාර ආචාර ධර්ම සංග්‍රහය පිළිපැදීමට බැඳී සිටිති. මානව හිමිකම් උල්ලංඝනය කිරීම, හානි අනතුරු සඳහා ප්‍රතිකර්ම සෙවීම මෙන්ම ක්‍රියාත්මක වීමේදී සමාජමය ව්‍යාතිමයක් උපයා ගැනීමට හා පවත්වා ගැනීමට අපි සැමවිටම ක්‍රියා කරමු.

තිරසාරත්වය ක්‍රියාරාමුවේ කොටසක් වශයෙන්, ඒකාග්‍රතාවය සමාන අවස්ථා සහ එකිනෙකාට අන්‍යෝන්‍ය වශයෙන් ගරුකිරීම ප්‍රවර්ධනය කෙරෙන වැඩ බලන පරිසරයක් තුල පශස්ත තැනැත්තන් ආකර්ශනය කර ගනිමින්, සංවර්ධනය කරමින් කටයුතු කිරීමට අපට හැකියාව ලැබුණි. වර්තමානයේ ඇති නවීන තාක්ෂණික වශයෙන් දියුණු නාවික යාත්‍රා මෙහෙයවීමේ තීරණාත්මක සාධක වලින් එකක් නම් නැවියන්ය. එබැවින්, ලංකා නැව් සංස්ථාව එකී මානව ප්‍රාග්ධනයෙන් වටිනාකම මැනවින් හඳුනා ගනිමින් කටයුතු කරන අතර නාවික යාත්‍රාවන් තුල මෙන්ම වෙරළාශ්‍රිතව හා නැව් තුල විශේෂිත කටයුතු සඳහා නිවැරදි කාර්යමණ්ඩලයක් යොදා ගැනීමට සියලු ප්‍රයත්න දරා ඇත.

## ආර්ථික තිරසාරත්වය

දූෂණ ක්‍රියාවන්ට එරෙහිව පනවනු ලබන දඩ හා අසාධු ලේඛන ගත කිරීම් හේතුකොටගෙන සමාගම් වල කීර්තියට, නෛතික හා මූල්‍ය පසුබිමට හානි පැමිණෙනු පමණක් නොව එහි අයහපත ප්‍රතිඵල වල බලපෑම ආයෝජකයන් හා ව්‍යාපාරික හවුල්කරුවන් දක්වා පැතිරේ. එයින් ආර්ථික කාර්යක්ෂමතාවයට හානි සිදුවන අතර සහයෝගයෙන් කටයුතු කරන සමාගම් වලට අනර්ථයක් සිදුකොට කොටස්ධාරිත්වය අගයට පාඩු ඇති වේ. දූෂණ ක්‍රියා සෙසු අවදානම් වලට ද මග පාදයි. ඒවා නම් මානව හිමිකම් කඩකිරීම් හා පාරිසරික අවදානම්ය. ලංකා නැව් සංස්ථාව වශයෙන් අපි රජයේ නීතිරීති හා රෙගුලාසි මෙන්ම මාර්ගෝපදේශ වලට අනුකූලව, ව්‍යාපාරික කටයුතු කරගෙන යමින් සිටින අතර අපගේ ක්‍රියාදාමයන්, අභ්‍යන්තර විගණක සහ ඉක්බිතිව රජයේ විගණකයින් විසින් විගණනයට බඳුන් කෙරේ. ඊට අමතරව අපගේ පාලන ක්‍රියාරාමුවට පුළුල් පරාසයකින් යුත් ආයතනික පරිචයන් සහ සමාගමේ ප්‍රතිපත්ති, ප්‍රමිති, විගණක කටයුතු හා අනුකූලතා යන විෂයන් ඇතුලත්ය.

සාගරීය වෙළඳාම නව ගෝලීය ආර්ථිකයේ ජීව රුධිරය වී තිබෙන අතර ශ්‍රී ලංකාව නැගෙනහිර බටහිර වෙළඳ මාවතට ඉතා සමීපව පිහිටි හෙයින්, එකී භූගෝලීය පිහිටීම නිසා ඉමහත් ප්‍රතිලාභ අත්කරගෙන තිබේ. ඒවා සාක්ෂාත් කරගැනීම සඳහා අවැසි ප්‍රධාන විකල්ප වලින් එකක් නම්, ලෝකයේ නාවික ක්ෂේත්‍රය තුල, නාවික වෘත්තිකයන් සඳහා අඛණ්ඩ ඉල්ලුමක් පවතින හෙයින් වඩ වඩාත් නැවියන් පුහුණු කිරීමය.

අපගේ නාවික යාත්‍රා ඉදිකොට ඇත්තේ වෙළඳාම හා පුහුණුව යන සංකල්පය යටතේ වන අතර එක් එක් නැවේ පුහුණු මැදිරි 26 ක් බැගින් තනා ඇත. කොවිඩ් 19 වසංගතය පැවති කාලයේදී පවා අපගේ නැව් දෙක පුරා දේශීය ඉංජිනේරු හා කැඩෙට් නිලධාරීන් පුහුණු කටයුතු සිදු කෙරිණි.

අපගේ කටයුතු වලින් ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභ උත්පාදනය කෙරෙනු පමණක් නොව දේශීය ප්‍රජාවන් හා ජාතික ආර්ථිකයන් උත්තේජනය කරනු ලබයි. රැකියා බිහිකිරීම, නිපුණතා සංවර්ධනය, යටිතල පහසුකම් ගොඩනැඟීම, දේශීය සැපයුම්කරුවන්ගෙන් මිල දී ගැනීම ආදී අප විසින් කරනු ලැබේ. ජාතික නාවික ප්‍රවාහකයා වශයෙන් බොහෝ දේශීය විකුණුම්කරුවන්ට අප වෙත ලියාපදිංචි වීම සඳහා දොරටු විවෘත කොට ඇති අතර එකී සැමදෙනාටම, රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි දැඩි ලෙස අනුගමනය කරමින් සමාන ඉඩ ප්‍රස්තා ලබා දී තිබේ. රජයේ ආයතනයක් වුවද, ප්‍රමාදයකින් තොරව සියලු ගෙවීම් සිදුකිරීම සඳහා විධිවිධාන සලසා තිබෙන අතර එමගින් දේශීය හා ජාත්‍යන්තර විකුණුම්කරුවන්ගේ විශ්වාසය, ලංකා නැව් සංස්ථා ඉතිහාසය තුල, ජාතික නාවික ප්‍රවාහකයා වශයෙන් පනස් වසරක් පුරා කීර්තිය රැකගැනීමට අපට හැකිව ඇත.

# විගණන කමිටු වාර්තාව

## විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුව ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන අතර එය සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. විගණන වර්ෂය තුල මෙකී විගණන කමිටුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

| | |
|---|---|
| ඩී.එච්.එස්. පුල්ලපෙරුම මහත්මිය | - සභාපති |
| වෛද්‍ය අයි.ඩී.එම්. රත්නායක මහතා | - සාමාජික - 08.10.2020 දක්වා |
| වෛද්‍ය ජී.ඒ.ජේ.එස්. බණ්ඩාර මහතා | - සාමාජික - 08.10.2020 දක්වා |
| ෂෙහාරා ද සිල්වා මහත්මිය | - සාමාජික - 07.10.2020 සිට |
| බී.ඒ. උඩුමලගල මහතා | - සාමාජික - 08.10.2020 සිට |

## විගණන කමිටුවේ කාර්යභාරය

සමාගමේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් සියලු කරුණු විභාග කිරීමේ බලය විගණන කමිටුවට පැවරී ඇති අතර තම රාජකාරී ඉටුකිරීමේදී කාර්යක්ෂම අයුරින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය දේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/LKAS) ප්‍රකාරව මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කිරීම් සිදුකර ඇත්දැයි යන්න පමණක් නොව මූල්‍ය වාර්තාකරණය පිළිබඳ නියාමතා 2007 අංක 07 සමාගම් පනත හා සෙසු මූල්‍ය වාර්තාකරණය පිළිබඳ රෙගුලාසිවලට හා නියමතාවන්ට අනුව සපුරා ඇත්දැයි යන්න විගණන කමිටුව පරීක්ෂා කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට පෙර විගණන කමිටුව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කොට නිර්දේශ කරන ලදී. සමාගම් කටයුතුවල තත්ත්වය සහ ඊට අදාළ කාලසීමාව තුල අත්කරගත් ප්‍රතිඵල තුලින් එය නිවැරදිව පිලිබිඹු වන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාගනු පිණිස විගණන කමිටුව විසින් සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටිවල ප්‍රමාණවත්බව සහ විධිමත්ව හා අඛණ්ඩව ක්‍රියාත්මක වීම පිළිබඳව ද සමාලෝචනය කරන ලදී. අවශ්‍ය විටදී ස්වාධීන විගණනය සිදු කරන ලදී. සංස්ථාව තුල අභ්‍යන්තර පාලන වාතාවරණය තවදුරටත් ශක්තිමත් කිරීමේ අදහස ඇතිව අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කොට කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කරනු ලැබේ. තවද විගණන කමිටුව විසින් සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික හා පාලන අවදානම් පිළිබඳව ද තක්සේරුවක් කරන ලදී.

රැස්වීම්

2020/21 වර්ෂය තුලදී විගණන කමිටු රැස්වීම් 4 ක් පවත්වන ලදී. ඊට සහභාගී වූ අධ්‍යක්ෂවරුන්/ සාමාජිකයන් පහත පරිදි වේ.

ඩී.එච්.එස්. පුල්ලෙපෙරුම මහත්මිය (4/4)

වෛද්‍ය අයි.ඩී.එම්. රත්නායක මහතා (2/4)

වෛද්‍ය ජී.ඒ.ජේ.එස්. බණ්ඩාර මහතා (2/4)

ෂෙහාරා ද සිල්වා මහත්මිය (1/4)

බී.ඒ. උඩුමලගල මහතා (2/4)

එම්.ඩී.පී. තිලකසිරි මහතා (ආරාධනයෙන්) (4/4)

රැස්වීමකට පැමිණීමට අපහසු නම් ඊට අවසරයක් ඉල්ලීම හා න්‍යාය පත්‍රයේ අඩංගු කරුණු පිළිබඳව පූර්වගාමීව කමිටුවේ සභාපති සමඟ සාකච්ඡා කිරීමට හැකියාවක් අධ්‍යක්ෂවරුන්ට ඇත. නොපැමිණි සාමාජිකයන් රැස්වීමේ දිනට කලින් අවසර ඉල්ලා ඇත.

ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයෙකු රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී, සාමාන්‍යාධිකාරී, සහකාර සාමාන්‍යාධිකාරී, සහ අංශ ප්‍රධානීන්ද විගණන කමිටුවේ ආරාධනය පරිදි රැස්වීම්වලට සහභාගී වූහ. අභ්‍යන්තර විගණක කමිටුවේ කැඳවුම්කරු වශයෙන් කටයුතු කරයි.

සමාලෝචන

අදාළ වර්ෂය සඳහා පහත දැක්වෙන කරුණු විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.

1. **වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.**

(2016/17, 2017/18, 2018/19, 2019/20)

නිර්දේශය

සාධාරණ කාලයක් තුල ප්‍රමාදිත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නිර්දේශ කරන ලද ඒ සම්බන්ධයෙන් නිකුත් කොට ඇති චක්‍රලේඛ අනුව කටයුතු කරන ලෙසටද නිර්දේශ කෙරිනි.

2. **ක්‍රියාකාරී සැලැස්ම**

නිර්දේශය

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අනුව කටයුතු කරන ලෙසට නිර්දේශ කරන ලදී.

3. විගණන විමසුම් අංක POS/B/CSC/:19/68 සහ POS/B/CSCL/19/AQ - 82

නිර්දේශය

විගණන විමසුම් සමාලෝචනය කිරීම පිණිස විගණන කමිටුවට ඉදිරිපත් කල යුතු බවටද, දී ඇති කාලසීමාව ඇතුලත විගණන විමසුම් නිරවුල් කරන ලෙසට ද නිර්දේශ කරන ලදී.

4. අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම - හිමිකම් නොපෑ වාහන රක්ෂණ

නිර්දේශය

අදාල කාලසීමා ඇතුලත වාහන අනතුරු වලින් සිදුවන හානි සඳහා හිමිකම්පෑම් සිදුකල යුතු බවටද, එසේ නොකරන අවස්ථාවන්හිදී එකී අලාභයන් මුදල් රෙගුලාසි ප්‍රකාරව, ඒවාට වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට ද නිර්දේශ කරන ලදී.

5. අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම - ලංකා නැව් සංස්ථාවේ ෆයිල් කවර මුද්‍රණය කිරීම.

නිර්දේශය

දැනට පවත්නා ටෙන්ඩර් පටිපාටිය අනුව සිදුකිරීමට නිර්දේශ කරන ලදී.

6. අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය - භාවිතයට නොගැලපෙන භාණ්ඩ ලිපිද්‍රව්‍ය ගබඩාවෙන්, සුදුස්සක් කොට බැහැර කිරීම.

නිර්දේශය

ඉහත කරුණ සඳහා කමිටුවක් පත්කොට අදාළ භාණ්ඩ සුදුස්සක්කොට බැහැර කිරීමට නිර්දේශ කරන ලදී.

7. විදේශ ව්‍යවහාර මුදලින් කෙරෙන ගෙවීම්

නිර්දේශය

විදේශ ව්‍යවහාර මුදල්වලින් කෙරෙන සියලු ගෙවීම් සඳහා මහබැංකුවෙන් නියමකොට ඇති අනුපාත අදාළ කරගන්නා ලෙසට නිර්දේශ කරන ලදී.

**8. පරිගණකමය ගිණුම් සන්විහිතිය ( Package )**

නිර්දේශය

අධ්‍යක්ෂ මණ්ඩලයට මේ පිළිබඳව ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කරන ලදී.

**9. විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුවේ (DMA/ AMC/ M/ 2020/ 5 – 4) ලිපිය**

නිර්දේශය

විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ලිපිය අනුව කටයුතු කරන ලෙසට කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

**10. පුරප්පාඩු වී ඇති තනතුරු**

නිර්දේශය

ඊළඟ විගණන කමිටු රැස්වීමට පෙරාතුව සියලු පුරප්පාඩු පිරවිය යුතු බවට නිර්දේශ කරන ලදී.

**11. වට්ටෝරුගත භාණ්ඩ පිළිබඳ වාර්තාව**

නිර්දේශය

සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කොට මේ පිළිබඳව සමාලෝචනය කිරීමෙන් අනතුරුව ඔවුන්ගේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන ලෙසට දැන්වීම.

**12. විගණන අධිකාරී විසින් යෝජනා කරන ලද විශේෂ විගණනය**

නිර්දේශය

වාර්තාව සම්පූර්ණ කිරීම සඳහා රජයේ විගණන අංශයට සහය දෙන ලෙසට නිර්දේශ කරන ලදී.

**13. අතිප්‍රමාදිත අත්තිකාරම්/ ලැබීම් නියමිත**

නිර්දේශය

ගෙවීමට ඇති හිඟමුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසට කමිටුව නිර්දේශ කළේය. අයවීමට ඇති මුදල් පොතෙන් කපා හැරීමට විගණන කමිටුවට අධිකාරී බලයක් නොමැති බව සිහිපත් කෙරිනි.

**14. සහවත් බව පිළිබඳ පරීක්ෂාව ( Solvency Test )**

නිර්දේශය

ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලෙසටද අධ්‍යක්ෂ මණ්ඩලයට සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසටත් නිර්දේශ කරන ලදී.

## 15. අභ්‍යන්තර විගණන සැලැස්ම 2020/21

<u>නිර්දේශය</u>

ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙසට හා අධි අවදානම් ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමුකරන ලෙස නිර්දේශ කෙරිණි.

## 16. අභ්‍යන්තර පාලන පද්ධතිය

<u>නිර්දේශය</u>

ලංකා නැව් සංස්ථාවේ අභ්‍යන්තර පාලන පද්ධතීන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කරන ලදී.

## 17. සමාගම සතු නාවික යාත්‍රා සඳහා සැපයුම්

<u>නිර්දේශය</u>

ගෙවීම් වවුචරයට අමුණා ඇති GRN සටහනට යටත්ව සැපයුම්කරුගේ ඉන්වොයිස් නිරවුල් කිරීමට නිර්දේශ කරන ලදී.

## 18. හිමිකම් නොපෑ ( Not Claimed ) බහාලුම් තැන්පතු

<u>නිර්දේශය</u>

ඒවාට අදාළ කාලසීමා සහිතව සවිස්තරාත්මක වාර්තාවක් කමිටුවට/අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙසට නිර්දේශ කරන ලදී.

**නිගමනය**

විගණන කමිටු වාර්තාව හා සෙසු වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය පිණිස සහ අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරනු ලැබේ. තවද රැස්වීම් වාර්තාවල පිටපත් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරනු ලැබේ.



කමිටුව වෙනුවෙන්,

ඩී.එච්.එස්. පුල්ලපෙරුම මහත්මිය

සභාපති - විගණන කමිටුව

**සී./ස. ලංකා නැව් සංස්ථාව**

**වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය**

**2020 /2021**

*<u>තුති ප්‍රණාමය</u>*

*වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා, විසින් ලංකා නැව් සංස්ථාවට නොකඩවා පළකරන ලද උපරිම සහයෝගය සහ උපදෙස් වෙනුවෙන් අපගේ ප්‍රණාමය හිමි වේ.*

*සංස්ථාවේ අභිමතාර්ථයන් මුදුන්පත් කරගැනීමෙහිලා වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ නිලධාරී මහත්ම මහත්මීන් විසින් දෙන ලද සහයෝගය වෙනුවෙන් වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයට ස්වකීය ස්තුතිය පළ කරයි.*

*එමෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා රේගුව සහ විදේශ නියෝජිතයන් විසින් සංස්ථාව වෙත සැමවිට පළ කරන ලද සහයෝගය සහ සුහදශීලී බව වෙනුවෙන්ද සංස්ථාව තම කෘතවේදීතාව පළ කරයි.*

*සංස්ථාවේ සේවා ගණුදෙනුකරුවන් හා ඔවුන්ගෙන් ලද සහයෝගය වෙනුවෙන් සංස්ථාව ස්තුති පූර්වක ප්‍රණාමය පළකරමි.*

*කාර්ය මණ්ඩලයට ස්තුතිය*

*සුහදශීලී සහ සහයෝගශීලී භාවයෙන් යුතුව, සමාලෝචිත වර්ෂය තුළ දී කළමනාකාරීත්වය/ සේවක මහත්ම මහත්මීන් අතර නිරන්තර සම්බන්ධතාවක් පැවතුණි.*
*කළමනාකාරීත්වය සමඟ කටයුතු කිරීමේදී වෘත්තිය සංගම් ඉතා වගකීමෙන් හා ප්‍රතිචාරාත්මකව කටයුතු කළ බව කිවමනාය.*
*අවසාන වශයෙන් එතෙර මෙතෙර සියලු සේවක මහත්ම මහත්මීන් විසින් විශේෂයෙන්ම නාවික ක්ෂේත්‍රය මුහුණ දෙමින් සිටින දුෂ්කරතා අබියස ආයතනය වෙනුවෙන් සේවය ඉටු කිරීමේදී හෘදයාංගමව දක්වන ලද පක්ෂපාතී බව හා කැපවීම අගය කළ යුතුය.*

මගේ අංකය
எனது இல.
My No. PAS/B/CSCL/01/20-21/02

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 21 September 2022

Chairman

Ceylon Shipping Corporation Limited

**Report of the Auditor General on the Financial Statements and Other Legal and Regulatory Requirements of the Ceylon Shipping Corporation Limited for the year ended 31 March 2021 in terms of Section 12 of the National Audit Act, No. 19 of 2018.**

---

## 1. Financial Statements

### 1.1. Qualified Opinion

The audit of the financial statements of the Ceylon Shipping Corporation Limited ("Company") for the year ended 31 March 2021 comprising the statement of financial position as at 31 March 2021 and the statement of comprehensive income, statement of changes in equity and cash flow statement for the year then ended, and notes to the financial statements, including a summary of significant accounting policies, was carried out under my direction in pursuance of provisions in Article 154(1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka read in conjunction with provisions of the National Audit Act No. 19 of 2018. My report to Parliament in pursuance of provisions in Article 154 (6) of the Constitution will be tabled in due course.

In my opinion, except for the effects of the matters described in the basis for Qualified Opinion section of my report, the accompanying financial statements give a true and fair view of the financial position of the Company as at 31 March 2021, and of its financial performance and its cash flows for the year then ended in accordance with Sri Lanka Accounting Standards.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

## 1.2. Basis for Qualified Opinion

(a) As per the financial statements, loss for the year under review was Rs. 813,320,485 and the cumulative loss as at 31 March 2021 was Rs. 3,419,789,062. Further, net assets/equity of the company as at 31 March 2021 was a negative value of Rs. 2,041,613,494 and it was observed that these were the clear indication of material uncertainties that indicates the going concern uncertainties of the company. The main reason for the loss for the year under review was exchange loss amounting to Rs. 684,460,190 arising from converting USD loan balance to rupee value as at 31st March 2021. To overcome this situation the company had proposed some mitigating measures in the EGM on 3rd July 2021. Even though, in this meeting management was given the consent to convert the USD loan to LKR loan and rescheduling the loan with favorable terms and condition including reduce the interest rate from 7.88 percent to 2 – 4 percent as the ship building industry normal practice. However consent had not been granted by the Central Bank and loan could not convert to LKR. Loan had rescheduled by the bank by increasing the repayment period from 15 year to 20 years. But the interest rate had not reduced as expected up to 2 - 4 percent and only 0.25 percent from 5.25 percent +6 month LIBO had been deducted. Therefore, the main loss mitigating factor based on cash flows generating before and after converting the loan from USD to LKR as per the board resolution No: 259/2021/151 had not been succeeded even by 2 June 2022.

Further, refinancing process of loan as per the cabinet decision on 17 November 2020 company searched for new lender through calling Request for Proposals (RFP), based on the submitted one proposal and technical committee directed the management to clarify the tender in High commission of Sri Lanka – London, Central bank and Attorney Generals Department. However the process had not been completed even by 02 June 2022. Other proposals for diversification the business as a business strategies in achieving long-term growth as promoting Sri Lanka flag registry, operating a floating bunker storage, building a boat for the transportation of passenger and cargo at Norachcholai, operating a feeder service between Colombo and Bangladesh in coordination with Bangladesh shipping corporation and hiring a tanker Vessel in time

or bareboat charter basis to enter for the sea transportation of crude oil, have not been implemented.

(b) As per paragraph 51 of the Sri Lanka Accounting Standard (LKAS ) 16 on "Property, Plant and Equipment" the residual value and the useful life of an asset shall be reviewed at least at each financial year end and if expectation differ from previous estimate, the change(s) shall be accounted for as a change in an accounting estimate in accordance with LKAS 8 Accounting Policies, Changes in Accounting Estimate and Errors. Contrary to that it was observed that the company is using fully depreciated assets at a cost of Rs. 34,479,817 as at 31 March 2021. However action had not been taken to revalue the assets and make necessary adjustments as required.

(c) As per paragraph 6 of the LKAS 7 – Statement of Cash Flows, definition for cash comprises cash on hand and demand deposits. And as per the accounting policy of the company, Cash and cash equivalents include cash in hand, demand deposits and other short-term highly liquid investments with original maturities of three months or less. Contrary to that cash float (cash imprest) that the company had given to Captains of two vessels for their day-to-day operations amounting to Rs. 1,003,766 had not been considered as cash and cash equivalent and had included under other receivables. Therefore, cash and cash equivalent as at 31 March 2021 in the financial position statement and cash flow has been understated by that amount.

(d) As per paragraph 35 of LKAS 01 on Presentation of Financial Statements, foreign exchange gains and losses on transaction and if they are material, Company shall presents such gains and losses separately. However, contrary to that the Company had offset Rs. 67,155,002 exchange gain earned, against the direct expenses of Rs. 2,109,976,010.

Further, as per paragraph 32 of the same standard, Company shall not offset assets against liabilities unless permitted by the standards. However, contrary to that the company had offset Rs. 888,948 debit balances against trade payables and Rs.3,402,124 debit balances against other payable. As a result, trade payables and other payable had understated and debit balances had understated by Rs. 4,291,042 as at the end of the year under review.

(e) Company had not translated the balance payable Rs. of 114,247,992 (USD 745,246) which is the deposit made by the ship building company, as a warranty of two vessels. Hence guaranty repair deposit (liability) had been understated by Rs.36,321,510. Moreover, foreign creditors (Shipping agents) aggregating to Rs. 270,987,706 which were in different foreign currencies had not been translated at closing rate prevailing at the date of financial statements.

(f) It was observed that bunker stock (Fuel Stock) account of two vessels had not been maintain accurately by the company. Therefore, accuracy of the bunker stock as at 31st March 2021 amounting to Rs.195,148,355 could not be confirmed to audit. In a sample audit test, relevant to vessel MV Ceylon Breeze, it was revealed that differences between the ledger balance of bunker stock at the chartering first term, amounting to Rs. 17,310,005 and a loss of price and quantity differences when transmitting the vessel among charters during the year under review amounting to Rs. 1,160,926 and omission of the bunker stock consumption in the month of July amounting to Rs. 43,759,166 had not been adjusted to bunker stock account and Profit & Loss account.

(g) Accuracy and existence of Debtors aggregating to Rs. 73,809,918 from 22 debtors and Trade payable aggregating to Rs. 26,750,981 from 13 creditors could not be ascertained in audit due to lack of sufficient, appropriate evidence including confirmations.

I conducted my audit in accordance with Sri Lanka Auditing Standards (SLAuSs). My responsibilities, under those standards are further described in the Auditor's Responsibilities for the Audit of the Financial Statements section of my report. I believe that the audit evidence I have obtained is sufficient and appropriate to provide a basis for my qualified opinion.

### 1.3 Other information included in the Company's 2020/21 Annual Report.

The other information comprises the information included in the Company's 2020/21 Annual Report but does not include the financial statements and my auditor's report thereon, which is expected to be made available to me after the date of this auditor's report. Management is responsible for the other information.

My opinion on the financial statements does not cover the other information and I do not express any form of assurance conclusion thereon.

In connection with my audit of the financial statements, my responsibility is to read the other information identified above when it becomes available and, in doing so, consider whether the other information is materially inconsistent with the financial statements or my knowledge obtained in the audit or otherwise appears to be materially misstated.

When I read the Company's 2020/21 Annual Report, if I conclude that there are material misstatements therein, I am required to communicate that matter to those charged with governance for correction. If further material uncorrected misstatements are existed those will be included in my report to Parliament in pursuance of provisions in Article 154 (6) of the Constitution that will be tabled in due course.

### 1.4 Responsibilities of Management and Those Charged with Governance for the Financial Statements

Management is responsible for the preparation of financial statements that give a true and fair view in accordance with Sri Lanka Accounting Standards and for such internal control as management determine is necessary to enable the preparation of financial statements that are free from material misstatement, whether due to fraud or error.

In preparing the financial statements, management is responsible for assessing the Company's ability to continue as a going concern, disclosing, as applicable, matters related to going concern and using the going concern basis of accounting unless management either intends to liquidate the Company or to cease operations, or has no realistic alternative but to do so.

Those charged with governance are responsible for overseeing the Company's financial reporting process.

As per Section 16 (1) of the National Audit Act No. 19 of 2018, the Company is required to maintain proper books and records of all its income, expenditure, assets and liabilities, to enable annual and periodic financial statements to be prepared of the Company.

## 1.5 Auditor's Responsibilities for the Audit of the Financial Statements

My objective is to obtain reasonable assurance about whether the financial statements as a whole are free from material misstatement, whether due to fraud or error, and to issue an auditor's report that includes my opinion. Reasonable assurance is a high level of assurance, but is not a guarantee that an audit conducted in accordance with Sri Lanka Auditing Standards will always detect a material misstatement when it exists. Misstatements can arise from fraud or error and are considered material if, individually or in the aggregate, they could reasonably be expected to influence the economic decisions of users taken on the basis of these financial statements.

As part of an audit in accordance with Sri Lanka Auditing Standards, I exercise professional judgment and maintain professional skepticism throughout the audit. I also:

- Identify and assess the risks of material misstatement of the financial statements, whether due to fraud or error, design and perform audit procedures responsive to those risks, and obtain audit evidence that is sufficient and appropriate to provide a basis for my opinion. The risk of not detecting a material misstatement resulting from fraud is higher than for one resulting from error, as fraud may involve collusion, forgery, intentional omissions, misrepresentations, or the override of internal control.

- Obtain an understanding of internal control relevant to the audit in order to design audit procedures that are appropriate in the circumstances, but not for the purpose of expressing an opinion on the effectiveness of the Company's internal control.

- Evaluate the appropriateness of accounting policies used and the reasonableness of accounting estimates and related disclosures made by the management.

- Conclude on the appropriateness of the management's use of the going concern basis of accounting and based on the audit evidence obtained, whether a material uncertainty exists related to events or conditions that may cast significant doubt on the Company's ability to continue as a going concern. If I conclude that a material uncertainty exists, I am required to draw attention in my auditor's report to the related disclosures in the financial statements or, if such disclosures are inadequate, to modify my opinion. My conclusions are based on the audit evidence obtained up to the date

of my auditor's report. However, future events or conditions may cause the Company to cease to continue as a going concern.

- Evaluate the overall presentation, structure and content of the financial statements, including the disclosures, and whether the financial statements represent the underlying transactions and events in a manner that achieves fair presentation.

I communicate with those charged with governance regarding, among other matters, significant audit findings, including any significant deficiencies in internal control that I identify during my audit.

## 2 Report on Other Legal and Regulatory Requirements

2.1 National Audit Act, No. 19 of 2018 and Companies Act, No. 7 of 2007 include specific provisions for following requirements.

2.1.1 Except for the effect of the matters described in the Basis for Qualified Opinion paragraph, I have obtained all the information and explanation that required for the audit and as far as appears from my examination, proper accounting records have been kept by the Company as per the requirement of section 163 (2) (d) of the Companies Act, No. 7 of 2007 and section 12 (a) of the National Audit Act, No. 19 of 2018.

2.1.2 The financial statements of the Company comply with the requirement of section 151 of the Companies Act, No. 07 of 2007.

2.1.3 The financial statements presented is consistent with the preceding year as per the requirement of section 6 (1) (d) (iii) of the National Audit Act, No. 19 of 2018.

2.1.4 The financial statements presented includes all the recommendations made by me in the previous year as per the requirement of section 6 (1) (d) (iv) of the National Audit Act, No. 19 of 2018.

2.2 Based on the procedures performed and evidence obtained which limited to matters that are material, nothing has come to my attention;

2.2.1 to state that any member of the governing body of the Company has any direct or indirect interest in any contract entered into by the Company which are out of the

normal course of business as per the requirement of section 12 (d) of the National Audit Act, No. 19 of 2018.

2.2.2 to state that the Company has not complied with any applicable written law, general and special directions issued by the governing body of the Company as per the requirement of section 12 (f) of the National Audit Act, No. 19 of 2018 except for;

| Reference to Law/Direction | Description |
|---|---|
| (a) Paragraph No.7.4.5 of the public enterprises circular No: PED 12 dated 02 June 2003 | Annual board of survey should be carried out by verification of fixed assets and inventories. Contrary to that physical verification had not been carried out as at 31 March 2021 for inventories valued Rs. 260,130,072 lying in the two vessels. |
| (b) Management Services Department Circulars No. 2017/05 dated 25 October 2017. | The professional allowance is entitled only to the officers who are not entitled to the allowance, mention in the circular. Contrary to this company paid professional allowance for 11 employees amounting to Rs. 856,638 who received Attendance allowance, Secretary allowance, vehicle allowance, attendance allowance, additional allowance and retention allowance during the year under review. Further, Company had paid same allowance aggregating to Rs.1,109,085 for 13 employees in 2019/20. |

2.2.3 to state that the Company has not performed according to its powers, functions and duties as per the requirement of section 12 (g) of the National Audit Act, No. 19 of 2018.

2.2.4 to state that the resources of the Company had not been procured and utilized economically, efficiently and effectively within the time frames and in compliance with the applicable laws as per the requirement of section 12 (h) of the National Audit Act, No. 19 of 2018.

## 3. Other Matters

(a) Total outstanding trade receivable balance as at 31 March 2021 were amounting Rs.1,829,796,029 and provision for impairment as at that date was Rs.1,010,026,050. Out of the total debtors, 59 percent amounting to Rs.1,095,930,525 had remained over one year without being recovered. Further, it was observed that 95 percent of debtors of Freight clearance, Government Container deposit and Other Debtors aggregating to Rs. 91,139,337 had remained over 03 years without being recovered.

Further, Agency commission receivable from 18 agents amounting to Rs. 3,120,768 had remained without being recovered for over 03 years and 17 agents are not in operation and their aggregate balance, as at the end of the year under review was Rs.2,004,609. It was observed that debt collection procedures are not implemented efficiently.

(b) Company had maintained two separate ledger accounts (Ledger account no: 16160 and Ledger account no 16120) for one bank account number (Bank of Ceylon 5935658) in the IFS accounting system maintained by the company.

(c) The Company is liable to pay Value Added Tax (VAT) based on the cash basis according to the Inland Revenue department direction provided on 3 September 2003 by letter No: VAT/Gen/04. Therefore, amount of Rs. 66,419,287 had been existed as VAT payable due to fail to collect the VAT from the Lanka Coal Company (Pvt) Ltd for the period of 19 November 2012 to 16 January 2018, relevant to 20 invoices. Further, Inland Revenue Department had issued clarification on 17 January 2018 under letter no: ACT 17/9 regarding the dispute between Lanka Coal company Ltd

and the company relevant to the lightering that to consider declaration as zero rated from 17 January 2018, accordingly deemed that Lanka Coal company (Pvt) Ltd requires to pay the default VAT to the company. This dispute had not been resolved for long time and action had not been taken to recover the default VAT from Lanka Coal Company (Pvt) Ltd and remit to Inland Revenue Department.

**W.P.C. Wickramaratne**
Auditor General

ජාතික විගණන කාර්යාලය

මගේ අංකය PAS/B/CSCL/01/20-21/02 දිනය : 2022 සැප්තැම්බර් 21

සී/ස. ලංකා නැව් සංස්ථාව

සභාපති

සී/ස. ලංකා නැව් සංස්ථාව

ශ්‍රී ලංකා නැව් සංස්ථාවේ 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සී/ස. ලංකා නැව් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍ර කාරව විගණකාධිපති වාර්තාව.

## 1. මූල්‍ය ප්‍රකාශ

### 1.1 තත්වාගණනය කළ මතය

සී/ස. ලංකා නැව් සංස්ථාවේ (සමාගම) 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය විස්තිර්ණ ආදායම් ප්‍රකාශය, කොටස් ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය , කැපී පෙනෙන ගිණුම් ප්‍රතිපත්ති සහ සෙසු පැහැදිලි කිරීම් සටහන් සාරාංශයක්ද ඇතුලත් 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ 2018 අංක 19 දරණ විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) දරණ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ මෙහෙයවීම යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කල මතය සඳහා වූ පදනම කොටසේ විස්තර කරනු ලැබ ඇති කරුණුවලින් එන බලපෑම හැරුණු කොට 2021 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කල මතය සඳහා වූ පදනම

(අ) මූල්‍ය ප්‍රකාශ අනුව සමාලෝචනයට අදාල වර්ෂය තුල පාඩුව රු. 813,320,485 ක් වී ඇති අතර 2021 මාර්තු 31 දිනට සමුච්චිත පාඩුව රු. 3,419,789,062 ක් වී ඇත. තවද 2021 මාර්තු 31 දිනට සමාගමේ ශුද්ධ වත්කම් /කොටස් ස්කන්ධවල වටිනාකම රු. 2,041,613,494 ක් වශයෙන් සෘණ අගයක් පෙන්නුම් කල අතර එයින් පැහැදිලිව නිරීක්ෂණය වුයේ සමාගම ක්‍රියාත්මක වීමේදී භෞතික විෂයයන් පිළිබඳ අවිනිශ්චිතතාවන් ඇති බවයි.සමාලෝචනයට අදාල වර්ෂය තුලදී සිදුවූ පාඩුවට ප්‍රධන හේතු වශයෙන් දැක්විය හැක්කේ 2021 මාර්තු 31 දිනට එ.ජ. ඩොලර්වලින් ලබාගත් ණය රුපියල් වටිනාකමට පරිවර්තනය කිරිමේදි රුපියල් 684,460,190 විණිමය පාඩුවක් සිදුවීමයි. මෙම තත්වය සමනය කර ගැනිම සඳහා 2021 ජුලි 03 වැනි දින පැවති අතිවිශේෂ මහා සභා රැස්වීමේදි යම් යම් පිලියම් යෝජනා කරන ලදි.

එසේ වි නමුත් මෙම රැස්වීමේදි එ.ජ. ඩොලර් ණය රුපියල් ණයකට පරිවර්තනය කොට නැව් නැතීමේ කර්මාන්තය තුල සාමාන්‍යයෙන් සිරිත් පරිදි අයකරනු ලබන 7.88% පොලි අනුපාතයේ සිට 2-4% පොලි අනුපාතයක් දක්වා අඩුකිරිමේ සහන කොන්දේසි මත එකී ණය ප්‍රතිව්‍යුගත කිරිම සඳහා කළමනාකාරිත්වයට කැමැත්ත දෙන ලදි.

කෙසේ නමුත් මහ බැංකුව විසින් එයට කැමැත්ත ප්‍රකාශ නොකරන ලද හෙයින් ඒකී ණය ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කිරිමට නොහැකි විය. එහෙත් බැංකුව විසින් එකී ණය ආපසු ගෙවීමට නියමිතව තිබූ වසර 15 ක කාලසීමාව වසර 20 ක් දක්වා වැඩිකිරිම මඟින් ප්‍රතිව්‍යුහගක කරන ලද අතර අපේක්ෂා කල පරිදි පොලි අනුපාතය 2-4% දක්වා අඩු නොකරන ලද නමුත් මාස 6 + LIBO අනුප්‍රමාණය 5.25 සිට 0.25 දක්වා අඩුකරන ලදි. එබැවින් 2022 ජුනිමස 2 දින වන විටත්, අංක 259/2021/151 දරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය අනුව එකී ණය එ.ජ.ඩොලර් වලින් ලංකා රුපියල්වලට පරිවර්තනය කිරිමට පෙර හා පසුව උත්පාදනය වන මුදල් ප්‍රවාහ පදනම් කරගනිමින් ප්‍රධාන පාඩුව සමනය කර ගැනීමේ සාධකය සාර්ථක නොවිය.

තවද, 2020 නොවැ. 17 දින එලඹි අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මුල්‍යා සම්පාදකයෙකු සොයා ගැනිම සඳහා යෝජනා ඉල්ලීම් (REP) කැඳවූ අතර ඉදිරිපත් කරන ලද එක් යෝජනාවක් පදනම් කර ගනිමින් ලන්ඩනයේ පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය විමසා මේ පිළිබඳව පැහැදිලි කිරිමක් ලබාගැනීමට සහ මහ බැංකුවෙන් සහ නීතිපති දෙපාර්තමේන්තුවෙන් පැහැදිලි කිරිම් ලබාගන්නා ලෙස තාක්ෂණික කමිටුව විසින් දක්වා ඇත. කෙසේ නමුත් මෙම ක්‍රියාවලිය 2022 ජුනි 02 වනතුරුත් සම්පූර්ණ වි තිබුනේ නැත.

දිගු කාලීන සංවර්ධනයක් සාක්ෂාත් කරගැනම් වස් ව්‍යාපාරික ක්‍රමෝපයයන් වශයෙන් නාවික කටයුතු විවිධාංගීකරණය කිරිම සඳහා වු සෙසු යෝජනා නම් ශ්‍රී ලංකා රජයේ ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරිම, පාවෙන නාවික ඉන්ධන ගබඩා ක්‍රියාත්මක කිරිම, නොරෝච්චොලේ වෙත මඟින් හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා බෝට්ටුවක් ඉදිකිරිම බංග්ලාදේශයේ නැව් සංස්ථාව සමඟ එක්වී කොළඹ හා බංග්ලාදේශය අතර පෝෂක සේවාවක් ක්‍රියාත්මක කිරිම සහ බොරතෙල් මුහුදින් ප්‍රවාහනය කිරිම සඳහා කල්වේලා ඇතිව තෙල් ප්‍රවාහනය කිරිම සඳහා නැවක් කුලියට ගැනිම හෝ හිස් බෝට්ටු කුලි පදනම මත (bareboat) ගැනිම යනාදි කටයුතු ක්‍රියාත්මක කොට නැත.

(ආ) දේපොල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් (LKAS 16) 51 ඡේදය අනුව කිසියම් වත්කමක ශේෂ අගය ප්‍රයෝජ්‍ය ආයුකාලය අඩුම තරමින් එක් එක් මූල්‍ය වර්ෂය අවසන් වන විට සමාලෝචනය කල යුතු අතර ඉහත ඇස්තමේන්තු වලට වඩා ප්‍රක්ෂේපන වෙනස් වන්නේ නම්, එම වෙනස/වෙනස්කම් ගිණුම් ඇස්තමේන්තු හා දෝෂ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති හා ගිණුම් ප්‍රතිපත්ති අනුව වෙනසක් වශයෙන් සලකා ගිණුම් ගත කළ යුතුය. මීට වෙනස්ව යමින් මුල්‍ය ප්‍රකාශ පිලියෙල කිරිමේදි රු. 34,479,817 ක අගයකින් යුතු වත්කම් 2021.03.31 දින වන විට මුළුමනින්ම ක්ෂය කොට තිබේ. කෙසේ නමුත්, එකි වත්කම් ප්‍රත්‍යාගණය කොට අවශ්‍ය පරිදි සීරුමාරු කිරිම් සිදුකිරිම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබිනි.

(ඇ) LKAS 7 - 6 වැනි ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය, මුදල් සඳහා වු අර්ථ දැක්වීම්වල අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතු අඩංගු වේ. සමාගමේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව, මුදල් හා මුදල් සාමාන්‍යට අතැති මුදල් , ඉල්ලුම් තැම්පතු හා මාස තුනක් හෝ ඊට අඩු සෙසු කෙටිකාලීන මුලික කල්පිරිම් සහිත ක්ෂණික ද්‍රවශීලි ආයෝජන ඇතුලත් වේ. මීට වෙනස්ව යමින් නාවික යාත්‍රා දෙකේ කපිතාන්වරු දෙදෙනාට එදිනෙදා මෙහෙයුම් කටයුතු සඳහා රු. 1,003,766 ක මුදල් ප්‍රමාණයක් ( මුදල් ප්‍රතිපුර්ණයක් ) ලබා දී තිබුණු අතර එය මුදල් හා මුදල් සාම්‍යයන් වශයෙන් සලකා නොතිබුනු අතර එම මුදල අනෙකුත් ලැබීම් නියමිත යටතේ ඇතුලත් කර තිබිනි. එබැවින් 2021 මාර්තු 31 දිනට මුල්‍ය තත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල මුදල් හා මුදල් සාම්‍යයන් ඉහතකී අගයන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අදාල ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත (LKAS) 1 - 35(1) ඡේදය අනුව විදේශ විනිමය ලැබීම් සහ ගනුදෙනුවලදි සිදුවූ පාඩු (වැදගත් සේ සැලකෙන ඒවා නම්) එකී ලැබීම් හා පාඩු වෙන වෙනම සඳහන් කල යුතුය.කෙසේ නමුත් මීට වෙනස්ව යමින් රු. ක් වූ විනිමය ලැබීම් රු. 2,109,976,010 ක අගයකින් යුතු ඍජු වියදම් වලට හිලව් කොට තිබේ. 67,155,002

තවද, ඉහත කී ගිණුම් ප්‍රමිතින් හි 32 වැනි ඡේදය අනුව ප්‍රමිති ප්‍රකාරව අවසර නොමැත්තේ නම් සමාගමේ වගකීම්වලට වත්කම් හිලව් නොකල යුතුය.

කෙසේ නමුත් රු.888,948 ක් වූ හර ශේෂයන් වෙළඳ ගෙවීම් නියමිත හා රු. 3,402,124 ක්වූ හර ශේෂයන්ට හිලව් කොට තිබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වෙළඳ ගෙවීම් නියමිත හා අනෙකුත් ගෙවීම් අඩුවෙන් සඳහන් කොට තිබේ. සමාලෝචනයට අදාල වර්ෂය අවසානයේදි හර ශේෂයන් හි අගය රු.4,291,042 කින් අඩුවෙන් දක්වා ඇත.

(ඉ) නැව් ඉදිකිරීම් සමාගම විසින් නාවික යාත්‍රා දෙකේ ඇප වශයෙන් තැන්පත් කල එ.ජ.ඩොලර් 745,246 (රු.114,247,992) ක මුදල ගෙවිය යුතු ශේෂය සමාගම විසින් පරිවර්තනය කර නොතිබුනි. එබැවින් ඇප සහතික අළුත්වැඩියා ලැබීම් නියමිත (Guaranty Repair Receivables) රු. 36,321,510 කින් අඩුවෙන් සඳහන් කොට තිබිනි. තවද, විදේශීය ව්‍යවහාර මුදල් ණය හිමියන් (නාවික ඒජන්තවරුන්) විසින් සම්පාදිත රු.270,987,706 /- මුදලක් සමුච්චිත මූල්‍ය ප්‍රකාශවල සඳහන් දිනට පැවති අනුපාතය අනුව සඳහන් කොට නොතිබිණි.

(ඊ) නැව් දෙකෙහි නාවික ඉන්ධන තොග ගිණුම, සමාගම විසින් නිවැරිදිව පවත්වාගෙන නොතිබූ බව නිරික්ෂණය විය. එබැවින් 2021 මාර්තු 31 දිනට පැවති නාවික ඉන්ධන තොගයේ වටිනාකම වූ රු.195,148,355 පිළිබඳ තහවුරුවක් විගණනයට ලබා දීමට නොහැකි වි ඇත. Ceylon Breeze නෞකාවට අදාලව ආදර්ශ විගණන පරීක්ෂාවක් සිදු කිරීමේදි පැහැදිලි වූ කරුණක් නම් පළමුවෙන්ම කුලියට දිමේදි 17,310,005 ක්වූ නාවික ඉන්ධන තොගයේ ලෙජර් ශේෂය සහ සමාලෝචනයට අදාල වර්ෂය තුලදී යාත්‍රාව කුලීගැනුම්කරුවන්ට මුදා හැරීමේදි රු.1,160,926 ක් වූ මිලපාඩුව හා ප්‍රමාණාත්මක වෙනස හා රු. 43,759,166 ක අගයකින් යුත් ජුලි මස නාවික ඉන්ධන තොගය අත් හැරීම නාවික ඉන්ධන තොහ ගිණුමට හා ලාභාංශ ගිණුමට ගලපා නොතිබිණි.

(උ) ණය ගැතියන් 22 ගේ රු. 73,809,918 ක සමුච්චිත මුදලක්ද ණයහිමියන් 13 දෙනෙකුගේ රු. 26,750,981 ක වෙළඳ ගෙවීම් නියමිත පිළිබඳව නිරවද්‍යතාවය හෝ ඔවුන් සිටිදැයි යන්න පිළිබඳ තොරතුරු විගණනයට දැනගැනීමට නොහැකි වුයේ ඒ පිළිබඳ ප්‍රමාණවත් හා ගැලපෙන සාක්ෂි සහ තහවුරුවක් නොමැති වූ හෙයිනි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ( SLAUSS ) ප්‍රකාරව මවිසින් විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම් මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සම්බන්ධයෙන් විගණනගේ වගකීම යටතේ සවිස්තරාත්මකව දක්වා ඇත. මාගේ තත්ත්වාගණය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සමාගමේ 2020/21 වාර්ෂික වාර්තාවේ ඇතුලත් අනෙකුත් තොරතුරු

2020/21 වාර්ෂික වාර්තාවේ ඇතුලත් තොරතුරුවලට ,අනෙකුත් තොරතුරු ඇතුලත් වේ. එහෙත් ඒට මූල්‍ය ප්‍රකාශ සහ මාගේ විගණකගේ වාර්තාවේ අන්තර්ගත නොවේ. මෙම විගණකගේ වාර්තාවේ දිනට පසුව එය ලැබෙනු ඇතැයි අපේක්ෂිතය.සෙසු තොරතුරු පිළිබඳව කළමණාකාරිත්වය වගකිව යුතුය.
මූල්‍ය ප්‍රකාශ පිළිබඳව දක්වා ඇති මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොවන අතර ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික වීමේ නිගමනයන් නොදක්වමි.

මා විසින් කරන ලද මූල්‍ය ප්‍රකාශ විගණනයේදී මාගේ වගකීම වන්නේ ඉහත පරිදි හඳුනාගත් වෙනස් තොරතුරු ලැබෙන විට අධ්‍යයනය කිරීම වන අතර එසේ කිරීමේදී එකී තොරතුරු මූල්‍ය ප්‍රකාශ සමඟ ප්‍රමාණාත්මකව අනුකූල වන්නේද යන්න හෝ විගණනයේ දී වෙනත් ආකාරයකින් මා ලබාගත් තොරතුරු ප්‍රමානාත්මක වශයෙන් අවප්‍රකාශයන්ගෙන් යුක්ත ද යන්න සොයා බැලීමයි.

2020/21 වර්ෂය සඳහා වූ සමාගමේ වාර්ෂික වාර්තාව අධ්‍යයනය කිරීමේදී එහි ප්‍රමාණාත්මක අයුරින් අවප්‍රකාශ ඇතුලත් වී තිබෙයයි මා නිගමනය කරන්නේ නම් පාලනය භාරව සිටින ඒවා නිවැරිදි කරනු සඳහා පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරනු ලැබිය යුතුවේ.
එසේ නිවැරිදි නොකරන ලද ප්‍රමාණාත්මක වැදගත් අවප්‍රකාශ තවදුරටත් පවතී නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව යථා කාලයේදී පාර්ලිමේතුවේදී සභාගත කිරීමට නියමිත මාගේ වාර්තාවේ අඩංගු කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ හා පාලනය පිළිබඳ වගකීම පැවරි ඇති පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව පිලියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශ පිලියෙල කිරීමට හැකිවනු පිණිස හැකිවන අභ්‍යාන්තර පාලනයන් තිරණය කිරීම කළමණාකාරිත්වයේ වගකීමක වන අතර කළමණාකාරිත්වය විසින් සමාගම ඈවර කිරීමට අදහස්කරන්නේ නම් හෝ එවැනි විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයු කරන්නේ නම් හැර අඛන්ඩව පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමණාකාරිත්වයේ වගකීමයි. මූල්‍ය ප්‍රකාශ කිරීමේදී සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකාරිත්වයේ වගකීමක් වන අතර කළමනාකාරිත්වය විසින් සමාගම ඈවර කිරීමට අදහස් කරනේ නම් හෝ එවැනි විකල්පයල් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේනම් හැර අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකාරිත්වයේ වගකීමයි

සමාගමේ මූල්‍ය වාර්තාකරණයට අදාල වගකීම පාලනය කරන පාර්ශ්ව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) වගන්තිය අනුව සමාගම විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශ පිලියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේදී විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍යප්‍රකාශ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුලත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර එහි ප්‍රමාණාත්මක බව මෙම මූල්‍ය ප්‍රකාශ පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී.

මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල තිබිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව, උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ව්‍යාජ ලේඛණ සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන් වරදවා දැක් වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයෙන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගනන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශවල ඇතුලත් බව අගැයීම.

- සිද්ධීන් හෝ තත්තවයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් තිබේද යන්න පිළිබඳව ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛන්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවක් ඇති බවට මා නිගමණය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකල යුතු අතර ඒවා ප්‍රමාණනවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. කෙසේ වුවද අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා සහ අනෙකුත් කරුණු පිළිබඳව පාලන පාර්ශ්වයන් දැනුවත් කරන ලදි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනත අනුව 2007 අංක 7 දරණ සමාගම් පනතේ පහත දැක්වෙන නියමයන් සම්බන්ධයෙන් විශේෂිත විධිවිධාන පනවා තිබේ.

2.1.1 තත්වාගණය කල මතය සඳහා වූ පදනම ඡේදයෙහි පැහැදිලි කරන ලද කරුණුවල බලපෑම හැරුණු කොට විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු මවිසින් ලබා ගන්නා ලදි. මාගේ විගණන පරීක්ෂාව තුලින් මට පෙනියන පරිදි ගිණුම් වාර්තා නිසිලෙස සමාගම විසින් පවත්වාගෙන ඇති අතර එය 2007 අංක 7 දරණ සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ නියමතාවන්ට සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) දරන වගන්තියට අනුකුල වේ.

2.1.2 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ සඳහන් නියමතාවලට සමාගමේ මූල්‍ය ප්‍රකාශ අනුකුල වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) 111 වගන්තිය මඟින් දක්වා ඇති නියමතාවන්ට අනුව ඉදිරිපත් කරනු ලැබ ඇති මූල්‍ය ප්‍රකාශ ඉහත වර්ෂයට අනුකුල වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (IV) වගන්තිය මඟින් දක්වා ඇති නියමතා වලට අනුව මා ඉහත වර්ෂයේදි කරන ලද සියළු නිර්දේශයන් ඉදිරිපත් කොට ඇති මූල්‍ය ප්‍රකාශයන්හි අඩංගු වේ.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග හා ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල පහත සඳහන් ප්‍රකාශ කිරිමට තරම් කිසිවක් මගේ අවධායට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් නියමතා අනුව සමාගමට සම්බන්ධ කිසියම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අනායාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලින් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් නියමතාවලට අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ නියමයන්ට අනුකුල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| | නීතිරිති/විධානයට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ අංක 7.4 .5 ඡේදය | ස්ථාවර වත්කම් හා වට්ටෝරුගත භාණ්ඩ තහවුරු කර ගැනිම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කල යුතුය. එසේ වුවද, නැව්දෙක තුල තිබෙන් රු. 260,130,072 ක අගයකින් යුත් වට්ටෝරුගත භාණ්ඩ භෞතික වශයෙන් ඇත් දැයි තහවුරු කර ගැනිම සඳහා සමීක්ෂණයක් 2021 මාර්තු 31 දිනට සිදු නොකොට තිබිණි. |
| (ආ) | 2017 ඔක්.25 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව චකුලේඛ අංක 2017/05 | චක්‍රලේඛයේ සඳහන් දීමනාවට හිමිකම් නොමැති නිලධාරින්ට පමණක් වෘත්තිවේදී දීමනාව හිමිවන නමුත් මෙම නියමයෙන් බැහැරව සේවකයින් 11 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුල පැමිණිමේ දීමනාව, ලේකම් දිමනාව, වාහන දීමනාව, අතිරේක දීමනාව, රඳවා ගැනීමේ දීමනාව වශයෙන් සමාගම විසින් 856,638 ගෙවා ඇත. තවද, 2019/20 වර්ෂය තුලදී එම දීමනාව වශයෙන් රු. 1,109,085ක මුදලක් සේවකයින් 13 දෙනෙකුට ගෙවා ඇත. |

2.2.3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තිය අනුව සමාගම ස්වකීය බලතල, කර්තව්‍ය හා කාර්ය නියමයන්ට අනුකුල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තිය මහින් දැක්වෙන නියමතා අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස හා ඵලදායි ලෙස නියමිත කාලවලදී අදාල නීතිවලට අනුව ප්‍රසම්පාදනය කොට භාවිතා කර නොමැති බව.

3. <u>වෙනත් කරුණු</u>

(අ) 2021මාර්තු 21 දිනට වෙළඳ ලැබිම් නියමිතවල එකතුව රුපියල් 1,829,796,029 ක් වූ අතර එදිනට, අපවය වීම් සඳහා ප්‍රතිපාදන වල වටිනාකම රු.1,010,026,050 ක් විය. මුළු ණය ගැතියන්ගෙන් 59% කින් අයවිය යුතු රු. 1,095,930,525 ක මුදල් ප්‍රමාණයක් අවුරුද්දකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමට නොහැකිව තිබුනි. තවද, රජයේ නැව්බඩු නිශ්කාෂණයෙහි නිරතව සිටි 95% ණය ගැතියන් රජයේ බහාළුම් තැන්පතු සහ වෙනත් ණයගැතියන් ගෙන් අයවීමට තිබු රු. 91,139,337 ක මුදල් ප්‍රමාණයක් අවුරුදු 03 ක් තිස්සේ අයකර ගැනීමට නොහැකිව තිබිනි.

තවද, ඒජන්සි කොමිස් වශයෙන් වු රු. 3,120,768 ක ලැබිම් නියමිත ඒජන්තවරුන් (Agents) 17 දෙනෙකුගෙන් අවුරු 03 ක් තිස්සේ අයකර ගැනීමට නොහැකි වී ඇත.

ඔවුන් මෙහෙයුම් කටයුතුවල නිරත නොවන අතර සමාලෝචිත වර්ෂය අවසානයේදි ඔවුන්ගේ සමුච්චිත ශේෂය රු.2,004,609 ක් විය. එයින් නිරීක්ෂණය වූ කරුණක් නම් ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියා පටිපාටිය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක නොවු බවයි.

(ආ) එක් බැංකු ගිණුමක් (ලංකා බැංකු ගිණුම් අංක 5935658) සම්බන්ධයෙන් IFS ගිණුම් පද්ධතිය තුල ලෙජර් ගිණුම් දෙකක් සමාගම විසින් පවත්වාගෙන ගොස් තිබුණි (ලෙජර් ගිණුම් අංක 16160 සහ 16120)

(ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරල ලද 2003 සැප්. 03 දිනැති අංක VAT/GEN/04 දරණ ලිපිය මගින් දි ඇති උපදෙස් අනුව සමාගම විසින් එකතු කල අගයමත බද්ද (VAT ) මුදල් පදනමින් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීමට යටත් වේ. ඒ අනුව ඉන්වොයිස් 20 කට අදාලව 2012 නොවැ.19 දින සිට 2018 ජනවාරි 16 දක්වා ලංකා ගල් අඟුරු සමාගමෙන් (Lanka Coal Company Ltd) එකතු කල අගය මත බද්ද (VAT) අයකර ගැනීමට අපොහොසත් වීම නිසා රු. 66,419,287 ක මුදලක් එකී සමාගමෙන් නොගෙවු මුදලක් ලෙස පැවතිනි. තවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මේ පිලිබඳව 2018 ජනවාරි 17 දිනැති අංක ACT 17/19 දරණ ලිපියෙන් ලංකා ගල් අඟුරු සමාගම සහ ගල්අඟුරු ගොඩබෑමට අදාල සමාගම අතර ඇති වූ ආරවුල පිලිබඳව පැහැදිලි කිරීම් දක්වා ඇති අතර ලංකා ගල් අඟුරු සමාගම විසින් පැහැර හැර ඇති එකතු කල අගය මත බද්ද (VAT) සමාගමට ගෙවිය යුතු බව පෙනියයි. මෙම ආරවුල කලක් තිස්සේ පවතින අතර, එකී පැහැර හැරි බද්ද ලංකා ගල් අඟුරු සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කොට එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරිමට කටයුතු කොට නොමැත.

ඩබ්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

සී/ස ලංකා නැව් සංස්ථාව

මාර්තු 31 දිනෙන් අවසන් වූ

වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| | | රු. | රු. |
| ආදායම | 4 | 3,094,619,027 | 3,849,354,149 |
| සෘජු මෙහෙයුම් වියදම | | (2,042,821,008) | (2,636,981,156) |
| **දළ ලාභය** | | **1,051,798,018** | **1,212,372,993** |
| වෙනත් ආදායම් | 5 | 229,739,950 | 117,664,629 |
| පරිපාලන වියදම් | | (215,875,765) | (216,649,745) |
| **වත්කම් හානිකරණය වීමට පෙර මෙහෙයුම්වලින් ලාභ** | | 1,065,662,204 | 1,113,387,878 |
| වත්කම් හානිකරණය වීම | | (161,701,680) | (268,323,431) |
| **මෙහෙයුම්වලින් ලාභය** | 6 | 903,960,524 | 845,064,447 |
| මූල්‍ය වියදම් | 7 | (1,441,271,549) | (1,952,380,884) |
| ආශ්‍රිත සමාගම්වල (ශුද්ධ බදු සහිත)ලාභයේ කොටස | 14.2 | 10,185,997 | 22,100,882 |
| **බද්දට පෙර (ලාභය/පාඩුව)** | | **(527,125,027)** | **(1,085,215,556)** |
| ආදායම් බදු ආදායම්/ (වියදම්) | 8 | - | - |
| **වර්ෂය සඳහා ලාභය/ (පාඩුව) ආ.බද්දෙන් පසුව** | | **(527,125,027)** | **(1,085,215,556)** |
| වර්ෂය සඳහා විලම්භිත බදු ගැලපුම් කිරීම් | 17 | **(286,195,458)** | **(69,253,553)** |
| **ආදායම් බද්දෙන් පසුව හා විලම්භිත බදු ගැලපීමෙන් පසුව වර්ෂය සඳහා ලාභය (පාඩුව)** | | **(813,320,485)** | **(1,154,469,109)** |
| **කොටසක් සඳහා මූලික හා තනුක ඉපැයීම්** | 9 | **(105)** | **(217)** |
| වර්ෂය සඳහා ලාභය | | (813,320,485) | (1,154,469,109) |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | |
| විකිණීම සඳහා වූ මූල්‍ය වත්කම්වල සාධාරණ අගය වෙනස්වීම මත පාඩුව | 16.1 | 5,962,650 | (5,342,534) |
| ජීවගණක උපකල්පන වෙනස්කම්වලින් ඇති වූ පාඩු | 29.1 | (2,666,471) | (9,587,688) |
| ආශ්‍රිත සමාගම්වල අනෙකුත් විස්තීරණ ආදායමේ කොටස (බදු සහිත) | 14.2 | 5,112,610 | 310,099 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | | **(804,911,696)** | **(1,169,089,232)** |

පිටු අංක 45 සිට 83 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසක් නියෝජනය කරයි.

සී/ස ලංකා නැව් සංස්ථාව

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මාර්තු 31 වැනි දිනට

| වත්කම් | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපොල, පිරියත හා උපකරණ | 10 | 9,244,124,773 | 9,655,986,279 |
| කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්ය (යාත්‍රා) | 11 | | - |
| අස්පෘශ්‍ය වත්කම් | 12 | | - |
| පාලිත සමාගම්වල ආයෝජන | 13 | | - |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජන | 14 | 387,476,863 | 372,531,378 |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම් | 16 | 19,621,054 | 13,658,404 |
| විලම්භිත බදු වත්කම් | 17 | 192,452,549 | 478,648,007 |
| ජංගම නොවන මුළු වත්කම් | | **9,843,675,240** | **10,520,824,068** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | | 260,658,042 | 203,586,679 |
| වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත | 18 | 984,461,402 | 2,325,941,430 |
| ව්‍යවස්ථාපිත ලැබීම් | 19 | 10,606,151 | 32,177,013 |
| කල්පිරීම් ආයෝජන | 20 | 120,615,896 | 143,997,433 |
| කෙටිකාලීන ආයෝජන | 21 | 24,839,609 | 24,107,923 |
| මුදල් හා මුදල් සමානයන් | 22 | 847,663,133 | 479,509,131 |
| මුළු ජංගම වත්කම් | | **2,248,844,233** | **3,209,319,609** |
| **මුළු වත්කම්** | | **12,092,519,473** | **13,730,143,677** |
| **කොටස් ස්කන්ධ හා බැරකම්** | | | |
| **කොටස් ස්කන්ධ** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 23 | 50,000,000 | 50,000,000 |
| කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය | 24 | 543,939,497 | 543,939,497 |
| ප්‍රාග්ධන සංචිත | 25 | 767,029,766 | 767,029,766 |
| ප්‍රත්‍යාගණන සංචිත | 26 | 3,065,444 | 3,065,444 |
| විකිණීම සඳහා තිබෙන මූල්‍ය වත්කම් සංචිතය | | 14,140,862 | 8,178,212 |
| රඳවාගත් ඉපැයීම් | | (3,419,789,062) | (2,647,715,036) |
| **මුළු කොටස් ස්කන්ධ** | | **(2,041,613,494)** | **(1,275,502,117)** |

| | | | |
|---|---|---|---|
| **ජංගම නොවන බැරකම්** | | | |
| දිගුකාලීන ණය ගැනුම් | 28 | 12,139,697,919 | 12,434,283,858 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවන් - පාරිතෝෂික | 29 | 40,406,325 | 42,095,586 |
| විලම්භිත බදු බැඳියාවන් | 17 | - | - |
| මුළු ජංගම නොවන බැරකම් | | **12,180,104,244** | **12,476,379,445** |
| | | | |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත | 30 | 831,978,507 | 1,618,262,435 |
| කෙටිකාලීන ණයට ගැනුම් | 31 | 1,020,271,290 | 808,290,000 |
| ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත | 32 | 72,570,160 | 76,180,071 |
| උපචිත වියදම් | 33 | 29,208,766 | 26,533,843 |
| මුළු ජංගම බැරකම් | | 1,954,028,723 | 2,529,266,349 |
| **මුළු ස්කන්ධ හා බැරකම්** | | **12,092,519,473** | **13,730,143,677** |

පිටු අංක 45 සිට 83 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසක් නියෝජනය කරයි. 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමතාවන් අනුව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන ලදී.

------------------------------
වැ.බ සාමාන්‍යාධිකාරී

------------------------------------
සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමතකොට අත්සන් තබන ලදී.

------------------------------
අධ්‍යක්ෂ

------------------------------
අධ්‍යක්ෂ

## 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කොටස් ආයෝජන වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය | ප්‍රාග්ධන සංචිතය | ප්‍රත්‍යාගණන සංචිතය | විකිණීමට ඇති මූල්‍ය වත්කම් සංචිතය | රඳවාගත් ඉපැයීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2019 අප්‍රේල් 01 දිනට ශේෂය | 50,000,000 | 543,939,497 | 767,029,766 | 3,065,444 | 13,520,746 | (1,433,218,760.32) | (55,663,307) |
| | | | | | | (50,749,578.08) | (50,749,578) |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | - | **(1,154,469,109.00)** | **(1,154,469,109)** |
| අනෙකුත් සවිස්තරාත්මක ආදායම් | - | - | - | - | **(5,342,534)** | **(9,277,589.00)** | **(14,620,123)** |
| 2020 මාර්තු 31 දිනට ශේෂය | **50,000,000** | **543,939,497** | **767,029,766** | **3,065,444** | **8,178,212** | **(2,647,715,035.83)** | **(1,275,502,117)** |
| ඉහත වර්ෂයේ ගැලපුම් කිරිම | | | | | | 38,800,319,.56 | 38,800,320 |
| අවුරුද්ද සඳහා පාඩුව | - | - | - | - | | (813,320,485.18) | (813,320,485) |
| IFRS සඳහා ක්ෂය ගැලපුම් කිරිම | | | | | | | |
| අනෙකුත් සවිස්තරාත්මක ආදායම් | - | - | - | - | 5,962,650 | 2,446,139.00 | 8,408,789 |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | **50,000,000** | **543,939,497** | **767,029,766** | **3,065,444** | **14,140,862** | **(3,419,789,062.45)** | **(2,041,613,494)** |

පිටු අංක 45 සිට 83 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යාම කොටසක් නියෝජනය කරයි.

## සී/ස. ලංකා නැව් සංස්ථාව
## මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2021 | 2020 |
|---|---|---|
| | රු. | රු. |
| මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ | | |
| බද්දට පෙර ලාභය/ පාඩුව | (527,125,027) | (1,085,215,556) |
| ගැලපුම් කිරීම් | | |
| ක්ෂයවීම් | 413,611,172 | 413,455,923 |
| ස්ථාවර වත්කම් බැහැර කිරිමේදී ලාභය/ පාඩුව | (56,840) | (74,144) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 3,859,463 | 3,864,205 |
| ලාභාංශය ආදායම | (192,143) | (290,117) |
| ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස (බදු සහිත) | (10,185,997) | (22,100,882) |
| වෙළඳ ණයගැතියන් අඩුවීම වෙනුවෙන් ප්‍රතිපාදන | 161,701,680 | 268,323,431 |
| විණිමය පාඩු | 624,649,103 | 992,935,000 |
| පොලි ආදායම් | (23,963,961) | (28,946,143) |
| පොලි වියදම් | 756,811,358 | 942,422,392 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **1,399,108,806** | **1,484,374,109** |
| තොග (වැඩි විම)/ අඩුවීම | (57,071,363) | (118,459,326) |
| වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත (වැඩි විම)/ අඩුවීම | 1,341,480,027 | (459,377,681) |
| වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත (අඩුවීම)/ වැඩි විම | (786,283,928) | 284,119,049 |
| ව්‍යවස්ථාපිත ලැබීම් නියමිත (අඩුවීම) /වැඩි විම | 21,570,862 | (2,424,421) |
| ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත (අඩුවීම)/ වැඩි විම | (3,609,911) | (3,289,971) |
| උපචිත වියදම් (අඩුවීම)/ වැඩි විම | 2,674,923 | (2,841,041) |
| **මෙහෙයුම්වලින් ලැබූ මුදල්** | **1,917,869,416** | **1,182,100,718** |
| ගෙවූ පාරිතෝෂිත | (7,441,695) | (6,842,807) |
| ගෙවූ පොලිය | (794,584,810) | (945,194,783) |
| ගෙවූ බදු | - | - |
| **මෙහෙයුම් කටයුතු වලින් ලැබූ මුළු මුදල** | **1,115,842,911** | **230,063,129** |

| | | | |
|---|---|---|---|
| <u>ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහ</u> | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | | (1,749,666) | (8,960,725) |
| යාත්‍රා පිරිවැය ගෙවීම් | | | - |
| ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලත් මුදල් | | 56,840 | 74,144 |
| කල් පිරිමට ඇති මූල්‍ය වත්කම් වලින් (ආයෝජන වලින්) ලද මුළු මුදල | | (60,871,727) | (110,871,727) |
| ශුද්ධ කෙටිකාලීන ආයෝජන | | (731,686) | (723,679) |
| ලැබුණු පොලිය | | 20,155,818 | 34,588,622 |
| ලැබූ ලාභාංශ | | 545,265 | 290,117 |
| ආයෝජන කටයුතුවල යෙදවූ ශුද්ධ මුදල | | **(42,595,156)** | **(85,603,248)** |
| <u>මූල්‍ය කටයුතුවලින් වූ මුදල් ප්‍රවාහය</u> | | | |
| යාත්‍රාණය නැවත ගෙවීම් | | (705,093,752) | |
| මූල්‍ය සම්පාදන කටයුතුවලින් ලැබූ මුළු මුදල | | 705,093,752 | |
| මුදල් හා මුදල් සමානායන්ගේ මුළු වැඩිවීම | | **368,154,002** | **144,459,881** |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමානායන් | | **479,509,131** | **335,049,250** |
| වසර අගදී මුදල් හා මුදල් සමානායන් | සටහන 22 | **847,663,133** | **479,509,131** |

පිටු අංක 45 සිට 83 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යාම කොටසක් නියෝජනය කරයි.

සී/ස ලංකා නැව් සංස්ථාව

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන්

## 1. සාමාන්‍ය තොරතුරු

### 1.1 අස්ථිතිය හා නෛතික ආකෘතිය

ශ්‍රී ලංකාවේ පිහිටියා වූ ද, 1992 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද්දා වූ ද සී/ස ලංකා නැව් සංස්ථාව වූ කලී ලංකා නැව් සංස්ථාවට (CSC) අනුප්‍රාප්තික ආයතනයක් වන අතර මෙය 1971 අංක 11 දරන ලංකා නැව් සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ආයතනයකි. මෙහි ලියාපදිංචි කාර්යාලය සහ ව්‍යාපාරික කටයුතු කිරීමේ ප්‍රධාන ස්ථානය කොළඹ 01 ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවතේ, යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ අංක 27 දරන ස්ථානයේ පිහිටා තිබේ.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

සමාලෝචනයට අදාළ වර්ෂය තුළදී සමාගම ප්‍රධාන වශයෙන්ම නාවික ගමනාගමනය, හිමිකාරිත්වය සහ නාවික යාත්‍රා කුලියට දීම වැනි කටයුතු පිළිබඳව කළමනාකරණ සේවා සම්පාදනයෙහි නියැලුණි.
සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වරූපයේ කැපිපෙනෙන වෙනස්කම් කිසිවක් සිදුනොවුණි.

### 1.3 සේවකයින් සංඛ්‍යාව

2021 මාර්තු 31 දිනට මුළු සේවක සංඛ්‍යාව 122 ක් විය. (2020 මාර්තු 31 දිනට 116)

### 1.4 වාර්තා කිරීමේ දිනය

සමාගමේ මූල්‍ය වාර්තාකරණ දිනය මාර්තු 31 දිනෙන් අවසන් වන අතර ආශ්‍රිත සමාගම්වල මූල්‍ය වාර්තාකරණ කාලසීමාව දෙසැම්බර් 31 දිනෙන් අවසන් වේ. සමාගමේ වාර්තාකරණ කාලසීමාවේ අවසන් දිනය හා ආශ්‍රිත සමාගම්වල වාර්තා කිරීමේ අවසන් දිනට කැපීපෙනෙන කිසියම් ගණුදෙනු වේ නම්, සමාගම ඒවා සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් කරයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශ සඳහා අනුමැතිය

මෙම මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ 2022 ජනවාරි මස 20 වැනි දින නිකුත් කිරීමට බලය දෙන ලදී.

## 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

සමාගමේ සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, කොටස් ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සටහන් යනාදිය වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව හා 2007 අංක 7 දරන සමාගම් පනතේ නියමතාවන්ට අනුව පිළියෙල කරන ලදී.

### 2.2 ගණනය කිරීමේ පදනම

සාධාරණ මිල අනුව ගණනය කරන ලදුව විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් ගනයෙහිලා සැලකෙන ලැයිස්තුගත ආයෝජන හා ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීම හැර සමාගමේ මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය අනුව ගණනය කරන ලදී.
මූල්‍ය ප්‍රකාශවලටට බලපෑමක් ඇතිවන උද්ධමනකාරී සාධක වෙනුවෙන් ගැලපුම් කිරීම් නොකෙරිණි.

### 2.3 සංසන්දනාත්මක සංඛ්‍යා

වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට අනුකූල වන අයුරු අවශ්‍ය තැන්හිදී ඉහත වර්ෂයේ සංඛ්‍යා සහ ඡේද නැවත වර්ගීකරණය කරන ලදී.

### 2.4 කාර්යීය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් භාණ්ඩ විෂයන් මනිනු ලබන්නේ සමාගම ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරය තුළ ව්‍යවහාර වන මුදල් ඒකක භාවිත කිරීමෙනි. ශ්‍රී ලංකා රුපියලේ ආසන්න අගයට වටයනු ලැබේ. සමාගමේ කාර්යීය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් අනුව ආසන්නතම ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කෙරේ.

### 2.5 ඇස්තමේන්තු හා තීන්දු භාවිත කිරීම

ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි ප්‍රමිති (SLFRS) අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ගිණුම් ප්‍රතිපත්ති මෙන්ම වත්කම්, වගකීම් ආදායම් හා වියදම් පිළිබඳව වාර්තා වී ඇති ප්‍රමාණයන් කෙරෙහි බලපෑමක් ඇති කෙරෙන අයුරින් කළමනාකාරීත්වය විසින් තීන්දු තීරණ හා උපකල්පනයන් සිදු කිරීම අවශ්‍යවේ. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස් වියහැකිය.

ඇස්තමේන්තු හා වැදගත් උපකල්පනයන් අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. ගිණුම් ඇස්තමේන්තු සඳහා වන සංශෝධන ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබන හා බලපෑමට යටත්විය හැකි ඉදිරි කාලය තුළ හඳුනාගනු ලැබේ.

### 2.6 වැදගත් අවැදගත් බව හා සමූහනය

සමාන භාණ්ඩ විෂයන්හි එක් එක් ද්‍රව්‍ය පංතිය වෙන වෙනම මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇත. අසමාන ස්වභාවයෙන් යුක්ත භාණ්ඩ විෂයන් හෝ කාර්ය කටයුතු නොවැදගත් වන්නේ නම් වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

## 3. කැපී පෙනෙන ගිණුම් ප්‍රතිපත්ති සම්පිණ්ඩනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි හා ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ, සමාගම විසින් පිළියෙල කරන ලදී. මෙකී මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී යොදා ගන්නා ලද ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් යම් ආකාරයකින් දක්වා නොමැත්තේ නම් මිස, සියලු වර්ෂයන්හි දී මෙම ප්‍රතිපත්ති අනවරතව යොදා ගන්නා ලදී.

### 3.1 විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු / පරිවර්තන

ගනුදෙනුව සිදුවන දිනයේ දී බලපවත්නා විදේශ විනිමය අනුපාතය අනුව විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම සිදු කෙරේ. විදේශ විනිමය අනුව වටිනාකම දැක්වෙන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් ගත්කල මූල්‍ය තත්වය ප්‍රකාශිත දිනයන්හි දී බලපැවැත්වෙන විදේශ විනිමය අනුපාතයට අනුව ශ්‍රී ලංකා රුපියලට පරිවර්තනය කෙරේ. එකී පරිවර්තනයන්හි දී උද්ගත වන වෙනස්කම් ලාභ හෝ අලාභ ගිණුමේ දී හඳුනා ගැනේ. ඓතිහාසික පිරිවැය පදනම යටතේ සඳහන් කරන ලද විශේෂ ව්‍යවහාර මුදල් වටිනාකම අනුව වූ මූල්‍ය වත්කම් හා වගකීම්වල වටිනාකම ගණුදෙනුව සිදු වූ දිනයේ බලපැවැත් වූ විදේශ විනිමය අනුපාතය අනුව පරිවර්තනය කරන ලදී.

### 3.2 ආදායම් බදු වියදම්

වර්ෂය සඳහා වූ බදු වියදම්වලට ඇතුළත් වන්නේ වත්මන් හා විලම්බිත බදු ය. ලාභය හෝ අලාභය තුළ බද්ද හඳුනා ගැනෙන අතර වෙනත් සවිස්තරාත්මක ආදායම් වශයෙන් සෘජුවම හඳුනා ගැනෙන ආදායම් හෝ වියදම් විෂයකට අදාල වන වෙනස්කමක් ඇතුලත් වන්නේ නැත.

#### (අ) ප්‍රවර්තන බදු

ප්‍රවර්තන බදු යනුවෙන් හැඳින්වෙන්නේ වර්ෂය සඳහා ගෙවීමට නියමිත බද්දට යටත් ආදායම වෙනුවෙන් ගෙවීමට අපේක්ෂිත බද්ද යි. වාර්තා කරන දිනයට බලාත්මක වන බදු අනුප්‍රමාණයන් සහ ඉහත වර්ෂය සම්බන්ධයෙන් ගෙවිය යුතු බද්දට වූ වෙනත් ගැලපීම් කිරීම් මේ සඳහා අදාල කරගනු ලැබේ.

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ ඉන් ඉක්බිති සංශෝධන ප්‍රකාරව සමාගමේ බදු බැඳියාව ගණනය කොට තිබේ.

#### (ආ) විලම්බිත බද්ද

මූල්‍ය ප්‍රකාශයන් තුළ දැක්වෙන වත්කම්වල ඉදිරියට ගෙනයන වටිනාකම හා ඒවාට අනුරූප බදු පදනම්ව (තාවකාලික වෙනස්කම් වශයෙන් හඳුන්වනු ලබන) වෙනස මත විලම්බිත බද්ද හඳුනා ගැනේ. ඉදිරියේ දී බද්දට යටත් ලාභය වැඩිවෙතැයි අපේක්ෂා කරන සියලු තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැඳියාවන් හඳුනා ගනු ලැබේ. ඉදිරියේ දී බද්දට යටත් ලාභය අඩුවෙතැයි අපේක්ෂිත සියලු තාවකාලික වෙනස්කම් සහ භාවිතා නොකළ බදු පාඩු හා බදු වාසි වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනා ගැනේ. (විලම්බිත බදු වත්කම් මනිනු ලබන්නේ වර්තමාන හෝ ඇස්තමේන්තුගත අනාගත බදු අය කළ හැකි ලාභය මත පදනම්ව, අයකර ගත නොහැකි වඩා වැඩි ප්‍රමාණයකි).

විලම්බිත බද්දේ ඉදිරියට ගෙන යන වටිනාකම එක් එක් වාර්තා කිරීමේ දිනයට සමාලෝචනය කරනු ලබන අතර ඉදිරි බද්දට යටත් ලාභවල ප්‍රවර්තන තක්සේරුව පිළිබිඹු වන සේ ගැලපීම් කරනු ලැබේ. ගැලපීම් කිරීම් කිසිවක් වේ නම් ලාභ හෝ අලාභයන් තුළ ඒවා හඳුනාගනු ලැබේ.

වාර්තා කිරීමේ අවසන් දිනය වන විට බලාත්මක කරුණු ලැබ තිබෙන හෝ සැලකිය යුතු තරමින් බලාත්මකව තිබෙන බදු අනුපාත පදනම් කරගෙන, විලම්බිත බදු වත්කම් පැහැදුම් කරගැනීමට හෝ බදු බැඳියාවන් නිරවුල් කිරීමට අපේක්ෂිත කාලය තුළ බදු ආදායමට (බදු පාඩුවට) අදාළ කර ගැනීමට අපේක්ෂා කරනු ලබන බදු අනුප්‍රමාණ මත විලම්බිත බද්ද ගණනය කෙරේ.

වත්කම් හා තක්සේරු පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ප්‍රවර්තන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති වත්කම් වූ කලී සාමාගමේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හඳුනා ගැනීමට අපේක්ෂිත වත්කම් හෝ වාර්තා කිරීමේ දින සිට අවුරුද්දක් තුළ යන දෙකින් වඩාත් අඩු කාල සීමාවක් තුළ හඳුනා ගැනීමට තිබෙන ඒවා ය. ප්‍රවර්තන වත්කම් හැරුණු විට, වත්කම් යනුවෙන් දැක්වෙන්නේ මූල්‍ය තත්ව ප්‍රකාශයේ දින සිට අවුරුද්දකට වඩා රඳවා ගැනීමට අපේක්ෂිත ඒවා ය.

## 3.3 දේපල, පිරියත හා උපකරණ

### (අ) හඳුනා ගැනීම හා ගණනය කිරීම

දේපල, පිරියත හා උපකරණ සඳහන් කරනු ලබන්නේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ප්‍රත්‍යාගණන වටිනාකම අනුව ඉදිරියට ගෙනගිය ඉඩම් හැර පිරිවැය අඩුකළ සමුච්චිත ක්ෂය වීම් හා කිසියම් සමුච්චිත හානිකරණ වටිනාකම් අනුව ය. ඓතිහාසික පිරිවැයට ඇතුළත් වන්නේ දේපල ඒවා පවතින ස්ථානයට රැගෙන ඒමේ දී කළමනාකාරිත්වය විසින් ඒවා තමන් අදහස් කරන ආකාරයට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තත්ත්වයන් යටතේ දැරීමට සිදු වූ යම් පිරිවැයක් වේ නම් ඒවා ද ඇතුළුව මූලිකව දැරූ පිරිවැය යි. තමන් විසින් ම ගොඩනගන ලද වත්කම්වලට ද්‍රව්‍ය සඳහා වැය වූ පිරිවැය සහ සෘජු කම්කරු පිරිවැය ඇතුලත් වේ.

විවිධ ප්‍රයෝජ්‍ය ආයු කාලයක් සහිත ප්‍රධාන අංගවලින් යම් දේපලක්, පිරියත හෝ උපකරණ සමන්විත වේ නම් ඒවා වෙන් වෙන් දේපල, පිරියත හා උපකරණ සේ ගණන් ගනු ලැබේ.

### (ආ) අනුෂාංගික වියදම්

දේපල, පිරියත හා උපකරණයක ඉදිරියට ගෙනයන වටිනාකමට එවැනි භාණ්ඩයක කොටසක් වෙනුවට යමක් ප්‍රතිස්ථාපනය කිරීමේ දී ඊට වැය වෙන පිරිවැය ඇතුළත් කරන්නේ එයින් සමාගමට වර්ධනාත්මක ප්‍රතිලාභයක් අත්වන බව අපේක්ෂා කරන විට දී ය. ප්‍රතිස්ථාපනය කළ කොටසේ ඉදිරියට ගෙනයන වටිනාකම හඳුනා නොගැනේ. අනෙකුත් සියලු අලුත්වැඩියා කිරීම් සහ නඩත්තු සඳහා දැරූ වියදම් ඒවා දරන ලද කාල සීමාවේ ලාභයට හෝ පාඩුවට අයපත් කෙරේ.

(ඇ) <u>ක්ෂය වීම්</u>

ඉඩම් ක්ෂය වීම් ගණනය නොකරනු ලැබේ. ක්ෂය වීම් ලාභයට හෝ පාඩුවට අයපත් කෙරෙන්නේ අනෙකුත් දේපල, පිරියත හා උපකරණවල ඇස්තමේන්තු කළ ප්‍රයෝජ්‍ය ආයු කාලයක් එකී විෂයන්හි අවශිෂ්ය අගයෙන් අඩුකොට වත්කම්වල පිරිවැයට ඉඩදීම සඳහා ය. මීට සරල මාර්ග ක්‍රමය භාවිතා කෙරේ. දේපලවල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පහත දැක්වේ.

| වත්කම් | වර්ෂ |
|---|---|
| ගොඩනැගිලි | 20 |
| නාවික යාත්‍රා | 25 |
| මෝටර් රථ | 04 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් හා කාර්යාලීය උපකරණ | 10 |
| පරිගණක | 05 |

කිසියම් භාණ්ඩයක ක්ෂය වීම් ගණනය කිරීම ආරම්භ වන්නේ එය භාවිතයට ගත හැකි වූ විට වන අතර අනතුරුව විකිණීමට ඇති භාණ්ඩයක්සේ වර්ගීකරණය කළ දින සිට සහ එය හඳුනා නොගත් දිනට පෙර නතර වේ. වාර්තා කිරීමේ අවසාන දිනය වන විට කැපී පෙනෙන වෙනසක ඉඟියක් වේ නම් යෝග්‍යය යි සැලකෙන පරිදි වත්කමේ අවශේෂ වටිනාකම් ප්‍රයෝජ්‍ය ආයු කාල සහ ක්ෂය කිරීමේ ක්‍රම භාවිතමය අයුරින් සමාලෝචනය කොට ගැලපුම්කරනු ලැබේ.

සුදුස්සක් කොට බැහැර කිරීමේ දී විකුණු භාණ්ඩ විෂයේ ශුද්ධ නියාදන ලැබීම් සහ ඉදිරියට ගෙනයන වටිනාකම ලාභ හෝ පාඩු තුළ හඳුනා ගැනෙන අතර ‘වෙනත් අදායම්’ හෝ වෙනත් මෙහෙයුම් වියදම් වල ඇතුළත් කෙරේ.

**3.4 <u>අස්පෘශ්‍ය වත්කම්</u>**

අත්පත්කරගන්නා ලද පරිගණක මෘදුකාංග පාවිච්චියට සරිලන අයුරු විශේෂිත මෘදුකාංග හා ක්‍රමපද්ධති පිහිටුවීම සඳහා දරන ලද පිරිවැය පදනම් කර ගෙන ඒවා ප්‍රග්ධනීකරණය කෙරේ . අත්පත් කර ගත් එවැනි වත්කම් සම්බන්ධයෙන් ගත්කල ඒවායේ පිරිවැය සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකිරීමෙන් පසුව සඳහන් කෙරේ . මෙකී පිරිවැය ඒවායේ ප්‍රයෝජ්‍ය ආයුකාලය අනුව පහත සඳහන් පරිදි ක්‍රමක්ෂය කෙරේ.

| | |
|---|---|
| පරිගණක මෘදුකාංග | අවුරුදු 05 |

පරිගණක මෘදුකාංග නඩත්තු කිරීමේ සේවාවන් ආශ්‍රිත පිරිවැය, දැරූ වියදමක් ලෙස හඳුනාගැනේ.

**3.5 <u>ආශ්‍රිත සමාගම්වල ආයෝජනය කිරීම</u>**

සාමාන්‍යයෙන් සෘජුව හෝ වක්‍රව 20% ක කොටස් ධාරිත්වයක් වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම ඇති එමෙන් සමාගම විසින් කැපී පෙනෙන බලපෑමක් කලත් පාලනයක් (Control) කළ නොහැකි ආයතන, ආශ්‍රිත සමාගම් වේ. ආශ්‍රිත සමාගම්වල කෙරෙන ආයෝජන ගණනය කිරීම සඳහා ස්කන්ධ ගිණුම් ක්‍රමය භාවිතා කරන ලදී. මෙම ක්‍රමය යටතේ ආයෝජන මූලික වශයෙන් පිරිවැය මත හඳුනා ගනු ලැබේ.

ආයෝජකයාගේ ලාභයේ හෝ පාඩුවේ කොටස හඳුනා ගැනීමට ඉදිරියට ගෙනයන වටිනාකම අත්පත්කර ගැනීමේ දිනෙන් පසුව වැඩි හෝ අඩු කෙරේ.

සමාගමේ පශ්චාත් අත්පත් කර ගැනීම්වල ලාභයේ හෝ පාඩුවේ කොටස සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනෙන අතර ආයෝජිතයාගේ සෙසු සවිස්තරාත්මක ආදායම තුළ එහි පශ්චාත් අත්පත් කර ගැනීම්වල චර්යාවන් ආයෝජකගේ ඉදිරියට ගෙනයන වටිනාකමට වූ අනුරූප ගැලපුම් සහිතව වෙනත් විස්තීරණ ආදායම් තුළ හඳුනා ගනු ලැබේ.

එක් එක් වාර්තා කිරීමේ දිනයේදී ආශ්‍රිත සමාගම්වල සිදුකර තිබෙන ආයෝජන හානි වී ඇත්ද යන්න පිළිබඳව කිසියම් විෂය මූලික සාක්ෂි තිබේදැයි යන්න සමාගම් විසින් තීරණය කරනු ඇත. එවන් ආවස්ථාවක් වේ නම් ආශ්‍රිත සමාගම්වලින් අයකර ගත හැකි මුදල් ප්‍රමාණය හා එහි ඉදිරියට ගෙනයන වටිනාකම අතර වෙනස හානිය සේ ගණනය කොට සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ ආශ්‍රිත සමාගම්වල ලාභයේ/ (පාඩුවේ) කොටසට සමීප සංඛ්‍යාව හඳුනා ගනු ලැබේ.

## 3.6 විකිණීමට තිබෙන ජංගම නොවන වත්කම්

ජංගම නොවන වත්කම් පාවිච්චි කිරීමට වඩා ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම් ඒවා මූලික වශයෙන් විකිණීමෙන් ලබා ගත හැකි වන්නේ නම් සමාගම විසින් ඒවා ජංගම නොවන වත්කම් වශයෙන් වර්ගීකරණය කරනු ලබේ.

විකිණීමට තිබෙන ජංගම වත්කම් මනිනු ලබන්නේ ඒවා විකිණීමට වැය වන පිරිවැය අඩුකිරීමෙන් පසු ඒවායේ ඉදිරියට ගෙන යන වටිනාකම සහ සාධාරණ අගය අනුවය. විකිණීමට තිබෙන යන වර්ගීකරණය සඳහා වූ නිර්ණායකය සපුරා ඇති බව සැලකෙන්නේ විකිණීම සඳහා පැවතීම යන කරුණුය. කළමනාකාරීත්වය විසින් විකිණීමේ ක්‍රියාව සඳහා කැපවිය යුතු අතර විකිණීම සඳහා වර්ගීකරණය සිදුකොට වර්ෂයක් තුළදී එය අංග සම්පූර්ණ විකුණුම් ක්‍රියාවක් ලෙස හඳුනා ගැනීමට සුදුසුකම් ලබා තිබිය යුතුය. අයිතිකරුවන්ට විකිණීමට/ බෙදා දීමට යනුවෙන් වර්ගකොට ඇති දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂයවීම හෝ ක්‍රමක්ෂය සිදු නොකෙරේ.

## 3.7 මූල්‍ය නොවන වත්කම් හානි වීම

එක් එක් වාර්තා කිරීමේ අවසන් දිනයට මූල්‍ය වත්කම් වල කිසියම් හානිකරණය වීමක් සිදුවී ඇත්දැයි යන්න හඳුනා ගැනිම පිණිස සමාගම විසින් ඒවා සමාලෝචනය කරයි. එවැනි හානිකරණය වීමක් සිදුවිය හැකි බවට ඉඟියක් වේ නම් එවැන්නක් සිදුවී ඇති වත්කමින් (හෝ ආශ්‍රිත භාණ්ඩ සමූහයක්) අයකරගත හැකි මුදල ඇස්තමේන්තු කොට එහි ඉදිරියට ගෙනයන වටිනාකම, සමඟ සසඳනු ලැබේ. අය කර ගත හැකි මුදල අඩු නම් ඉදිරියට ගෙන යන වටිනාකම එහි ඇස්තමේන්තු කළ අයකර ගත හැකි මුදලට අඩුකොට, හානිකරණය පාඩුව ලාභ හෝ පාඩු තුළ ඉක්බිතිව හඳුනා ගැනේ.

මීට සමානව සෑම වර්තා කිරීමේ දිනය වන විට එක් එක් තොග (හෝ භාණ්ඩ සමූහය) ඒවායේ විකුණුම් මිල සමඟ, (සැසඳීම හා විකිණීම සඳහා දරන ලද පිරිවැය අඩුකොට), ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම සමඟ සසඳමින් හානිකරණ වීම් සැලකිල්ලට ගෙන තක්සේරු කරනු ලැබේ.

කිසියම් තොගයක් (හෝ එවැනි භාණ්ඩ සමූහයක්) හානිකරණ වී ඇත්නම් විකිණීමේ පිරිවැය අඩුකොට , එහි ඉදිරියට ගෙනයන වටිනාකම විකිණීමේ මිලට අඩු කරනු ලබන අතර ඉන් ඉක්බිතිව ලාභ හෝ පාඩු තුල හඳුනා ගැනීමට කටයුතු කෙරේ.

හානිකරණ පාඩුවක් ඉන් පසුව ප්‍රතිවර්තනය වේ නම් , වත්කමේ (හෝ ආශ්‍රිත වත්කම් සමූහයේ) ඉදිරියට ගෙනයන වටිනාකම එහි අයකරගත හැකි සංශෝධිත වටිනාකමට (තොගය සම්බන්ධයෙන් නම් ඒවා සම්පූර්ණයෙන් විකුණා දැමීමේ පිරිවැය අඩුකොට) ඉහල නංවනු ලැබේ . එහෙත් එය ඉකුත් අවුරුදු වල , එකී වත්කම (හෝ ආශ්‍රිත වත්කම් සමූහය) සම්බන්ධයෙන් හානිකරණ පාඩුවක් සිදු නොවූ අවස්ථාවක තීරණය කිරීමට ඉඩ තිබූ වටිනාකමට වැඩි නොවිය යුතු ය . හානිකරණ පාඩුවක ප්‍රතිවර්තන ලාභ හෝ පාඩු තුල ඉක්බිතිව හඳුනා ගැනේ .

**3.8 <u>තොගය</u>**

තොග අගය,යල්පැනගිය සහ අඩුවෙන් පාවිච්චිවන භාණ්ඩ විෂයන් වෙනුවෙන් ලැබිය යුතු නිසි ප්‍රතිලාභ සැලසීමෙන් පසු පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකම හඳුනාගත හැකි වටිනාකම අනුව අගයනු ලැබේ. තොගවලට පරිභෝජන ද්‍රව්‍ය ඇතුලත් වේ. තොග දැනට පවත්නා ස්ථානයට හා දැනට පවත්නා තත්වයට ගෙන ඒමට දැරූ පිරිවැය FIFO පදනම අනුව ගණනය කරනු ලැබේ. මුදල් කිරීමේදි ලැබෙන ශුද්ධ වටිනාකම, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළ තොග විකිණිය හැකි මිලයි.

**3.9 <u>මූල්‍ය උපකරණ</u>**

**<u>මූල්‍ය වත්කම්</u>**

සමාගම විසින් තම මූල්‍ය වත්කම් , ප්‍රාරම්භක හඳුනාගැනීම මත වර්ගීකරණය කිරීමට තීරණය කරනු ලබන අතර එකී මූල්‍ය වත්කම් පහත දැක්වෙන අයුරු වර්ගකරයි .

**(අ ) වර්ගීකරණය**

**(i ) ණය සහ ලැබීම් නියමිත**

ණය සහ ලැබිය යුතු දේ යනු සක්‍රිය වෙළඳ පොලේ ලයිස්තුගත නොවූ ස්ථිර හෝ නිර්ණය කලහැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. වාර්තාකිරීමේ දිනය අවසාන වීමේ සිට මාස 12 කට වඩා වැඩි කාලසීමාවක් සඳහා ප්‍රවර්තන නොවන වත්කම් සේ වර්ග කොට ඇති කල්පිරීම් ආයෝජන හැර ණය සහ ලැබිය යුතු දේ නියමිත වලට අඩංගුවන්නේ වාර්තාකිරීම් කාලසිමාවේ අවසාන දිනය වන විට ඇති වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත , කාලීන තැන්පතු ආයෝජන, තැන්පතු හා අත්තිකාරම් ,මුදල් හා මුදල් සාම්‍යයන් යන ඒවාය.

**(ii ) විකිණීමට ඇති මූල්‍ය වත්කම් (AFS)**

විකිනීමට ඇති මූල්‍ය වත්කම් වූ කලි මෙම ගණයයට නම් කරන ලද ව්‍යුත්පන්න නොවන භාණ්ඩ විෂයන් හෝ වෙනත් ගණයන් යටතේ වර්ගීකරණය නොකරන ලද ඒවා වේ.වාර්තාකිරීමේ අවසන් දිනයේ සිට මාස 12 ක් ඇතුලත විකුණා දැමීමට සමාගම අපේක්ෂා නොකරන්නේ නම් හෝ ආයෝජනය කල් නොපිරේනම් එකී වත්කම් ප්‍රවර්තන නොවන වත්කම්වලට ඇතුලත් කෙරේ.විකිනීමට ඇති මූල්‍ය වත්කම්, දිගුකාලීන ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ කොටස්වලින් සමන්විතවේ .

### (iii ) කල්පිරීම් සඳහා තබා ඇති ආයෝජන (HTM)

කල්පිරීම් ආයෝජන වූ කලි ස්ථිර හෝ නිගමනය කල හැකි ගෙවීම් හා ස්ථිර කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර ණය හා ලැබීම් නියමිතද ඊටඇතුලත් නැත. කල්පිරෙන තෙක් එකී ආයෝජන එසේ රඳවා තැබීමට අපේක්ෂාවක් හෝ හැකියාවක් තිබේනම් එම අයෝජන කල් පිරීම සඳහා රඳවා තැබූ ආයෝජන සේ වර්ග කෙරේ. අවුරුද්දකට වැඩි කාලයකින් කල් නොපිරේ නම් කල් පිරීම සඳහා රැඳවූ ආයෝජන ප්‍රවර්තන වත්කම්වලට ඇතුලත් කෙරේ. කල් පිරීම සඳහා තබා ඇති ආයෝජන භාණ්ඩාගාර බිල්පත් වලින් සමන්විත වේ.

### (ආ ) හඳුනාගැනීම හා ප්‍රාරම්භක මැන බැලීම්

සමාගම විසින් ගණුදෙනු ආරම්භ කරන දිනයේ සිට ණය සහ අනෙකුත් ලැබීම්. නියමිත වශයෙන් මූල්‍ය වත්කම් හඳුනා ගැනේ.මූල්‍ය උපකරණයේ කොන්ත්‍රාත්තුමය විධිවිධාන තුළ සමාගම පාර්ශවයකත්වය දක්වන දිනයේ සිට (trade-date)අනෙකුත් මූල්‍ය වත්කම් හඳුනාගනු ලැබේ. මූලික වශයෙන්ම මූල්‍ය වත්කමක් සාධාරණ මිල අනුව මනිනු ලබන අතර ඊට ලාභ හෝ අලාභ හර හා සාධාරණව ටිනාකම අනුව හඳුනාගනු නොලබන වත්කම් සම්බන්ධයෙන් ඒවාට අදාළ වන ගණුදෙනු පිරිවැයද ඊට ඇතුළත්ය. මූල්‍ය වත්කමෙන් ජනිතවන මුදල් ප්‍රවාහයන් ලබා ගැනීමට තිබෙන හිමිකම් ඉකුත්වන විට හෝ එකී හිමිකම් වෙනත් පාර්ශවයකට පවරන විට සහ සමාගම සත්‍ය වශයෙන් ම පවරාදෙනු ලබන විට මූල්‍ය වත්කම් ප්‍රතිපාදන හඳුනාගැනීමක් සිදු නොකෙරේ. සමාගම මූල්‍ය වත්කම්වල හිමිකාරිත්වයේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇත.

### (ඇ ) පසුව ගණනය කිරීම

#### (i) ණය සහ ලැබීම් නියමිත

ප්‍රාරම්භක හඳුනා ගැනීමෙන් ඉක්බිතිව ණය සහ ලැබීම් නියමිත අපවය සඳහා වූ ප්‍රතිපාදන අඩුකොට සඵල පොලී අනුපාතිකය ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය මගින් මැන බලනු ලැබේ.

#### (ii) විකිණීමට ඇති මූල්‍ය වත්කම් (AFS)

ප්‍රාරම්භක හඳුනාගැනීමෙන් ඉක්බිතිව, විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගකොට ඇති මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම අනුව මනිනු ලැබේ. විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගැනෙන අතර කොටස් ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය තුළ විකිණීමට ඇති සංචිතය වශයෙන් ඉදිරිපත් කෙරේ. ලැයිස්තුගත නොවූ කොටස් ආයෝජන සහ කිසියම් අපවය පාඩුවක් තිබේ නම් ඒවා අඩුකොට පිරිවැය අනුව ගණනය කෙරෙන්නේ ප්‍රවර්තන කාලයේදී ඒවායේ සාධාරණ අගය තක්සේරු කළ නොහැකි නිසාය.

#### (ii ) කල්පිරීම සඳහා ඇති ආයෝජන

කල්පිරීම් සඳහා තබා ඇති ආයෝජන සඵල පොලි අනුපාතය භාවිතකරමින් ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කෙරේ. අත්පත් කරගැනීම් හා ගනුදෙනු පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ.

(ඇ) මූල්‍ය වත්කම් හානි වීම

**(i) ක්‍රමක්ෂය පිරිවැය අනුව ඉදිරියට ගෙන යන වත්කම්**

එක් එක් වාර්තා කිරිමේ කාලසීමාව අවසානයේදී කිසියම් මූල්‍ය වත්කමක් අපචය වී ඇති බවට විෂය මූලික සාක්ෂි තිබේදැයි තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කම් අපචය වී අපචය පාඩුවක් සිදුවන්නේ වත්කමේ ප්‍රාරම්භක හඳුනා ගැනිමෙන් ඉක්බිතිව සිදුවන්නා වූ යම් පාඩු සිදුවීමක් හෝ පාඩු සිදුවීම් ගණනාවක් නිසා වූ අපචය වීමක් පිළිබඳව විෂය මූලික සාක්ෂි තිබේනම් සහ එකී පාඩු සිදුවීම/ සිදුවීම් හරහා නිසැක ලෙස තක්සේරු කළ හැකි අනාගත මුදල් ප්‍රවාහයන් මත බලපෑමක් එයින් ඇති වන බවට විෂය මූලික සාක්ෂි ඇත්නම් පමණි.

ක්‍රමක්ෂය පිරිවැය අනුව ඉදිරියට ගෙනයන ණය හා ලැබීම් නියමිත සම්බන්ධයෙන් ගත් කළ ඒවායේ පාඩු මනිනු ලබන්නේ වත්කමේ ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම සහ මූල්‍ය වත්කමේ වත්කම් සඵල පොලී අනුපාතය අනුව වට්ටම් කරන ලද ඇස්තමේන්තු අනාගත මුදල් ප්‍රවාහයන්හි (නොදැරූ අනාගත ණය පාඩු හැර) ප්‍රවර්තන අගය අතර ඇති වෙනසයි. මූල්‍ය වත්කමේ ඉදිරියට ගෙන ඇති වටිනාකම අඩු කරනු ලබන අතර පාඩු වූ මුදල සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

ඉක්බිතිව එළඹෙන කාල පරිච්ඡේදයකදී අපචය පාඩුව අඩු වේ නම් හා අපචය හඳුනා ගැනිමෙන් පසුව සිදුවූ කාරණාවකට එකී අඩුවීම විෂය මූලික වශයෙන් සම්බන්ධතාවක් දක්වයි නම් කලින් හඳුනාගත් අපචය පාඩුවේ වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

**ii) විකිණීමට ඇති මූල්‍ය වත්කම්**

වාර්තාකිරීම් අවසන් දිනය වන විට කැපී පෙනෙන අයුරින් දිගින් දිගටම අපචය වී ඇති බවට විෂය මූලික සාක්ෂි ඇත්දැයි සමාගම විසින් තක්සේරු කරනු ලැබේ . ලැයිස්තු ගත කොටස් ආයෝජනය කිරීම් සම්බන්ධයෙන් ගත්කල ආයෝජනයන්හි සාධාරණ අගයෙහි සැලකිය යුතු හා දිගුකාලීන අඩුවීම ඒවායේ පිරිවැයට අඩු නම් , වත්කම් අපචය වන බවට සාක්ෂියක් වේ . ලැයිස්තුගත ආයෝජන සම්බන්ධයෙන් එවැනි සාක්ෂියක් විද්‍යාමාන වේ නම් (ලාභ හෝ අලාභයන්හි කලින් හඳුනාගත් අපචය පාඩු වේ දක්නට ලැබේ නම් ඒවා අඩුකොට ) අත්පත් කරගැනීමේ පිරිවැය හා වත්මන් සාධාරණ අගය අතර වෙනස සමුච්චිත අලාභය සේ ගණනය කරනු ලබන අතර ප්‍රතිවර්ගීකරන සීරුමාරුවක් වශයෙන් කොටස් ස්කන්ධයේ සිට ලාභය දක්වා හෝ පාඩු තුල හඳුනාගනු ලබන අපචය පාඩු හෝ ලාභ හරහා ප්‍රතිවර්තනය කරනු ලැබේ . එසේ ප්‍රතිවර්තනය කරන ලද මුදල් ප්‍රමාණය වෙනත් විස්තීර්ණ අදායම් තුල හඳුනාගනු ලැබේ .

ලැයිස්තුගත නොවූ කොටස් ආයෝජන සම්බන්ධයෙන් ගත්කල ආයෝජනයන්හි වටිනාකම ඒවා සඳහා දැරූ පිරිවැයට අනුව කැපී පෙනන අයුරින් දිගින් දිගටම අඩුවක් පෙන්නුම් කරන්නේ නම් එය වත්කම් අපචය වන බවට සාක්ෂියක් වේ . එබඳු යම් සාක්ෂියක් ලැයිස්තුගත නොවූ ආයෝජන සම්බන්ධයෙන් දක්නට ලැබේ නම් එවැනිම මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් වත්මන් වෙළඳපොලේ අනුප්‍රමාන (rate) මත වට්ටම් කරනු ලැබූ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වත්මන් වටිනාකම හා මූල්‍ය වත්කමේ ඉදිරියට ගෙනයන වටිනාකම අතර වෙනස පාඩුවට අදාල මුදල සේ ගණනය කරනු ලැබේ . එවැනි අපචය හානි ආපසු හැරවිය නොහැක.

### 3.9.1 වෙළඳ හා අනෙකුත් ලැබීම් නියමිත

වෙළඳ හා අනෙකුත් ලැබීම් නියමිත, මුලිකව ගනුදෙනු මිල අනුව හඳුනාගනු ලැබේ. ලැබීම් නියමිත පොලියක් නොදරන විට සහ ලැබිය යුතු මුදල් (වට්ටම් නොකළ ) පදනම් කරගෙන තක්සේරු කරන තැන් හි දී සාමාන්‍ය ණය කොන්දේසි යටතේ බොහෝ විකිණුම් සිදු කෙරේ. සාමාන්‍ය ණය කාලසීමාවෙන් ඔබ්බට ණය දිගු කෙරෙන විට, ලැබීම් නියමිත , ක්‍රමක්ෂය පිරිවැය අනුව මැන බලන අතර ඊට යොදාගනු ලබන්නේ සඵල පොලි අනුපාතයයි.වාර්තා කිරීමේ අවසාන දිනයට වෙළඳ ලැබීම්නියමිතවල ඉදිරියටගෙනයන වටිනාකම ලැබිය යුතු මුදල් ප්‍රමාණයෙන් ආපසු අය කර ගැනීමට නොහැකි වන බවට විෂය මුලික සාක්ෂියක් තිබේ දැයි තීරණය කිරීම පිණිසසමාලෝචනය කරනු ලැබේ. එසේවන අවස්ථාවලදීඅපචය පාඩුව ලාභ සහ අලාභය වහාම හඳුනා ගැනේ. 2018 අප්‍රේල් 01 දින සිට මුල්වරට ලංකා නැව් සංස්ථාව විසින් අතීත සබලතාව සහිතව SLFRS -09 අදාළ කර ගත්තේය.

### 3.9.2 මුදල් හා මුදල් සාමාන්‍යයන්

මුදල් හා මුදල් සාම්‍යයන් ඇතුලත් වන්නේ අතැති මුදල් ඉල්ලු විටෙක ගතහැකි තැන්පතු සහ මුලිකව මාස තුනකට වඩා හෝ ඊට අඩු කල්පිරීම් සහිත ඉහල ද්‍රවශීලතාවයෙන් යුක්ත අනෙකුත් කෙටි කාලින ආයෝජනයන්. මුල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ඇති ප්‍රවර්තන වගකීම්වල වල බැංකු අයිරා සඳහන් කරනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය " වක්‍ර ක්‍රමය ' භාවිතා කරමින් පිළියෙළ කොට තිබේ.

මුල්‍ය වගකීම

### 3.9.3. වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත

වෙළඳ හා ගෙවීම් නියමිත මුලික වශයෙන් ගනුදෙනු පිරිවැය ඇතුලත්ව ගනුදෙනු මිල යටතේ හඳුනාගනු ලැබේ. වෙළඳ ගෙවීම් නියමිත වූ කලි සාමාන්‍ය ණය නියමයන් මත ඉටු කරන බැඳියාවන් වන අතර ඒවාට පොලිය අඩංගු නොවේ. සඵල පොලි අනුපාත ක්‍රමය යොදා ගනිමින් ඉක්බිතිව පොලි සහිත වගකීම් ක්‍රමක්ෂය පිරිවැය අනුව මැන බැලීම සිදු කෙරේ .

### 3.9.4 බැංකු අයිරා

බැංකු අයිරා, ඉල්ලු විටක ගෙවිය යුතු ඒවා වන අතර මුලිකව මැන බලා ඉක්බිතිව මුහුණත වටිනාකම අනුව සඳහන් කරනු ලැබේ.

### 3.10 රජයේ ප්‍රදාන

ප්‍රදාන ලැබෙන බවට සැලකිය යුතු සහතිකයක් තිබේ නම් සහ සමාගම විසින් ඊට අදාල කොන්දේසි වලට අනුව කටයුතු කරන්නේ නම් මුදල් නොවන ප්‍රදාන ඇතුළුව රජයෙන් ලැබෙන දෑ සාධාරණ මිල අනුව හඳුනාගැනේ .

දේපල , පිරියත හා උපකරණ සම්බන්ධයෙන් රජයෙන් ලැබෙන ප්‍රදාන විලම්බිත ප්‍රදාන ලෙසින් ජංගම නොවන වගකීම් වල ඇතුලත් කෙරෙන අතර අදාල වත්කම්වල අපේක්ෂිත ආයු කාලය මත සෘජු රේඛා පදනමින් විස්තීරණ අදායම් ප්‍රකාශය තුල හඳුනාගැනේ .

මුදල් නොවන ප්‍රදාන ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම අනුව අගයනු ලබන අතර ඉදිරියට ගෙනයන වටිනාකම අනුව ප්‍රදාන හා වත්කම් ලෙස ගණනය කෙරේ.

**වගකීම් සහ ප්‍රතිපාදන**

මූල්‍ය තත්ව ප්‍රකාශ තුල "ජංගම වගකීම්" ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති බැඳියාවන් වූ කලී වාර්තා කිරීමේ දින සිට වර්ෂයක් ඇතුලත ගෙවීමට නියමිත හෝ ඉල්ලූ විටක ගෙවීමට තිබෙන ශේෂයන්ය. "ජංගම නොවන වගකීම්" යනු වාර්තා කළ දින සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂයන්ය.

මෙකී මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී , දන්නා ලද සියලු බැඳියාවන් ගිණුම්ගත කරනු ලැබ තිබේ. පසුගිය සිද්ධි වල ප්‍රතිඵලයක් වශයෙන් සමාගමට සාධනීය බැඳියාවන් හෝ නෛතික බැඳියාවන් ඇති විට ප්‍රතිපාදන හා බැඳියාවන් හඳුනාගනු ලැබෙන අතර බැඳියාවන් ඉටුකිරීම වෙනුවෙන් ඇතැම්විට ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලනය වීමක් ඇතිවිය හැක .

## 3.11 විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

සමාගම සතුව නිශ්චිත ප්‍රතිලාභ මෙන්ම නිශ්චිත දායකත්ව සැලැස්ම යනුවෙන් විශ්‍රාම සැලැස්මක් තිබෙන අතර වෙනම ආයතනයක් සඳහා සමාගම නිශ්චිත දායකත්වයක් සිදුකරයි. එහෙත් සමාගම සතුව ප්‍රමාණවත් අරමුදල් , ප්‍රවර්තන හා පෙර කාල සීමා වෙනුවන් සේවකයින්ගේ සේවා වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීමට නොමැති විට ඒ සඳහා සම්මුතික හා නෛතික වශයෙන් සමාගම වගකීමෙන් බැඳී නැත .

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම විශ්‍රාම සැලසුමක් වන අතර නිශ්චිත දායකත්ව සැලසුමක් නොවේ. සාමාන්‍ය පරිදි විශ්‍රාම යාමේදී සේවකයෙකුට ලැබෙන නිශ්චිත මුදල කුමක්දැයි නිශ්චිත ප්‍රතිලාභ අරමුදලින් හැඳින්වේ . එය වයස , සේවා කාලය හා වන්දි මුදල මත තීරණය වේ .

**(අ ) නිශ්චිත දායකත්ව සැලසුම්** - සේවක අර්ථසාධක අරමුදල (E P F )
- සේවක භාර අරමුදල (E T F )

සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට සුදුසුකම් ලබන සියලු සේවකයින් ඒ ඒ ව්‍යවස්ථා සහ රෙගුලාසි අනුව අදාල දායකත්ව අරමුදල් වලින් ආවරණය වේ .

**(ආ ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂික**

විශ්‍රාම පාරිතෝෂික සම්බන්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හඳුනාගෙන ගෙන ඇති වගකීම් වනාහි වාර්තා කිරීමේ දිනය වනවිට පවතින පාරිතෝෂික බැඳියාවන්හි වටිනාකමයි. පාරිතෝෂික ගණනය කිරීමේ සූත්‍රයට අනුව ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් පාරිතෝෂික බැඳියාවන් මනිනු ලැබේ .
1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතට අනුව අවුරුදු 05 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කොට විශ්‍රාම යන සේවකයින්ට පමණක් පාරිතෝෂික ගෙවීමට සමාගම බැඳී සිටී.

වෙනත් සවිස්තරාත්මක ආදායම් තුළ ජීව ගණක ලැබීම්/පාඩු ඒවා සිදුවූ කාල සීමාව අනුව හඳුනා ගැනේ.

පාරිතෝෂිකයට, බාහිර වශයෙන් මුදල් සම්පාදනය නොකෙරේ.

## 3.12 හදිසි අවස්ථා සහ ප්‍රාග්ධන බැඳියාවන්

වාර්තා කරන දිනය වන විට පවත්න ද්‍රව්‍යමය බැඳියාවන් හා අවිනිශ්චිත වගකීම්, මූල්‍ය ප්‍රකාශන වල ඒ ඒ සටහන් වලින් හෙළිදරව් කෙරේ.

<u>විස්තීරණ ආදායම් ප්‍රකාශය</u>

## 3.13 ආදායම හඳුනාගැනීම

සමාගමට ආර්ථික ලැබීම් සහ දැරීමට ඇති ආදායම හා ආශ්‍රිත වියදම් විශ්වාසදායක ලෙස මැනිය හැකි විමසීම සම්භාවි වන තරමට ආදායම හඳුනාගැනේ. ලැබීමට ඇති හා ලැබූ ප්‍රතිෂ්ඨාවේ සාධාරණ මිල අනුව ආදායම මනිනු ලැබේ.

**(අ) යාත්‍රා ආදායම**

නැව් බඩු මෙහෙයුම් කටයුතු වලින් හා ප්‍රවාහන සේවා වලින් උත්පාදනය වන ආදායම, සේවාවන් සම්පූර්ණයෙන් ඉටුකිරිමේ පදනම මත ඒවා සපයන ලද කාල සීමා තුළදී හඳුනාගැනෙන අතර තථ්‍ය වශයෙන්ම සපයන ලද සේවා ප්‍රමාණය අනුව තක්සේරු කරනු ලැබේ.

**(ආ) නැව්කුලී ආදායම**

නැව් කුලියට දීමෙන් ලැබෙන ආදායම කාලීන කුලී ගිවිසුමට අදාළ කාලසීමාව අනුව උපචිත පදනමක් මත හඳුනාගනු ලැබේ.

**(ඇ) ඒජන්සි ගාස්තු**

සේවාවන් සම්පූර්ණ කිරිමේ පදනම මත සේවාවන් සැපයූ කාලය අනුව නියෝජ්‍ය ආයතන ගාස්තු හඳුනාගනු ලැබේ.

**(ඈ) පොලිය**

සඵල පොලී ක්‍රමය යොදාගනිමින් පොලී ආදායම හඳුනාගනු ලැබේ.

**(ඉ) වෙනත් ලැබීම් හා පාඩු**

ආයෝජන ඇතුලු දේපල, පිරියත හා උපකරණ හා අනෙකුත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලැබීම් සහ පාඩු, ලාභ සහ පාඩු වෙනුවෙන් ගිණුම් ගත කෙරෙන්නේ ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම හා ආශ්‍රිත විකුණුම් වියදම් විකිණීමෙන් ලත් මුදලින් අඩුකිරීමෙන් ඉක්බිතිවය.

**(ඊ) ලාභාංශ ආදායම**

ගෙවීම් ලැබීම් සඳහා වූ අයිතිය තහවුරු වූ පසු ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

## 3.14 වැය හඳුනාගැනීම

කාර්යක්ෂමව ව්‍යාපාරය පවත්වා ගැනීම සහ දේපල පිරියත උපකරණ නඩත්තු කිරීම සඳහා දැරූ සියලුම වියදම් වර්ෂය සඳහා වූ ලාභය හෝ පාඩුව ගණනය කිරීමේදී ආදායමට අයපත් කොට තිබේ.

## 3.15 ණයට ගැනුම් පිරිවැය

ණයට ගැනුම් පිරිවැය ඍජුවම අදාල වන්නේ වත්කමක් අත්පත් කර ගැනීම, එම වත්කමේ පිරිවැයේ කොටසක් වන සුදුසුකම් ලබන වත්කමක් ගොඩනැගීම හෝ නිෂ්පාදනය වෙනුවෙන් වූ පිරිවැයයි. අනෙකුත් ණයට ගැනුම් පිරිවැය වියදමක් ලෙස හඳුනා ගැනේ.

## 3.16 ආශ්‍රිත පාර්ශව සමග ගනුදෙනු

අයකරනු ලබන ගාස්තු පිළිබඳව තැකීමක් නොකොට මූල්‍ය හා මෙහෙයුම් තීරණ/ ප්‍රතිපත්ති මත කැපී පෙනෙන පාලනයක් හෝ බලපෑමක් ඇති කිරීම සඳහා එක් පාර්ශවයකට හැකියාව ලැබෙන ගනුදෙනු සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සිදුකොට තිබේ .

## 3.17 නව සහ සංශෝධිත ප්‍රමිති හා ඒවායේ අර්ථ දැක්වීම

### SLFRS 16 - බදු දීම

SLFRS 16 න් LKAS 17 බදු දීම් යටපත් කෙරෙන අතර කිසියම් විදිවිධානයකට බද්දක් ඇතුලත් වේද යන්න IFRIC 4 මගින් නිගමනය වේ.

SIC - 15 ක්‍රියාත්මක බදු - දිරිගැන්වීම් සහ SIC - 27 මගින් බද්දක නෛතික ස්වරූපය ඇතුලත් ගනුදෙනුවල තත්වය ඇගයීම, බද්දට අදාල හඳුනාගැනීම් මැනීම්, බදු ඉදිරිපත් කිරීම හා හෙළිදරව් කිරීම පිලිබද සිද්ධාන්ත නිර්ණය කෙරෙනුයේ ප්‍රමිතිය මගින් වන අතර එයින් ශේෂපත්‍රය ඇති බොහෝ බදුදීම් හඳුනාගැනීමට බදුගන්නා විසින් හඳුනාගැනීම අවශ්‍යවේ .

SLFRS යටතේ ගනන්දෙන බදුදෙන්නා LKAS වලින් සලකියයුතු ලෙස වෙනස් නොවී පවති. LKAS 17 දැක්වෙන මූලධර්මවලට අනුරූප ප්‍රමිත යොදාගනිමින් බදු දීමනාකරුවන් බදුදීම් ක්‍රියාත්මක හෝ මූල්‍ය සම්පාදිත බදුදීම් වශයෙන් නොකඩවා කරගෙන යති. එබැවින් සමාගම බදු දීමකාකරු වන අවස්ථාවලදී SLFRS 16 න් බදුදීම් සම්බන්ධයෙන් බලපෑමක් නොවුනි.

මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් වෙන් වෙන් හෙළිදරව් කිරීම් අවශ්‍යවන සමාගමේ මූල්‍ය ප්‍රකාශ වෙනුවෙන් මෙම ප්‍රමිතිය තුලින් වැදගත් බලපෑමක් සිදුනොවිය

සී/ස ලංකා නැව් සංස්ථාව

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | සටහන | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|---|
| 4 | ආදායම | | | |
| | යාත්‍රා ගමන් | | 597,832,869 | 1,055,883,158 |
| | නැව් බඩු ප්‍රවාහනයෙන් ලැබූ ආදායම (ස්වකීය නාවික යාත්‍රා මගින්) | | 1,425,339,909 | 1,638,808,541 |
| | තමන්ගේම නාවික යාත්‍රා කුලියට දීමෙන් ආදායම | | 587,535,533 | 592,200,642 |
| | නිෂ්කාෂණ හා ඉදිරිපත් කිරීම් | | 8,337,584 | 19,583,422 |
| | නියෝජිත ආයතන හා ඇඩ්රස් කොමිස් | | 475,573,131 | 542,878,386 |
| | | | 3,094,619,027 | 3,849,354,149 |
| 5 | වෙනත් ආදායම් | | | |
| | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලාභ | | 56,840 | 74,144 |
| | ලාභාංශ | | 192,143 | 290,117 |
| | ශුද්ධ විනිමය ලැබීම් | | 62,220,301 | 62,962,318 |
| | පොලී ආදායම - ස්ථිර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් | | 23,963,961 | 28,946,143 |
| | පොලී ආදායම - (සේවක මණ්ඩලයට ණය දීමෙන්) | | 1,465,263 | 1,773,627 |
| | ප්‍රමාද ගාස්තු අයකර ගැනීම් - ස්වකීය යාත්‍රා | | 126,681,291 | 13,549,679 |
| | ලේඛණ ගාස්තු අයකර ගැනීම් | | 5,807,139 | - |
| | වෙනත් | | 9,353,012 | 10,068,601 |
| | | | 229,739,950 | 117,664,629 |
| 6 | මෙහෙයුම්වලින් ලාභ (පාඩු) | | | |
| | පහත දැක්වෙන දෑ ඇතුළු වියදම් අයපත් කිරිමෙන් පසුව මෙහෙයුම් ලාභය (පාඩුව) සඳහන් කොට තිබේ | | | |
| | විගණකවරුන්ගේ පඩිනඩි | | 741,000 | - |
| | ක්ෂය වීම් | | 413,611,172 | 413,455,923 |
| | වෘත්තිය හා නෛතික ගාස්තු | | 637,400 | 953,910 |
| | කාර්ය මණ්ඩල පිරිවැය (සටහන 6.1) | | 153,638,941 | 160,877,024 |

### 6.1 කාර්ය මණ්ඩල පිරිවැය

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ වේතන | 1,097,000 | 225,560 |
| වැටුප් හා වේතන | 129,155,049 | 131,698,381 |
| නිශ්චිත දායකත්වය සැලසුම් පිරිවැය - (සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාර අරමුදල) | 16,860,958 | 15,501,190 |
| නිශ්චිත දායකත්වය පිරිවැය - විශ්‍රාම පාරිතෝෂික | 6,525,934 | 13,451,893 |
| | **153,638,941** | **160,877,024** |

### 7 මූල්‍ය වියදම්

| | | |
|---|---|---|
| පොලී වියදම් - යාත්‍රා ණය | (756,811,358) | (942,422,392) |
| විණිමය පාඩු | (684,460,191) | (1,009,958,492) |
| | **(1,441,271,549)** | **(1,952,380,884)** |

### 8 ආදායම් බදු වලින් ආදායම / (වියදම්)

| | | | |
|---|---|---|---|
| සාමාන්‍ය කටයුතු සඳහා බදු | 8.1 | - | |
| විලම්බිත බදු වත්කම් ප්‍රතිවර්තනය | 17 | 286,195,457.96 | 69,253,553.00 |
| උද්දේශික ලාභාංශ බද්ද | | - | - |
| | | **(286,195,458)** | **(69,253,553)** |

### 8.1 බද්දට යටත් ලාභය හා ගිණුම් ලාභය සැසඳීම

| | | |
|---|---|---|
| බද්දට පෙර ගිණුම් ලාභය | (527,125,027) | (1,085,215,556) |
| එකතු කලා : ආශ්‍රිත සමාගම් වලින් ලද ලාභාංශ | 353,122 | |
| අඩු කළා : ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස (බද්ද ඇතුළුව) | (10,185,997) | (22,100,882) |
| | (536,957,902) | (1,107,316,438) |
| ඉඩදිය නොහැකි විෂයාංග මුළු එකතුව | 1,858,902,160 | 1,360,038,189 |
| ඉඩදිය හැකි විෂයාංග මුළු එකතුව | (12,092,543) | (12,074,615) |
| ණය අපවයන් සඳහා අපවය ප්‍රතිපාදන | 161,701,680 | 268,323,431 |
| බද්දට යටත් නැති ආදායම | (24,509,226) | (29,236,260) |
| වෙළඳාම හෝ ව්‍යාපාරයෙන් ලාභ තක්සේරු කළ හැකි ආදායම | 1,447,044,169 | 479,734,307 |

| | | |
|---|---|---|
| ආයෝජන වලින් තක්සේරු කළ හැකි ආදායම | 24,509,226 | 29,236,260 |
| **එකතු කළා: බදුපොලී ආදායමට යටත් වෙනත් ආදායම්** | | |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම/ තක්සේරු ආදායම | 1,471,553,395 | 508,970,567 |
| **වර්ෂය සඳහා සාමාන්‍ය ක්‍රියාකාරකම් මත ප්‍රවර්තන බද්ද** **8** | | |

## 9 කොටසක් වෙනුවෙන් මූලික හා තනුක ඉපැයීම්

කොටසක් වෙනුවෙන් වූ ඉපැයීම් ආගණනය කෙරෙනුයේ වාර්තා කිරීමේ කාලය තුළ නිකුත් කොට ඇති සාමාන්‍ය බර තැබූ මධ්‍ය සංඛ්‍යාවෙන් සාමාන්‍ය කොටස් හිමියාට ආරෝපනය කළ හැකි ශුද්ධ ලාභයයි.

| | | |
|---|---|---|
| *ලවය වශයෙන් භාවිතා කරන ලද මුදල* | | |
| කොටස් හිමි ආරෝපිත ශුද්ධ ලාභය (රු) | (527,125,027) | (1,085,215,556) |
| *හරය වශයෙන් භාවිතා කරන ලද මුදල* | | |
| නිකුත් කොටස්වල බර තැබූ සාමාන්‍යය | 5,000,000 | 5,000,000 |
| කොටස් වෙනුවෙන් මූලික හා තනුක ඉපැයීම් (රු) | **(105.43)** | **(217.04)** |

**කොටසක් සඳහා මූලික හා තනුක ඉපැයීම්**

වාර්තා කිරීමේ කාලය තුළ නිකුත් කරනු ලබන සාමාන්‍ය කොටස් ගණනේ සාමාන්‍ය බර තැබූ සාමාන්‍ය කොටස් ධාරීන් වෙත ආරෝපනය කළ හැකි ලාභය (පාඩුව) බෙදා ගණනය කිරීමෙන් මූලික හා තනුක ඉපැයීම් (පාඩු) කොටස් අනුව ගණනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| *ලවය වශයෙන් භාවිත මුදල* | | |
| කොටස්ධාරීන් වෙත අදාළ ශුද්ධ ලාභය (පාඩුව) රු. | (527,125,027) | (1,085,215,556) |

| 10 දේපොල, පිරියත හා උපකරණ | ඉඩම් හා නිවාස ව්‍යාපෘති | ගොඩනැගිලි | යාත්‍රා | මෝටර් වාහන | ගෘහ භාණ්ඩ හා සවිකුරු | කාර්යාලීය උපකරණ හා පරිගණක | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය තක්සේරුව** | | | | | | | |
| 2020 අප්‍රේල් 1 ට ශේෂය | 5,286,340 | 43,390 | 11,235,780,363 | 37,002,095 | 21,315,011 | 23,646,516 | 11,323,073,715 |
| වර්ෂය තුළ එකතු කිරීම | - | - | - | | 994,026 | 755,640 | 1,749,666 |
| ප්‍රාග්ධන කාර්යන්ගෙන් මාරු කිරීම | - | - | | | | | |
| වර්ෂය තුළ ක්‍රියාත්මක යාත්‍රා | - | - | - | - | - | - | - |
| වර්ෂය තුළ බැහැර කිරීම | - | - | | | (1,229,664) | (1,192,607) | (2,422,271) |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | 5,286,340 | 43,390 | 11,235,780,363 | 37,002,095 | 21,079,373 | 23,209,549 | 11,322,401,110 |
| **සමුච්චිත ක්ෂය වීම්** | | | | | | | |
| 2020 අප්‍රේල් 1 දිනට ශේෂය | 1,253,056 | 43,390 | 1,601,910,329 | 31,338,104 | 13,462,509 | 19,080,048 | 1,667,087,436 |
| වර්ෂය සඳහා ගාස්තු | 8,316 | - | 408,178,758 | 2,182,782 | 1,409,966 | 1,831,350 | 413,611,172 |
| බැහැර කිරීම | - | - | - | - | (1,229,664) | (1,192,607) | (2,422,271) |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | 1,261,372 | 43,390 | 2,010,089,087 | 33,520,886 | 13,642,811 | 19,718,791 | 2,078,276,337 |

| **ශුද්ධ පොත් අගය** | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| | | රු. | රු. |
| ඉඩම් නිවාස ව්‍යාපෘති | | 4,024,968 | 4,033,284 |
| ගොඩනැගිලි | | - | - |
| යාත්‍රා | | 9,225,691,276 | 9,633,870,034 |
| මෝටර් වාහන | | 3,481,209 | 5,663,991 |
| ගෘහ භාණ්ඩ හා සවිතුරු | | 7,436,562 | 7,852,502 |
| කාර්යාලීය උපකරණ හා පරිගණක | | 3,490,758 | 4,566,468 |
| | | 9,244,124,773 | 9,655,986,279 |
| කෙරිගෙන යන වැඩ - ගොඩනැගිලි | 10.1 | 3,626,440 | 3,626,440 |
| අපවය සඳහා ප්‍රතිපාදන | | (3,626,440) | (3,626,440) |
| | 10.2 | 9,244,124,773 | 9,655,986,279 |

2021 මාර්තු 31 දින දක්වා කාලය තුල අපවය වීම සම්බන්ධයෙන් වන අභ්‍යන්තර හා බාහිර සාධක සැලකිල්ලට ගනිමින් ලංකා නැව් සංස්ථාව විසින් වාර්ෂික අපවය වීම් (impairment) පිරික්සුමක් කරන ලදී. ලංකා ගිණුම් ප්‍රමිති (LKAS) 36 හි 33 ඡේදය ප්‍රකාරව ලංකා නැව් සංස්ථාවේ සභාපති විසින් පත්කරන ලද වෘත්තිකයින්ගෙන් සමන්විත, නැව් සංස්ථාවේ අභ්‍යන්තර කමිටුවක් විසින් 2021 මාර්තු 31 දිනට නාවික යාත්‍රා වලින් අයකර ගත හැකි මුදල් ,ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රවාහ ආශ්‍රය කර ගනිමින් භාවිත වටිනාකම පදනමින් ගණනය කිරීමේ ක්‍රමය මත තීරණය කරන ලදී.

"ලක්විජය" බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහණය කිරීම සඳහා නාවික යාත්‍රා ක්‍රියාත්මක වන කාල සීමාව හා නාවික යාත්‍රා ක්‍රියාත්මක කිරීමේ වියදම් සඳහා ප්‍රක්ෂේපිත වෙළඳපොල ප්‍රවාහණය පදනම් කරගෙන විවෘත වෙළඳපොලේ අනාගත කුලී අනුප්‍රමාණ හා කාලීන කුලී සාමාන්‍යයන් (TCE) පිළිබඳ ඇස්තමේන්තු හා අනාගත බලාපොරොත්තු හා ඵතිහාසික හා චක්‍රීය ප්‍රවනාතාවන් පදනම් කරගනිමින් නාවික යාත්‍රාවල භාවිත වටිනාකම ගණනය කිරීමේදී සමාගම උපකල්පනයන් සිදුකොට ඇත. මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපණයන්ට අදාල කරගත් බද්දට පෙර වට්ටම 5.45% කි. Clarkson Shipping Intelligence Weekly (CSLW) අනුව වියලි තොග නැව් සඳහා 2020 ලිත් වර්ෂය වෙනුවෙන් මෙ.ටොන් එකකට එ.ජ. ඩොලර් 610 බැගින් වූ අවිධිමත් සාමාන්‍ය මිලක් (average scrap price) භාවිතා කරමින් ශේෂ අගයන් තක්සේරු කරන ලදී.

සී/ස ලංකා නැව් සංස්ථාව

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

මාර්තු 31 දිනට

| | | සටහන් | 2021 රු. | 2020 රු. |
|---|---|---|---|---|
| 10.1 | කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ - ගොඩනැගිලි | | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | | 3,626,440 | 3,626,440 |
| | වර්ෂය අවසානයේ ශේෂය | 10 | 3,626,440 | 3,626,440 |
| 10.2 | ස්ථාවර වත්කම්වල ඉදිරියට ගෙනයන වටිනාකම | | | |
| | පිරිවැය අනුව | | 9,240,124,773 | 9,651,986,279 |
| | තක්සේරු කිරීම් අනුව | | 4,000,000 | 4,000,000 |
| | | 10 | 9,244,124,773 | 9,655,986,279 |

ඉඩම් හා ගොඩනැගිලි 1994 ජුලි මස රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නැවතත් තක්සේරු කරන ලදී. ඉඩම් හා ගොඩනැගිලි අදාල ගැලපුම් සහිතව ඒවායේ උපරිම භාවිත තත්වයන් අනුව විවෘත වෙලදපොලේ වටිනාකම් පදනම් කරගෙන තක්සේරු කරන ලදී. විලම්බිත බද්ද ඇතුළු තක්සේරුවේ ප්‍රතිපල, ප්‍රත්‍යාගණන සංචිතය තුල හදුනාගන්න ලදී.

| | | 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| 10.3 | ක්ෂයවීම් අඩුකිරිමෙන් ඉක්බිතිව වත්කම් ඉදිරියට ගෙන යන ලද්දේ නම් මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කිරීමට ඉඩ තිබූ ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල ඉදිරියට ගෙන යන වටිනාකම: | | |
| | පිරිවැය | 1,120,000 | 1,120,000 |
| | සමුච්චිත ක්ෂයවීම් | (1,120,000) | (1,120,000) |
| | ඉදිරියට ගෙන යන වටිනාකම | - | - |

රුපියල් 16,704,617 (2015 දි රු.13,269,081) ක් වූ දේපොල, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂයගත කරන ලද අතර සමාගමේ ප්‍රයෝජනය සඳහා එසේම තිබෙන්නට හරින ලදී.

**11** කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ - යාත්‍රා

| | සිලෝන් බ්‍රීස් යාත්‍රාව රු. | සිලොන් ප්‍රින්සස් යාත්‍රාව රු. | මුළු මුදල රු. |
|---|---|---|---|
| පිරිවැය | | | |
| 2016 අප්‍රේල් 1 වැනි දිනට ශේෂය | - | - | - |
| වර්ෂයය තුළ එකතු කිරීම් | - | - | - |
| ණයට ගැනුම් පිරිවැය | - | - | - |
| දේපොල, පිරියත හා උපකරණ වලට වූ මාරු කිරීම් | - | - | - |
| ශේෂය 2017 මාර්තු 31 දිනට | - | - | - |

සාමාන්‍ය ණයට ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිකරණ අනුපාතය - 15.59% (2015 -10.91%) මාර්තු 31 දිනට.

| | | 2021 | 2020 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 12 | අස්පෘශ්‍ය වත්කම් : | | |
| | පරිගණක මෘදුකාංග | | |
| | පිරිවැය | | |
| | වර්ෂය ආරම්භයේදී ශේෂය | 6,144,497 | 6,144,497 |
| | වර්ෂය අවසානයේදී ශේෂය | 6,144,497 | 6,144,497 |
| | සමුච්චිත ක්‍රමක්ෂය | | |
| | වර්ෂය ආරම්භයේදී ශේෂය | 6,144,497 | 6,144,497 |
| | වර්ෂය අවසානයේදී ශේෂය | 6,144,497 | 6,144,497 |
| | මාර්තු 31 දිනට කපාහැරි වටිනාකම | - | - |

13 පරිපාලිත සමාගම්වල ආයෝජන

| | කොටස් සංඛ්‍යාව | ධාරිතා ප්‍රතිශතය | | |
|---|---|---|---|---|
| සී/ස සිලෝන් ෂිපිං එජන්සි (පෞද්) | 9,999 | 100% | 99,990 | 99,990 |
| හානිය සඳහා ප්‍රතිපාදන | | | (99,990) | (99,990) |
| | | | - | |

උපකාරක සමාගම් වසාදැමීම සඳහා 2006 මාර්තු 20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගන්නා ලද තීරණයේ ප්‍රතිඵලයක් වශයෙන් උපකාරක සමාගමේ මූල්‍ය ප්‍රකාශ සමාගම විසින් ඒකාබද්ධ නොකරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයෙන් ඉක්බිතව 2006 මැයි මස සිට උපකාරක සමාගම්වල කටයුතු නතර විය. දැනට උපකාරක සමාගම් ඈවර කෙරෙමින් පවතී.

14 ආශ්‍රිත සමාගම්වල ආයෝජන

ස්කන්ධ ක්‍රමය අනුව ඉදිරියට ගෙන යන වත්කම්

| | | |
|---|---|---|
| සී/ස සිලොන්ෂිපිං ලයින්ස් (පුද්.) | 303,274,506 | 293,167,807 |
| සී/ස සිලොන් ෂිපිං එජන්සි (පුද්.)-සිංගප්පූරුව | 84,202,357 | 79,363,571 |
| | **387,476,863** | **372,531,378** |

| | | | 2021 | 2020 |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| **14.1** ආශ්‍රිත සමාගම්වල ආයෝජන පිරිවැය | | | | |
| | කොටස් ගණන | ධාරිත්ව ප්‍රතිශතය | | |
| සී/ස සිලෝන් ෂිපිං ලයින්ස් (පුද්.) සමාගම | 156,942 | 39% | 1,569,420 | 1,569,420 |
| සී/ස සිලෝන් ෂිපිං එජන්සි (පුද්.) සමාගම සිංගප්පූරුව | 24,500 | 49% | 143,622 | 143,622 |
| | | | 1,713,042 | 1,713,042 |

**14.2** ස්කන්ධ ක්‍රමය අනුව ආශ්‍රිත සමාගම්වල ආයෝජන සංචලන ශුද්ධ වත්කම්වල ආයෝජකගේ කොටස

| | | |
|---|---|---|
| වර්ෂය ආරම්භයේදී ශේෂය | 372,531,378 | 350,473,519 |
| ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස (බදු ඇතුළුව) | 10,185,997 | 22,100,882 |
| ආශ්‍රිත සමාගම්වල වෙනත් විස්තීරණ ආදායම් කොටස (බදු සහිත) | 5,112,610 | 310,099 |
| ලාභාංශ ආදායම | (353,122) | (353,122) |
| වර්ෂ අවසානයේ ශේෂය | 387,476,863 | 372,531,378 |

**14.3** ආශ්‍රිත සමාගම්වල සංක්ෂිප්ත මූල්‍ය තොරතුරු

| | සී/ස සිලෝන් ෂිපිං ඒජන්සි (පෞද්) සමාගම - සිංගප්පූරුව | | සී/ස සිලෝන් ෂිපිං ලයින්ස් (පෞද්) සමාගම | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2020** | **2019** | **2020** | **2019** |
| මුළු වත්කම් | 231,075,820 | 265,933,862 | 927,295,210 | 925,944,606 |
| මුළු වගකීම් | 51,771,935 | 96,505,049 | 97,378,078 | 122,847,529 |
| ශුද්ධ වත්කම් | 179,303,885 | 169,428,813 | 829,917,132 | 803,097,078 |
| ආදායම | 701,782,376 | 864,388,724 | 352,997,880 | 490,132,018 |
| මෙහෙයුම් වියදම් | 705,302,230 | 856,368,199 | 399,903,380 | 496,839,651 |
| වෙනත් ආදායම් | 5,019,383 | 202,452 | 50,350,444 | 26,628,274 |
| වර්ෂය සඳහා ලාභය | 1,499,529 | 8,222,977 | 24,233,919 | 46,337,494 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | - | - | 2,586,136 | (951,605) |

**15** මූල්‍ය සාධන පත්‍ර

මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ මූල්‍ය වගකීම්

මූල්‍ය වත්කම්වල සහ මූල්‍ය බැදියාවන්හි ඉදිරියට ගෙන යන වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන් තුළ පහත සඳහන් පරිදි වේ.

මූල්‍ය වත්කම් සහ වගකීම්වල ඉදිරියට ගෙන යන වටිනාකම

15.1 මූල්‍ය වත්කම්

15.1.1 විකිණීමට ඇති

| | | | |
|---|---|---|---|
| ලැයිස්තුගත ආයෝජන | 16.1 | 17,243,984 | 11,281,334 |
| ලැයිස්තුගත නොවූ ආයෝජන | 16.2 | 2,377,070 | 2,377,070 |
| | | 19,621,054 | 13,658,404 |

ලැයිස්තුගත ආයෝජන ගණනය කරනු ලබන්නේ සක්‍රිය වෙළඳපොළේ ලැයිස්තුගත මිල පදනම් කරගත් සාධාරණ මිල අනුවය. ලැයිස්තුගත නොවූ ආයෝජනවල සාධාරණ මිල ස්ථිරසාර ලෙස පිරිවැය අනුව ගණනය කළ නොහැකි බැවින් හානිකරණය වීම සඳහා වූ ප්‍රතිපාදන අඩුකොට ආගණනය කෙරේ.

15.1.2 කල් පිරීම සඳහා තැබූ ආයෝජන

| | | | |
|---|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන | 20 | 120,615,896 | 143,997,433 |

කල්පිරීම සඳහා තබා ඇති ආයෝජන මනිනු ලබන්නේ පොලී ලැබීම් නියමිත ඇතුළත් කිරීම් සහිතවය.

15.1.3 ණය සහ ලැබිය යුතු දේ

| | | | |
|---|---|---|---|
| වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත | 18 | 984,461,402 | 2,325,941,430 |
| කෙටිකාලීන ආයෝජන | 21 | 24,839,609 | 24,107,923 |
| මුදල් හා මුදල් සාමානයන් | 22 | 847,663,133 | 479,509,131 |
| | | 1,856,964,145 | 2,829,558,484 |

ණය සහ ලැබීම් නියමිත, ඒවායේ ඉදිරියට ගෙන යන වටිනාකම අනුව සඳහන් කෙරෙනුයේ, ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම සාධාරණ අගයට ආසන්න වන හෙයිනි.

| | | | |
|---|---|---|---|
| මුළු මූල්‍ය වත්කම් | | 1,997,201,095 | 2,987,214,321 |

### 15.2 මූල්‍ය බැරකම්

| | | | |
|---|---|---|---|
| වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත | 30 | 831,978,507 | 1,618,262,436 |
| මුළු මූල්‍ය බැරකම් | | **831,978,507** | **1,618,262,435** |

මූල්‍ය බැරකම්, ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම අනුව සඳහන් කෙරෙනුයේ ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම සාධාරණ අගයට ආසන්න වන බැවිනි.

## 16 විකිණීමට ඇති මූල්‍ය වත්කම්

| | | | |
|---|---|---|---|
| ලැයිස්තුගත ආයෝජන | **16.1** | 17,243,984 | 11,281,334 |
| ලැයිස්තුගත නොවූ ආයෝජන | **16.2** | 2,377,070 | 2,377,070 |
| | | **19,621,054** | **13,658,404** |

### 16.1 ලැයිස්තුගත ආයෝජන

| | | | |
|---|---|---|---|
| වර්ෂය ආරම්භයේදී ශේෂය | | 11,281,334 | 16,623,868 |
| සාධාරණ අගය වෙනස්වීම් මත පාඩු | | 5,962,650 | (5,342,534) |
| වර්ෂය අවසානයේදී ශේෂය | 16 | 17,243,984 | 11,281,334 |

| | | 2021 | | 2020 | |
|---|---|---|---|---|---|
| | කොටස් ගණන | පිරිවැය | වෙළඳපොළ | පිරිවැය | වෙළඳපොළ |
| | | රු. | වටිනාකම රු. | රු. | වටිනාකම රු. |
| මර්කන්ටයිල් ෂිපිං කම්පනි | 238,506 | 2,068,800 | 17,243,984 | 2,068,800 | 11,281,334 |

### 16.2 ලැයිස්තුගත නොවූ ආයෝජන

ලැයිස්තුගත නොවූ ආයෝජනවල සාධාරණ අගය විශ්වසනීයව ගණනය කළ නොහැකි බැවින් හානිකරණ පාඩු අඩුකොට පිරිවැය අනුව සඳහන් කරන ලදී.

| | සටහන් | 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| | කොටස් ගණන | | |
| සී/ස ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | 31,206 | 312,060 | 312,060 |
| සිලොන් පෝර්ට් සර්විසස් ලිමිටඩ් | 5,000 | 50,000 | 50,000 |
| සී/ස ලංකා පෝර්ට් මැනේජ්මන්ට් ඇන්ඩ් කන්සල්ටන්සි | 1,501 | 15,010 | 15,010 |
| සී/ස ලංකා කෝල් කම්පනි (පෞද්.) සමාගම | 200,000 | 2,000,000 | 2,000,000 |
| | 16 | 2,377,070 | 2,377,070 |

## 17 විලම්බිත බදු වත්කම් (බැදියාවන්)

| | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| වර්ෂය ආරම්භයේදී ශේෂය | | 478,648,007 | 547,901,560 |
| වර්ෂය තුළ ප්‍රත්‍යාවර්තන | 8 | | |
| වර්ෂය තුල | | (286,195,458) | (69,253,553) |
| වර්ෂය අවසානයේ ශේෂය | 17.1 | **192,452,549** | **478,648,007** |

වත්කම්වල හා වගකීම්වල ඉදිරියට ගෙනයන වටිනාකම් සහ වත්කම් හා වගකීම්වල බදු පදනමේ ඉදිරියට ගෙනයන වටිනාකම අතර තාවකාලික වෙනස්කම් මත විලම්භිත බද්ද හදුනාගනු ලබන අතර 24% සඵල පොලී අනුපාතය අනුව ගණනය කරනු ලැබේ.

### 17.1 බදුවත්කම් හා වගකීම්වල විලම්බිත බදු විශ්ලේෂණය

| | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| **විලම්බිත බදු වගකීම්** | | | |
| ක්ෂය ගත කිරීම් කඩිනම් කිරීම මගින් | | (2,215,379,794) | (2,313,523,583) |
| | | (2,215,379,794) | (2,313,523,583) |
| **විලම්බිත බදු වත්කම්** | | | |
| බදු පාඩුවලින් | | 2,364,498,212 | 2,717,671,026 |
| හානිය සඳහා ප්‍රතිපාදන | | 33,636,613 | 64,397,623 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදියාවන්ගෙන් | | 9,697,518 | 10,102,941 |
| | | 2,407,832,343 | 2,792,171,590 |
| | 17 | 192,452,549 | 478,648,007 |

විලම්භිත බදු වත්කම් විශ්‍රාම ප්‍රතිලාභ බැදියාවන් උදෙසා ප්‍රතිපාදන වශයෙන් ද සෙසු ලැබීම් අපවය ප්‍රතිපාදන සඳහා ද හඳුනාගැනෙන අතර ඉදිරියට ගෙනයන බදු අහිමිවීම් බද්දට යටත් ලාභ සම්භාවිචන තරමට උපලබ්ධි කෙරෙන අතර විලම්භිත බදු බැදියාවන් ක්ෂය කිරීම් හා ප්‍රත්‍යාගණන අතිරික්ත ත්වරණය කිරීම් සඳහා හඳුනා ගනු ලැබේ.

| | සටහන | 2021 | 2020 |
|---|---|---|---|
| **18** වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත | | රු. | රු. |
| වෙළඳ ලැබීම් නියමිත | 18.1 | 848,370,068 | 2,199,742,282 |
| තැන්පතු හා අත්තිකාරම් | 18.2 | 20,020,967 | 18,350,308 |
| කාර්ය මණ්ඩල ලැබීම් නියමිත | 18.3 | 55,042,036 | 52,540,792 |
| අනෙකුත් ලැබීම් නියමිත | 18.4 | 61,028,331 | 55,308,048 |
| | | 984,461,402 | 2,325,941,430 |

**18.1** වෙළඳ ලැබීම් නියමිත

| | | 2021 | 2020 |
|---|---|---|---|
| වෙළඳ ලැබීම් නියමිත | | 1,829,796,029 | 3,049,370,999 |
| වෙළඳ පාලන ගිණුම (දේශීය) | | 28,316,889 | 19,961,580 |
| ගල් අඟුරු ගනුදෙනු පාලන ගිණුම | | 283,199 | 283,199 |
| හානිය සඳහා ප්‍රතිපාදන | | (1,010,026,050) | (869,873,496) |
| | 18 | 848,370,068 | 2,199,742,282 |

වෙළඳ ලැබියයුතු දේ තුළ සම්බන්ධිත පාර්ශව වලින් ලැබෙන පහත දැක්වෙන ලැබීම් නියමිත අඩංගුය

<u>සම්බන්ධිත පාර්ශව වලින් ලැබීම් නියමිත</u>

| | 2021 | 2020 |
|---|---|---|
| රාජ්‍ය ආයතන | 217,806,005 | 243,243,702 |

වෙළඳ ලැබීම් වලට නියමිත කාලසීමා පහත දැක්වේ

<u>වෙලඳ ලැබීම් වලට නියමිත කාලසීමා</u>

| | 2021 | 2020 |
|---|---|---|
| එක් අවුරුද්දක් දක්වා | 733,865,504 | 1,931,374,657 |
| අවුරුදු 1-4 දක්වා | 346,677,041 | 523,088,212 |
| අවුරුදු 4 ට වැඩි | 749,253,484 | 585,908,130 |
| | 1,829,796,029 | 3,049,370,999 |

වෙළඳ ලැබීම් නියමිත, අපවයවීම් වෙනුවෙන් සමාලෝචනය කරන ලදී. ඇතැම් වෙළඳ ලැබීම් නියමිත අපවය වී ඇති බව පෙනුනි. එවැනි අපවයවීම් සඳහා 3.9.1 සටහන පරිදි පතිපාදන සලසන ලදී.

වෙලඳ ලැබීම් වෙනුවෙන් සලසන ලද ප්‍රතිපාදන
විස්තර

| | 2021 | 2020 |
|---|---|---|
| **විශේෂිත අපවයවීම්** | | |
| රජයේ ආයතන | 36,206,870 | 36,206,870 |
| විදේශීය නියෝජිතයන් | 64,024,592 | 64,024,592 |
| පෞද්ගලික ආයතන | 44,083,601 | 44,083,601 |
| වෙනත් | 31,944,098 | 31,944,098 |
| සාමුහික හානිය | 833,766,889 | 693,614,335 |
| | 1,010,026,050 | 869,873,496 |

| | සටහන් | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|
| **18.2** තැන්පතු හා අත්තිකාරම් | | | |
| බහාලුම් තැන්පතු | | 18,554,346 | 13,642,255 |
| වෙනත් ආපසු ගෙවිය යුතු තැන්පතු | | 6,124,052 | 6,042,809 |
| අත්තිකාරම් | | 3,671,478 | 6,994,154 |
| | | 28,349,877 | 26,679,218 |
| හානිය සඳහා ප්‍රතිපාදන | | (8,328,910) | (8,328,910) |
| | 18 | 20,020,967 | 18,350,308 |
| **18.3** කාර්යමණ්ඩල ලැබීම් නියමිත | | | |
| කාර්යමණ්ඩල ණය | | 51,789,854 | 51,092,349 |
| අත්තිකාරම් සහ වෙනත් | | 3,252,182 | 1,448,442 |
| | | 55,042,036 | 52,540,792 |
| **18.4** අනෙකුත් ලැබීම් නියමිත | | | |
| ඇප සහතික වූ අලුත්වැඩියා ලැබීම් නියමිත | | 19,839,635 | 19,839,635 |
| භාණ්ඩාගාරයේ ඇති රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත මුදල් | | - | - |
| වෙනත් | | 64,490,507 | 58,770,223 |
| | | 84,330,142 | 78,609,858 |
| හානිය සඳහා ප්‍රතිපාදන | | (23,301,810) | (23,301,810) |
| | | 61,028,331 | 55,308,048 |

**19** ව්‍යවස්ථාපිත ලැබීම් නියමිත

18

| | | |
|---|---|---|
| රඳවා ගැනීමේ බද්ද | 8,464,489 | 8,472,050 |
| භාණ්ඩ හා සේවා බද්ද | 18,936,777 | 18,936,777 |
| හානිය සඳහා ප්‍රතිපාදන | (18,936,777) | - |
| ජාතික ආරක්ෂක බද්ද | 2,612,349 | 2,612,349 |
| හානිය සඳහා ප්‍රතිපාදන | (2,612,349) | - |
| ද්විත්ව බදු | 2,141,662 | 2,141,662 |
| | 10,606,151 | 32,177,013 |

| | | සටහන් | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|---|
| 20 | කල් පිරීම සඳහා තබා ඇති ආයෝජන | | | |
| | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන | | 120,615,896 | 143,997,433 |
| 21 | කෙටිකාලීන ආයෝජන | | | |
| | ස්ථිර තැන්පතුවල ආයෝජන | 21.1 | 1,945,051 | 1,890,429 |
| | මහා භාණ්ඩාගාරයේ අතිරික්ත අරමුදල | | - | 57,019 |
| | රාජ්‍ය උකස් ආයෝජන බැංකුව - කාර්යමණ්ඩල ණය | | 22,894,559 | 22,160,475 |
| | | | 24,839,609 | 24,107,923 |

**21.1** ස්ථිර තැන්පතු ආයෝජන

| | | 2021 | 2020 |
|---|---|---|---|
| ලංකා බැංකුව | | 1,310,700 | 1,310,700 |
| කොමර්ෂල් බැංකුව (PLC) | | 35,000 | 35,000 |
| කොමර්ෂල් බැංකුව (PLC) ආරක්ෂණ හා නිවාස ණය | | 599,351 | 544,729 |
| | 21 | 1,945,051 | 1,890,429 |

**22** මුදල් හා මුදල් සාමාන්‍යන්

| | 2021 | 2020 |
|---|---|---|
| අත ඇති මුදල් | 77,090 | 91,967 |
| බැංකුවේ ඇති මුදල | 847,586,043 | 179,417,163 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා ශේෂය | 847,663,133 | 479,509,131 |

**23** ප්‍රකාශිත ප්‍රාග්ධනය

*නිකුත් කළ හා සම්පූර්ණයෙන් ගෙවූ*

| | 2021 | 2020 |
|---|---|---|
| එකක් රු.10 බැගින් වූ කොටස් 5,000,000 ක් | 50,000,000 | 50,000,000 |

**24** කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය

ප්‍රාග්ධන දායකත්වය, කාරක ප්‍රාග්ධනය, අත්තිකාරම් හා නව මඟී පර්යන්ත සඳහා ආයෝජන වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් මෙයින් නියෝජනය වේ.

**25** ප්‍රාග්ධන සංචිතය

මෙයින් දැක්වෙන්නේ ASTARSA ණය සහ මහජන බැංකුවෙන් ලබා ගන්නා ලද භාණ්ඩාගාර ඇප සහතික ණය වෙනුවෙන් මහභාණ්ඩාගාරය විසින් සමාගම වෙනුවෙන් කරන ලද නිරවුල් කිරීමය.

26 ප්‍රත්‍යාගණන සංචිතය

1994 දී සිදු කරන ලද තක්සේරුව ප්‍රකාරව දේපොළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වන ප්‍රත්‍යාගණන අතිරික්තයට ප්‍රත්‍යාගණන සංචිතය සම්බන්ධතාවක් දක්වයි. ප්‍රත්‍යාගණන කරන ලද එක් එක් වත්කම් හඳුනා නොගත් විට ප්‍රත්‍යාගණන අතිරික්තය රඳවා ගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ.

| | සටහන් | 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| **28 දිගු කාලීන ණයට ගැනීම්** | | | |
| මහජන බැංකුව - යාත්‍රාණය | 28.1 | 11,283,156,548 | 11,527,755,000 |
| මහජන බැංකුව - පොලී ප්‍රාග්ධනීකරණ ණය | 28.2 | 856,541,371 | 906,528,858 |
| | | **12,139,697,919** | **12,434,283,858** |

**28.1 මහජන බැංකුව - යාත්‍රා ණය**

| | සටහන් | 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| වර්ෂය ආරම්භයේ ශේෂය | | 12,336,045,000 | 11,411,082,000 |
| වර්ෂය තුළ ගෙවීම් | | (705,093,752) | |
| විණිමය පාඩු | | 577,315,750 | 924,963,000 |
| | | 12,208,266,998 | 12,336,045,000 |
| වසරක් තුළ ආපසු ගෙවිය යුතු | 31 | 925,110,450 | 808,290,000 |
| අවුරුද්දකින් පසුව නැවත ගෙවිය යුතු | 28 | 11,283,156,548 | 11,527,755,000 |

මුළු මුදල සහ කාලසීමාවන් ආවරණය වන පරිදි ඇප සහතිකයක් භාණ්ඩාගාරයෙන් ලබා දී ඇත.

**28.2 මහජන බැංකුව - පොලී ප්‍රාග්ධනීකරණ ණය**

| | සටහන් | 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| වර්ෂය ආරම්භයේ ශේෂය | | 906,528,858 | 838,556,858 |
| විණිමය පාඩු | | 45,173,353 | 67,972,000 |
| වර්ෂය අවසානයේ ශේෂය | | 951,702,211 | 906,528,858 |
| වසරක් තුළ ආපසු ගෙවිය යුතු | 31 | **95,160,840** | - |
| අවුරුද්දකින් පසුව නැවත ගෙවිය යුතු | 28 | **856,541,371** | **906,528,858** |

මුළු මුදල සහ කාලසීමාව ආවරණය වන පරිදි ඇප සහතිකයක් භාණ්ඩාගාරයෙන් ලබා දී ඇත.

**29 විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවන් - පාරිතෝෂික**

| | සටහන් | 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| වර්ෂය ආරම්භයේදී ශේෂය | | 42,095,585 | 35,486,499 |
| වර්ෂය සඳහා ප්‍රතිපාදන | 29.1 | 6,525,934 | 13,451,893 |
| | | 48,621,519 | 48,938,392 |
| ගෙවිය යුතු පාරිතෝෂික | | (773,500) | |
| වර්ෂය තුළදී කරන ලද ගෙවීම් | | (7,441,695) | (6,842,807) |
| වර්ෂය අවසානයේදී ශේෂය | | **40,406,325** | **42,095,585** |

| 29.1 වර්ෂය සඳහා ප්‍රතිපාදන | සටහන් | 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| ප්‍රවර්තන සේවා පිරිවැය | | 2,320,215 | 2,136,515 |
| වර්ෂය සඳහා පොලී ගාස්තු | | 1,539,248 | 1,727,690 |
| ජීවගණක උපකල්පන වෙනස්වීම් නිසා උද්ගත වූ පාඩු | | 2,666,471 | 9,587,688 |
| | 29 | 6,525,934 | 13,451,893 |
| භාවිතා කරන ලද ප්‍රධාන උපකල්පන පහත දැක්වේ. | | | |
| වට්ටම් සාධකය | | 4.50% | 6.00% |
| අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීම් | | 1.11% | 1.11% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය | | 5.13% | 6.80% |
| විශ්‍රාම වයස | | අවුරුදු 60 | අවුරුදු 60 |

මෙම උපකල්පන, විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවන් කොතෙක්දැයි යන්න නිශ්චය කරගනු සඳහා කළමණාකාරිත්වය විසින් යොදාගත් විචල්‍යන්ගේ ප්‍රශස්ත ඇස්තමේන්තු පදනම් කරගෙන මෙම උපකල්පන ගොඩනගන ලදී. දිගුකාලීන රජයේ බැඳුම්කර වල වෙළඳපොළ අනුපාත පදනම් කරගෙන වට්ටම් සාධකය තීරණය කරන ලදී.

## 30 වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත

| | | |
|---|---|---|
| වෙළඳ ගෙවීම් නියමිත | 502,049,215 | 1,161,351,942 |
| තැන්පතු | 5,472,748 | 4,980,684 |
| ගෙවිය යුතු ණය පොලී | 111,746,281 | 149,519,734 |
| වෙනත් | 212,710,263 | 302,410,075 |
| | 831,978,507 | 1,618,262,436 |

## 31 කෙටි කාලීන ණයට ගැණුම්

| | | |
|---|---|---|
| මහජන බැංකුව - යාත්‍රා ණය | 1,020,271,290 | 808,290,000 |

## 32 ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත

| | | |
|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | - | 9,010 |
| ආදායම් බද්ද | 9,665,215 | 9,665,215 |
| මුද්දර ගාස්තු | 31,699 | 30,974 |
| එකතු කළ අගය මත බද්ද (VAT) | 62,871,983 | 66,473,609 |
| භාණ්ඩ හා සේවා බද්ද | 1,262 | 1,262 |
| | 72,570,160 | 76,180,071 |

## 33 උපචිත වියදම්

| | | |
|---|---|---|
| උපචිත වියදම් | 29,208,766 | 26,533,844 |

සී/ස ලංකා නැව් සංස්ථාව

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

**2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**34. අවිනිශ්චිත බැඳියාවන්**

සාමාන්‍ය කටයුතු කරගෙන යාමේදී උද්ගත වූ නෛතික හිමිකම් පෑම් හැරුනු විට මූල්‍ය ප්‍රකාශයන්හි සිරු මාරු කිරීම් හෝ හෙලිදරව් කිරීම් අවශ්‍ය වූ සැලකිය යුතු අනිශ්චිත බැඳියාවන්, වාර්තා කිරීමේ අවසාන දිනයට නොවිය.

මෙකී හිමිකම් පෑම් සාධාරණීකරණය කල නොහැකි ඒවා බවත් ඒවා නිරවුල් කිරීමට යාම වෙනුවෙන් සමාගමේ සම්පත් වැයවීමේ සම්භාවිතාවක් නොමැති බව පෙනියන බව කළමනාකාරිත්වයේ අදහසයි. මෙම අගැයීම සමාගමේ නීති අංශයෙන් ලද උපදෙස්වලට අනුකූල වේ. ඒ අනුව පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ප්‍රතිපාදන සැලසීමක් සිදු නොකෙරුණි.

1. 2011 වර්ෂයේදී ලංකා මහපොල නෞකාව, M/S Triple “S” Shipping Ltd. ආයතනයට කුලියට දෙන ලදී. එකී සමාගම විසින් කිප වතාවක් කුලිය ගෙවන ලද නමුත් එකී කුලී ගෙවීම ඉන්පසු පැහැර හැරියේය. ඉන් ඉක්බිතිව එම නෞකාව නිසිපරිදි ආපසු භාරදීමක්වත් නැවේ කාර්ය මණ්ඩලයට වැටුප් වශයෙන් ගෙවීමට ඇති අති විශාල මුදලක් සහ මෙහෙයුම් වියදම්ද නොගෙවා කෙන්යාවේ මොම්බාසා වරායේ අතහැර දමා ගොස් තිබුණු අතර මෙම නැව, නාවික අධිකාරින් විසින් අත් අඩංගුවට ගෙන තිබේ. M/S Triple Shipping Ltd, ආයතනයන් අයවිය යුතු සියලු මුදල් අයකර ගැනීම පිණිස ඔවුන් සමග අත්සන් කල කුලී ගිවිසුම අනුව තීරක නඩු තීන්දුවකට යොමුවීම සඳහා කටයුතු ආරම්භ කොට තිබෙන අතර එහි කටයුතු කෙරෙමින් පවතී. පැමිණිලිකාර පාර්ශවයේ සාක්ෂි ලබා ගැනීම අවසන්වී ඇති අතර ප්‍රධාන වග උත්තරකරුගේ සාක්ෂි ලබා ගැනීම ආරම්භ කොට තිබේ. පාර්ශ්ව දෙකේම සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා ජාතික තීරක නඩු මධ්‍යස්ථානයේදී (National Arbitration Centre) 2021.01.25 දින නඩුව විභාගවීම සිදු කෙරිනි. මීට ඉහත දී මේ සඳහා පත්කරනු ලැබ සිටි තීරකවරයා මෙහිදි ප්‍රකාශ කලේ හෙතෙම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති වශයෙන් පත් කරනු ලැබ තිබෙන බවත් මෙම නඩුවේ හිමිකම් ඉල්ලුම්කරු (claimant) රජය සතු සමාගමක් වන හෙයින් හා එකී හිමිකම් ඉල්ලීම රාජ්‍ය සේවා කොමිෂමට යොමු කෙරෙන්නේ නම් එයින් ගැටුම්කාරි තත්වයකට තුඩුදිය හැකි බවත්ය. ඒ අනුව තීරකවරයා ඉහතකී තීරක නඩුවෙන් ඉවත්විය. ඒ අනුව Triple “S” Shipping සමාගමේ ප්‍රතිචාරක් නොවූ හෙයින් අප විසින් තීරකවරුන් දෙදෙනෙක් නම් කරන ලද අතර ඔවුනට ඒබව ලියාපදිංචි තැපැලෙන් දන්වන ලදි. ඊළඟ පියවර වන්නේ එකී දැනුම්දීමේ නොතිසියේ සඳහන් පරිදි නව තීරකවරයෙකු පත්කර ගැනිම සඳහා තීරක පනතේ විධිවිධාන පරිදි ඉදිරියට කරගෙන යාමය. තීරක පනතේ අංක 9 සහ 7 වැනි වගන්ති වලින් දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව මහාධිකරණය විසින් තීරකවරයෙකු පත්කිරිම සඳහා පෙත්සමක් හා දිවුරුම් ප්‍රකාශයක් මහාධිකරණයට ඉදිරිපත් කරන ලදි. එකී අයදුම්පත මහාධිකරණය විසින් ලියාපදිංචි කිරිමට නියමිතය.

2. Lanka Coal සමාගමට (LCC Pvt Ltd) ගල් අඟුරු සැපයීම පිණිස ඉන්දියාවේ මුම්බායි හි M/S Taurian Iron & Steel (TISC) සමග ලංකා නැව් සංස්ථාව ගිවිසුමකට එළඹුනි. “ලංකා ගල් අඟුරු සමාගම” වූ කලී ලංකා විදුලිබල මණ්ඩලයේ පුත්තලම “ලක්විජය” තාප බලාගාරයට ගල් අඟුරු මිලදී ගන්නා ආයතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගල් අඟුරුවල තත්ත්වය පිළිබඳව කරන ලද පැමිණිල්ලකට අනුව (TISC) සමාගමෙන් ගල් අඟුරු සැපයීම නවතා දමන ලදි. කෙසේ නමුත් මේ සුහදශිලිව මෙම කරුණ විසඳා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් දෙන ලද උපදෙස් අනුව අමාත්‍ය මණ්ඩලය විසින් කමිටුවක් පත් කරනු ලැබ තිබේ. ඒ අනුව කමිටුව විසින් වාර්තාවක් පිළියෙල කර ඉදිරි කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කොට තිබේ.

අනෙක් අතට රේඛීය අමාත්‍යාංශය විසින් එකී වාර්තාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට ප්‍රථම ලංකා විදුලිබල මණ්ඩලයේ හා ලංකා ගල් අඟුරු සමාගමේ සමාලෝචනය හා නිර්දේශ පිණිස ඉදිරිපත් කොට ඇත. දැනුම් දී ඇති පරිදි ඒ පිළිබඳව අදහස් හා අවධානය යොමු තල යුතු කරුණු පිළිබඳව අමාත්‍යාංශයට ලැබීමට නියමිතය

3. බොරතෙල් ප්‍රවාහණය සඳහා ලංකා නැව් සංස්ථාව විසින් කුලියට ගත් නැවේ හිමිකරු හා විදේශීය නැව් හිමියා අතර ඇති වූ ආරවුලක් නිසා ලංකා ඛනිජතෙල් සංස්ථාවට බොරතෙල් ප්‍රවාහණය කිරීම නතර විය. එම කරුණ නිසා ලංකා නැව් සංස්ථාව විදේශීය නැව් හිමියා වන M/S Luna Shipping සහ ලංකා ඛනිජතෙල් සංස්ථාවට අතර අත්තිමේදී මූල්‍ය අර්බුදයක් ඇති විය. M/S Luna Shipping සහ ලංකා නැව් සංස්ථාව අතර ඇති වී තිබෙන මූල්‍ය අර්බුදය නීතිපති දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කරන ලද අතර නීතිපතිවරයාගේ මතය වූයේ දෙපාර්ශ්වය විසින් අත්සන් කර ඇති ගිවිසුමට (COA) අනුව අයකර ගැනීමේ විකල්පයක් සඳහා තීරක ක්‍රියාවලියක් ලන්ඩනයේදී ආරම්භ කළ හැකි බවයි. මේ අතරතුර ලංකා ඛනිජතෙල් සංස්ථාව සමග ඇතිව තිබෙන මෙම ගැටළුව විසදීම සඳහා නැව් සංස්ථාවේ ඛනිජතෙල් සංස්ථාවේ සහ මහා භාණ්ඩාගාරයේ ඉහල පෙලේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලදී. කමිටු වාර්තාවේ කරුණු පිළිබඳ කටයුතු නිම කිරීම සඳහා ලංකා නැව් සංස්ථාව හා ලංකා ඛනිජතෙල් සංස්ථාව විසින් එහි අඩංගු යම් යම් නෛතික ගැටළු පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවට ඒකාබද්ධව කරුණු සැලකිරීමක් සිදුකරන ලෙස කමිටුව දැනුම් දී ඇත. ඒ අනුව ඒකාබද්ධව කරුණු සැලකිරීමේ කටයුත්ත පිලියෙල වෙමින් පවතී. මෙම තත්ත්වය යටතේ ලංකා ඛනිජතෙල් සංස්ථාව සමග පවතින ගැටළුව විසඳෙන තෙක් තීරක තීන්දුවක් Luna Shipping සමාගමට එරෙහිව ලබා ගැනීම පසෙක තැබීමට නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය කොට තිබේ. තම අතුරු වාර්තාව ඉදිරිපත් කරමින් යථෝක්ත කමිටුව නිර්දේශ කොට ඇත්තේ ඒකාබද්ධ ඉල්ලීමක් ඉදිරිපත් කොට ඇතැම් නෛතික කරුණු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ පැහැදිලි කිරීම් ලබා ගන්නා ලෙසය. කෙටුම්පත් ලිපියට ලංකා ඛනිජතෙල් සංස්ථාවේ අනුමැතිය ලැබීමට නියමිතය.

4. 2020 අප්‍රේල් 28 වැනි දින සහ ඊට අසන්න දිනවලදී M.V. Ceylon Breeze සහ ධීවර යාත්‍රාවක් (FV) අතර චීන මුහුදු සීමාවේදී සට්ටන සිද්ධියක් වාර්තා විය. ගැටුම් වලට අදාල බැදියාවන් H&M රක්ෂණ ආවරණය යටතේ මෙය සලකා බලන ලදී. එනමුත් (US$ 100,000 deductable) අඩුකළ හැකි මට්ටමට වඩා පහළ සීමාවේ මෙම තක්සේරු වටිනාකම පවතී. නමුත් P&I සමාජයේ 1/4 වගකීම නොවෙනස්ව පවතී. මෙම තත්ත්වයන් තුළ, ඉතිරිය (3/4) සීමාසහිත සිලෝන් ෂිපින් කෝපරේෂන් ලිමිටඩ් විසින් අවසන් හිමිකම් පෑම සහ ඒ ආශ්‍රිත වියදම් එනම් මැනුම් වියදම්, වාර්තාකරුගේ වියදම්, නීතිමය ගාස්තු යනාදිය අවශෝෂණය කර ගත යුතුය. මෙම කාරණය දැනට P&I සමාජය විසින් පත් කරන ලද නීතිඥවරුන් සහ FV හි නීතිඥයින් අතර සාකච්ඡා වෙමින් පවතී.

## 35. ආශ්‍රිත පාර්ශව පිළිබඳ හෙළිදරව් කිරීම්

සමාගමේ ආශ්‍රිත පාර්ශව සඳහා ශ්‍රී ලංකා රජය, රජය සතු ව්‍යවසාය, සෙසු ආශ්‍රිත ආයතන හා ප්‍රධාන කළමණාකාරිත්ව නිලධාරීන් ඇතුලත් විය

### 35.1 ප්‍රධාන කළමණාකරණ නිලධාරි පිරිස් සමඟ ගණුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 24 ප්‍රකාරව "සම්බන්ධිත පාර්ශව පිළිබඳ හෙළිදරව් කිරීම්" යටතේ දැක්වෙන ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු ඍජුව හෝ වක්‍රව ආයතනයේ ක්‍රම සම්පාදනය, මෙහෙයවීම හා පාලනය කිරීමට බලය හා වගකීම පැවරී ඇති කණ්ඩායමය. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරිතුමිය හා මෙහෙයුම් කළමනාකරුවන් ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස වර්ග කරනු ලැබ තිබේ.

| ප්‍රධාන කළමණාකරණ නිලධාරි පිරිස් සමග ගණුදෙනු | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|
| පඩිනඩි හා අනෙකුත් කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 35,378,957 | 36,626,336 |
| හිඟහිටි ණය හා අත්තිකාරම් | 6,494,542 | 7,835,787 |
| පශ්චාත් රැකියා නියුක්ති ප්‍රතිලාභ | 14,144,916 | 14,859,187 |

**35.2** ආශ්‍රිත ආයතන සමහ ගණුදෙනු

<u>ශ්‍රී ලංකා රජය, රජය සතු ව්‍යවසාය සහ රජයට සම්බන්ධ අනෙකුත් ආයතන සමහ ගණුදෙනු</u>

ශ්‍රී ලංකා රජය සමාගමේ එකම ප්‍රාග්ධනධාරියා වන අතර එනයින් සමාගමේ මෙහෙයුම් කටයුතු පාලනය කිරිමේ අයිතිය රජය සතුවේ.
ඒ අනුව ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරනු ලබන හෝ ශ්‍රී ලංකා රජය විසින් ඒකාබද්ධව පාලනය කරනු ලබන ආයතන (රජය හා ආශ්‍රිත ආයතන) ආශ්‍රිත පාර්ශව සේ සමාගම විසින් සලකනු ලබයි.

| සම්බන්ධිත පාර්ශව | ගණුදෙනු ස්වභාවය | ගණුදෙනුවේ වටිනාකම<br>රු. | 2021.03.31 දිනට ලැබිය යුතු/ (ලැබීමට නියමිත) ශේෂය<br>රු. |
|---|---|---|---|
| ශ්‍රී ලංකා රජය | නැව්බඩු ප්‍රවාහන ගාස්තු, කුලියට ගැනීමේ ගාස්තු, බහාලුම් කුලියට දීම, නිශ්කාෂණය හා නැව්බඩු යැවීම සහ අනෙකුත් වියදම් පියවීම. | 325,134,564 | |
| | | (203,954,956) | 121,179,608 |
| රජය සතු ව්‍යවසාය | නැව්බඩු ප්‍රවාහන ගාස්තු, | 134,710,109 | |
| | නිශ්කාෂණය හා නැව්බඩු යැවීම සහ සෙසු අය පැනවීම් නිරවුල් කිරීම් | (20,020,985) | 114,689,124 |
| ලංකා ගල්අඟුරු සමාගම | නැව්බඩු ප්‍රවාහන ගාස්තු, ගොඩබෑම්, නැව් වලට තෙල් පැටවීමේ ගාස්තු | 4,652,902,079 | |
| | නිරවුල් කිරීම් | (3,552,949,885) | 1,099,952,195 |
| රජයට සම්බන්ධ වෙනත් ආයතන | නිශ්කාෂණය කිරීම් හා නැව්බඩු යැවීම, බහාලුම් කුලියට දීම හා වෙනත් ගාස්තු | 2,174,919 | |
| | නිරවුල් කිරීම් | (54,606) | 2,120,314 |

**36** වාර්තා කිරීමේ දිනට පසුව උද්ගත වූ සිදුවීම්

පහත දැක්වෙන දෑ හැරුණුකොට මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කරනු ලැබූ දිනයෙන් පසුව සීරුමාරු කිරීම් හෝ හෙළිදරව් කිරීම් සිදුකිරීම අවශ්‍ය වූ වැදගත් සිදුවීම් කිසිවක් නැත.

<u>Ceylon Breeze නෞකාව **M.V** Leopold සහ **M.V Cyclade** නෞකා සමඟ ගැටීම පිළිබඳ සිද්ධීන්</u>

Ceylon Breeze නෞකාව ඉන්දියාවේ Paradip වරායේ සිට චීනයේ Liyanyungng වරාය දක්වා කාලීන කුලී යාත්‍රා ගමනක (Time Charter Voyage) යෙදෙමින් මෙ.ටො. 60100 ක Iron Ore Pellet තොගයක් ගොඩබෑමට තිබූ අතර නාවික ඉන්ධන ලබා ගැනීමට 2021.06.11 දින Singapore වරාය වෙත ලඟාවිය.

<u>පළමුවැනි සට්ටනය (Leopold නෞකාව)</u>

2021.06.11 දින නාවික ඉන්ධන ලබාගනිමින් සිටියදී leopld නෞකාව ( molta ධජ ලියාපදිංචි) Ceylon Breeze නෞකාව දෙසට ඇදී ආ හෙයින් අපගේ නාවික යාත්‍රාවේ නැව් බඳේ Port quarter vessel bow ප්‍රදේශයට මෙන්ම එකී යාත්‍රාවටද හානි පමුණුවමින් ගැටුනි. ගැටුම් සම්බන්ධයෙන් වන බැඳියාවන්ට අදාල H & Mආවරණය යටතේ මෙය සලකා බලන ලදී. අපගේ යාත්‍රාවට සිදුවූ හානිය ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් 590,000 ක් පමණ වේ.

<u>දෙවැනි සට්ටනය (**Cyclade** නෞකාව)</u>

Ceylon Breeze නෞකාව 2021.06.12 දින නැංගුරම් දමා තිබියදී වරායෙන් පිටත නවත්වා තිබූ (Cyclade නැමති නෞකාවක් වෙතට අදී ගොස් එම නෞකාවට මෙන්ම අපගේ නෞකාවටද හානි සිදුවූ අතර ගැටුම්වලට අදාල බැඳියාවන් H & M රක්ෂණ ආවරණය අඩුකල හැකි වට්ටමට ඉහළින් (එනම් එ.ජ. ඩොලර් 100,000/-) ක් වශයෙන් තක්සේරු කරනු ලැබ ඇත. ලංකා නැව් සංස්ථාවේ කැමැත්ත ඇතිව P & I club ආයතනය විසින් නීතිවේදීන් (Solicitors) මේ සඳහා පත්කොට ඇත. පාර්ශ්ව දෙක අතර සුරැක්මපත් හුවමාරු කරගැනීම සඳහා සාකච්ඡා කෙරෙමින් පවතී.

**37** ප්‍රාග්ධන බැඳියාවන්

2014 පෙබරවාරි මස 18 වන දින එ.ජ. ඩොලර් මිලියන 70 වටිනාකමකින් යුක්ත DWT 63600 ක ධාරිතාවකින් යුත් පුහුණු පහසුකම් සහිත අළුත් නැව් දෙකක් Avic International Beijing Co.Ltd (China) ආයතනයෙන් මිලදී ගැනීම සඳහා නැව් සංස්ථාව ගිවිසුමකට බැඳුණි.

ස්වාධීන යෝජනාවක් යටතේ, DWT 63600 ක ධාර්තාවකින් යුක්ත වූ පුහුණු පහසුකම් සහිත එකී නැව්දෙක මිලදී ගැනීම 2013 දෙසැම්බර් මස 23 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

සැපයුම්කරු සමග ගැණුම්කාර ණය කොන්දේසි මත සමාගම විසින් ගිවිසුමකට එළඹ තිබූ නිසා ඒ සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම පිණිස මාස 06 ක කාලයක් සඳහා LIBOR+5.25% වාර්ෂික පොළී අනුපාතයක් යටතේ එ.ජ.ඩොලර් මිලියන 70 ක ණයක් මහජන බැංකුවෙන් ලබා ගන්නා ලදී. තවද, මහජන බැංකුව මේ සඳහා මාස 06 ක කාලයක් වෙනුවෙන් LIBOR+3% වාර්ෂික පොළී අනුපාතයක් යටතේ ඊට අතිරේකව එ.ජ. ඩොලර් මිලියන 10 ක් ඊට පොළී ගෙවීම පිණිස ලබාදී තිබේ. එයින් එ.ජ. ඩොලර් මිලියන 5.5 පමණක් ලංකා නැව් සංස්ථාව භාවිතා කර ඇත.

මූල්‍ය තත්ත්වය ප්‍රකාශිත දිනට බැංකුවට ගෙවිය යුතු වූ මුදල එ.ජ. ඩොලර් 65,135,464.31 කි.

## 38 මූල්‍ය අවදානම් කළමනාකරණය

මූල්‍ය උපකරණ භාවිතය තුළින් සමාගමට පහත දැක්වෙන මූල්‍ය අවදානම්වලට මුහුණ දීමට හැකිවන අතර එබඳු මූල්‍ය අවදානම් සමනය කර ගැනීම සඳහා සමාගම විවිධ කළමණාකරණ ක්‍රමෝපාය භාවිතයට ගනී.

38.1 ණය අවදානම

38.2 ද්‍රවශීලී අවදානම

38.3 වෙළඳපොළ අවදානම (ව්‍යවහාර මුදල් ඒකක අවදානම හා පොලී අනුපාතික අවදානම)

38.4 ප්‍රාග්ධන කළමනාකරණය

සමාගමේ මූල්‍ය උපකරණවලට අයත් වන්නේ ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවූ කොටස් ආයෝජන, කාලීන තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන, මුදල් හා මුදල් සාමානයන් ය. සමාගමට එහි ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වලින් වෙළඳ ලැබීම් නියමිත හා ගෙවීම් නියමිත තිබේ. කෙටිකාලීන තැන්පතවල ප්‍රධාන කාර්යාර්ථය වනුයේ මෙහෙයුම් කටයුතු සඳහා ද්‍රවශීලතාව පවත්වා ගැනීමය. ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවන කොටස්වල ආයෝජනය කිරීම වූ කලී ක්‍රමෝපායිය ආයෝජනයන්ය.

### 38.1 ණය අවදානම

ණය අවදානම වූ කලී, සම පාර්ශවකරු විසින් ගිවිසුමට අදාළ බැඳියාවන් ඉටුකිරීමට ආපොහොසත් වන තැන්හිදී සමාගමට දැරීමට සිදුවන මූල්‍ය පාඩුය. ණය අවදානම් උද්ගත වන්නේ ප්‍රධාන වශයෙන්ම බැංකුවල ඇති තැන්පතු, මුදල් හා මුදල් සාම්‍යයන් (අත ඇති මුදල් හැර) සහ ගණුදෙණුකරුවන් වෙතින් වූ ලැබීම් නියමිත වලිනි. ණය අවදානමට යටත් මූල්‍ය වත්කම් උපරිම ණය අවදානම්වලට නිරාවරණය වීම ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකමට සමාන වේ.

2021 මාර්තු 31 දිනට වාර්තා කරන ලද මූල්‍ය උපකරණ උපරිම අවදානම්වලට නිරාවරණය වීම පහත සටහනින් දැක්වේ.

| | සටහන් | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|
| **මූල්‍ය වත්කම් අවදානම්වලට නිරාවරණය වීම** | | | |
| මුදල් හා මුදල් සාම්‍යයන් | **38.1.1** | 847,586,043 | 479,417,164 |
| බැංකු වෙත ඇති කාලීන තැන්පතු | | 24,839,609 | 24,107,923 |
| වෙළඳ ලැබීම් නියමිත | **38.1.2** | 1,829,796,029 | 3,049,370,999 |
| වෙනත් ලැබීම් නියමිත | | 136,091,334 | 126,199,148 |
| | | **2,838,313,016** | **3,679,095,234** |

### 38.1.1 මුදල් හා මුදල් සාම්‍යයන්

මුදල් හා මුදල් සාමානයන් ඇතුලත් වන්නේ බැංකුවේ ඇති මුදල් (අතැති මුදල් හැර) ඉල්ලුම් තැන්පතු සහ මාස තුනකට හෝ ඊට අඩු මුලික කල්පිරීම් සහිත පහත දැක්වෙන ආයෝජනයන්ය.

| | සටහන් | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|
| බැංකුවේ ඇති මුදල් | **38.1** | 847,586,043 | 479,417,164 |
| | | 847,586,043 | 479,417,164 |

### 38.1.2 වෙළඳ ලැබීම් නියමිත

සමාගම ප්‍රධාන වශයෙන් නාවික නියෝජිතයින් සහ රාජ්‍ය ආයතන සමග වෙළඳාම් කටයුතු කරයි. සමාගමේ කළමණාකාරිත්වය අතීත අත්දැකීම් පදනම් කරගෙන නැව් ඒජන්ත වරුන්ගේ ණය තත්වය තක්සේරු කරයි. මීට අමතර වශයෙන්, කළමනාකරණ කමිටුව සහ මණ්ඩලය (Board) විසින් ගෙවීමට ඇති ශේෂයන් කෙරීගෙන යන පදනමක් යටත් අධීක්ෂණය කරයි.

සමාගමේ වෙළඳලැබීම් නියමිත සම්බන්ධයෙන්වන කාල විශ්ලේෂණය පහත දැක්වේ.

| | සටහන් | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|
| එක් අවුරුද්දක් දක්වා | | 733,865,504 | 1,931,374,657 |
| අවුරුදු 1 සිට 4 දක්වා | | 346,677,041 | 532,088,212 |
| අවුරුදු 4 ට වැඩි | | 749,253,484 | 585,908,130 |
| | 38.1.2 | 1,829,796,029 | 3,049,370,999 |

වෙළඳ ලැබීම් නියමිත සම්බන්ධයෙන් දරන ලද පාඩු පිළිබඳ ඇස්තමේන්තුවක් මගින් දැක්වෙන හානිකරණයන් මූල්‍ය සටහන් සම්බන්ධයෙන් වන 3.9.1 සටහන සඳහා ප්‍රතිපාදන සැලසීම පිණිස සමාගම ප්‍රතිපත්තියක් ස්ථාපනය කරයි. ස්ථාපනය කරන ලද හානිකරණ ප්‍රතිපත්ති අනුව හානිකරණ පාඩු මැන ගැනීම සඳහා සේවාදායකයින් වෙන් වෙන් වශයෙන් සමාලෝචනය කරනු ලැබේ. මේ පිළිබඳව වෙළඳ ලැබීම් නියමිත හා හානිකරණය සඳහා වූ ප්‍රතිපාදන සම්බන්ධයෙන් වන මූල්‍ය සටහන් 18.1 කරුණාකර බලන්න.

### 38.1.3 සෙසු මූල්‍ය වත්කම්

සමාගමේ සෙසු මූල්‍ය වත්කම් පැන නගින්නා වූ ණය අවදානම් වලට ඇතුලත් වන්නේ, අදාළ බැංකුවෙත ඇති තැන්පතුය. ණය අවදානමක් සමාගමට ඇතිවන එකී මූල්‍ය සාධන පත්‍රවල ඉදිරියට ගෙනයන වටිනාකමට සමාන වන මෙකී මූල්‍ය උපකරණවලින් ඇති විය හැකි ණය අවදානම සමාගම විසින් කළමනාකරණය කරගනු ලබන්නේ රජය සතු බැංකු හා ණය ශ්‍රේණිගත බැංකු වෙත තම අරමුදල් තැන්පත් කිරීමෙනි.

## 38.2 ද්‍රවශීල අවදානම

ද්‍රව්‍යශීල අවදානම යනු තම මූල්‍ය බැඳියාවන් නියමිත කාලයට ඉටුකිරීමට සමාගම අපොහොසත් වීමයි. ද්‍රව්‍යශීලතාවය කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ප්‍රවේශය වූ කලී සාමාන්‍ය සහ අනපේක්ෂිත තත්වයන් යටතේ පිළිගත නොහැකි පාඩු නොදරමින් නියමිත වෙලාවට බැඳියාවන් ඉටුකිරීම පිණිස හැකිතාක් දුරට නිරන්තරයෙන්ම ප්‍රමාණවත් මුදල් තිබෙන බව සහතික කිරීමය.

සමාගම විසින් මූල්‍යවත්කම් හා බැඳියාවන් අන්වේෂණය කරනු ලබන අතර, මාසික පදනමක් මත පුරෝකථනය කළ මෙහෙයුම් මුදල් ප්‍රවාහ පිළියෙල කරයි. ආංශික කාර්ය සාධනය අන්වේෂණය කිරීම් වස් වාර්ෂික අයවැය එක් එක් අංශය තුළ පිළියෙල කෙරේ. සමාගමට තම මෙහෙයුම් කටයුතු කිරීමේදී ඇතිවන අවශ්‍යතා පිරිමසාලීම් පිණිස ප්‍රමාණවත් මුදල් තිබෙන බව සහතික කිරීම පිණිස කළමණාකාරිත්වය විසින් පුරෝකථනය කළ මාසික මෙහෙයුම් මුදල් ප්‍රවාහ වාර්ෂික අයවැය සහ ද්‍රවශීලතා අවශ්‍යතා අන්වේෂණය කෙරේ. වාර්තා කිරීමේ අවසාන දිනය වන විට ඉතිරිව ඇති කාල පරිච්ඡේදය පදනම් කරගෙන 2021 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය වත්කම් හා බැඳියාවන් හි කල්පිරීම් විග්‍රහයන් පහත දැක්වේ. එහි හෙළිදරව් කරනු ලැබ ඇති මුදල් ප්‍රමාණයන්, ගිවිසුම්වලට අදාළ වට්ටම් නොකළ මුදල් ප්‍රවාහයන්ය.

| මූල්‍ය වත්කම් හා බැඳියාවන් | ඉදිරියට ගෙනයන වටිනාකම | මාස 6/ මාස 6 ට අඩු | මාස 6 - 12 | වසරකට වඩා වැඩි |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **මූල්‍ය වත්කම්** | | | | |
| AFS මූල්‍ය වත්කම් | 19,621,054 | | | 19,621,054 |
| කල්පිරීම් ආයෝජන | | | | |
| ආයෝජන | 120,615,896 | 120,615,896 | - | - |
| කෙටිකාලීන ආයෝජන | 24,839,609 | - | 1,945,051 | 22,894,559 |
| වෙළඳ ලැබීම් නියමිත | 1,829,796,029 | 1,829,796,029 | - | - |
| වෙනත් ලැබීම් නියමිත | 136,091,334 | 61,028,331 | 75,063,003 | - |
| මුදල් හා මුදල් සාමාන්‍යයන් | 847,586,043 | 847,586,043 | - | - |
| | 2,978,549,966 | 2,859,026,300 | 77,008,054 | 42,515,613 |
| මූල්‍ය බැඳියාවන් | | | | |
| වෙළඳ ගෙවීම් නියමිත | 502,049,215 | 502,049,215 | - | - |
| වෙනත් ගෙවීම් නියමිත | 329,929,292 | 212,710,263 | 5,472,748 | |
| | 831,978,507 | 714,759,478 | 5,472,748 | |

## 38.3 වෙළඳපොළ අවදානම ( ව්‍යවහාර මුදල් හා පොලී අවදානම )

වෙළඳපොළ අවදානම යනු සමාගමේ ආදායම හෝ මූල්‍ය උපකරණවල ඉදිරියට ගෙනයන වටිනාකමට බලපෑම් ඇතිවිය හැකි විදේශ විනිමය අනුපාතික හා පොලි අනුපාතික වැනි වෙළඳපොළ මිල ගණනන්වල වෙනස්වීමය.

### 38.3.1 ව්‍යවහාර මුදල් අවදානම :-

එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයේ හා අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල වටිනාකමට අනුව වටිනාකම උච්චාවචනය වීමෙන් උද්ගතවිය හැකි අවදානම මෙනමින් දැක්වේ. එ.ජ. ඩොලරයට අනුව හා වෙනත් ව්‍යවහාර මුදල් අනුව සමාගම විසින් සපයන ලද සේවාවන්හි කාර්යිය ව්‍යවහාර මුදල් සහ යම් යම් වෙළඳ ලැබීම් නියමිත හා ගෙවීම් නියමිත විදේශ ව්‍යවහාර මුදල් අනුව දක්වා ඇත.

2020/21 වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය සඳහා වූ මෙහෙයුම් ප්‍රතිඵල තුළ සමාගම විසින් වාර්තා කරන ලද හා ඇතුළත් කරන ලද විදේශ විණිමය පාඩුව රු. 622,239,890 ක් වේ.

### 38.3.2 පොලී අවදානම

කෙටි කාලීන බැංකු තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සහ කාලීන තැන්පතු සම්බන්ධයෙන් වෙළඳපොළේ පවතින පොලී අනුපාතිකයන්ගෙන් වෙනස්වීම් තුළින් සමාගමට උද්ගත විය හැකි අවදානම පොලී අවදානම වශයෙන් හැඳින්විය හැකිය.
ආයතනය විසින් පවත්වාගෙන යන බැංකු ශේෂයන් හා කාලින තැම්පතු පවතින්නේ රජය සහ ණය ශ්‍රේණිගත බැංකු වලය. ආයතනය විසින් පොලි අනුපාත අවදානම ක්‍රියාකාරී අධීක්ෂණය තුලින් කළමනාකරණය කරයි.

## 38.4 ප්‍රාග්ධන කළමනාකරණය

කොටස්ධාරීන් වෙත උපරිම ප්‍රතිලාභ සැලසීම වෙනුවෙන් ප්‍රාග්ධන පිරිවැය අඩු කිරීම සඳහා ක්‍රියාත්මක සමාගමක් වශයෙන් පැවතීමට සමාගමට තවදුරටත් ඇති හැකියාව ආරක්ෂා කරනු පිණිස තම ප්‍රාග්ධනය සමාගම විසින් කළමනාකරණය කරනු ලබයි. ගියරුම් අනුපාතය පදනම් තරගෙන සමාගම ප්‍රාග්ධන ආකෘතිය අන්වේෂණය කරයි. මුළු කොටස් ස්කන්ධය අනුව, මුළු ණයට ගැනුම් ලෙස ගියරුම් අනුපාතය ගණනය කරනු ලැබේ. මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ දක්වා ඇති පරිදි සමස්ත ණය ගැනුම් තුළ ජංගම නොවන හා ජංගම ණයට ගැනුම් ඇතුළත් වේ. සමාගමේ සමස්ත ණයට ගැනුම් හා කොටස් ස්කන්ධයේ (2020 සහ 2021 මාර්තු 31) අනුපාතය පහත දැක්වේ.

| | 2020/2021 | 2019/2020 |
|---|---|---|
| ප්‍රාග්ධන පංතිය | රු. | රු. |
| මුළු ණයට ගැනීම් | 12,139,697,919 | 12,434,283,858 |
| මුළු කොටස් ස්කන්ධය | (2,041,613,494) | (1,275,502,117) |
| තෝලන අනුපාතය (x) | -595% | -975% |

## 39 නැව්බඩු රක්ෂණ පිරිවැය ආපසු ලබා ගැනීම

2019.06.17 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ප්‍රධානය කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 17/1791/129/023 සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණය ප්‍රකාරව සහ ලංකා නැව් සංස්ථාව විසින් 2019.07.29 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුව නැව් බඩු රක්ෂණ පිරිවැය ලංකා නැව් සංස්ථාව විසින් අවශෝෂණය කලයුතු අතර එම පිරිවැය පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| මූල්‍ය වර්ෂය | මුදල් ප්‍රමාණය |
|---|---|
| 2015/16 | 12,512,559.00 |
| 2016/17 | 21,447,333.00 |
| 2017/18 | 21,502,890.00 |
| 2018/19 | 22,571,307.28 |

තවද, VAT ඉන්වොයිස්, රක්ෂකයන් (insurers) විසින් නිකුත් කරන ලද ලදුපත් වැනි ලිපිලේඛනවල මුල් පිටපත් ගිණුම්කරණ කටයුතු සඳහා අවශ්‍යවන අතර 2019.03.31 න් අවසන් වර්ෂය සඳහා ගිණුම් ගතකල මුදල රු.22,571,307.28 කි .

නැව් බඩු රක්ෂණයට අදාළ රු .10,808,348.62 ක මුදලක් ප්‍රතිපුරණය කිරීම, ගිණුම්ගත කිරීමක් සිදු නොවීමට හේතුව නම්, අවශ්‍ය ලිපිලේඛන නොමැති වීමය. නැව් බඩු රක්ෂණයට අදාල රු.44,654,433.25 ක මුදල ප්‍රතිපුරණය කිරීම් 2019/2020 හා 2020/2021 මූල්‍ය වර්ෂයේ රඳවාගත් ඉපැයීම් වලට ගලපා ඇත.

## 40 ප්‍රාග්ධනය විශාල ලෙස අහිමි වීම

ලංකා නැව් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිලියෙල කරනු ලැබ තිබෙන්නේ අඛණ්ඩ පදනම යටතේය. 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලංකා නැව් සංස්ථාව රු. 813,320,485 ක ශුද්ධ පාඩුවක් දරා ඇති අතර 2019/20 වර්ෂයේදී එය රු. 1,154,469,109 ක් විය. වාර්තා කිරීමේ දිනය වන විට සමාගමේ ශුද්ධ වත්කම්වලින් රු. 2,041,613,494 (2019/20 - රු. 1,275,502,117) සෘණ අගයක් පිළිඹිබු විය. ඉහත කී මූල්‍ය ප්‍රතිඵල වූ කලී පහත දැක්වෙන තත්ත්වයන් මත උද්ගත වූ ඒවාය.

- යාත්‍රාවන් ලබා ගැනීමට ගත් ණය සඳහා ගෙවමින් තිබෙන ඉහල පොලී ප්‍රමාණය
- විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි දක්වා ඇති නාවික යාත්‍රාවන්හි ක්ෂය වීම්
- එ.ජ ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ හේතුව නිසා විස්තීරණ ආදායම් ප්‍රකාශයට අයපත් කොට ඇති විශේෂිත විණිමය පාඩු
- නැව් සඳහා ලබාගත් ණය සඳහා වූ වාරික හැරුණු කොට නැව් දෙකෙන් උපයන ආදායම මෙහෙයුම් වියදම් වලට වඩා අඩු මට්ටමක පැවතීම
- නාවික යාත්‍රා නඩත්තු කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදු වීම
- බදු ගෙවීමෙන් පසු ශුද්ධ පාඩු 2016/17 සිට 2020/21 දක්වා පැන නගී

තවද නැව් සඳහා ලබා ගත් ණය ආපසු ගෙවීම්වලට අදාල මූල්‍ය ක්‍රියාකාරකම් හා මූල්‍ය පිරිවැය වෙනුවෙන් ද අදාළ කරගනු ලබන්නේ එ.ජ. ඩොලරයයි.

ඒ අනුව 2021 මාර්තු 31 දිනට සෘණ ශුද්ධ වත්කම් තත්වයක් පෙන්නුම් කරයි.

ඒ අනුව සමාගමේ ශුද්ධ වත්කම් අගය ප්‍රකාශිත ප්‍රාග්ධනය වන (ශ්‍රී ලංකා රුපියල් මිලියන 50) ඉක්මවා තිබෙන අතර 2007 සමාගම් පනතේ අංක 07 දරන සමාගම් පනතේ 220 වගන්තිය ප්‍රකාරව ප්‍රාග්ධන තත්ත්වය සම්බන්ධයෙන් විශාල පාඩුවක් විද්‍යමාන වේ.

2007 අංක 07 සමාගම් පනතේ 219 වගන්තිය ප්‍රකාරව මෙම තත්ත්වය අධ්‍යක්ෂකවරුන් විසින් සාකච්ඡා කොට සමාගමේ ක්‍රියාකාරී බව සම්බන්ධයෙන් (going concern) ප්‍රඥාගෝචරව ක්‍රියා කල යුතු වේ.

ලංකා නැව් සංස්ථාව සම්පූර්ණයෙන්ම රජය සතු ව්‍යාපාරික ආයතනයක් වන අතර නැව් තැනීම සඳහා ලබා ගත් එ.ජ. ඩොලර් 71,910,464.32 වන ණය ලබා දී ඇත්තේ 2034 ජුනි මස 03 දින තෙක් වූ භාණ්ඩාගාර ඇප සහතිකයක් මතය.

### ශ්‍රී ලංකා නැව් සංස්ථාව

### ප්‍රධාන උපලේඛණය

### පරිපාලන වියදම්

| ගිණුම් අංකය | විස්තරය | 2021 | 2020 |
|---|---|---|---|
| 50000 | සේවක මණ්ඩලය පුහුණු කිරීම | 227,775 | 231,180 |
| 50030 | සේ.අ.අරමුදලට දායක වීම | 14,050,798 | 12,918,595 |
| 50040 | විධායක කාර්ය මණ්ඩලයට වැටුප් | 66,470,465 | 68,820,367 |
| 50050 | ලිපිකරු හා සමාන්තර සේවා වැටුප් | 40,606,871 | 38,007,197 |
| 50060 | තාවකාලික හා අනියම් සේවක වැටුප් | 1,169,596 | 954,631 |
| 50080 | අතිකාල දීමනා | 9,633,445 | 11,183,957 |
| 50090 | ප්‍රසාද දීමනා | 338,995 | 2,726,942 |
| 50100 | වෛද්‍ය අරමුදලට දායකත්වය | 44,000 | - |
| 50110 | සේ.භා.අරමුදලට දායකත්වය | 2,810,160 | 2,582,595 |
| 50120 | වෛද්‍ය නිවාඩු ගෙවීම් | 4,568,835 | 3,773,043 |
| 50140 | පාරිතෝෂික ගෙවීම් | 6,525,934 | 13,451,893 |
| 50170 | දුෂ්කර දීමනා - නොරොච්චෝලේ | 1,376,850 | 1,046,900 |
| 60010 | කාර්යාල කුලී | 18,798,180 | 18,254,880 |
| 60020 | මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 1,373,209 | 1,622,390 |
| 60030 | සාමාජික දායකත්වය | 1,409,553 | 248,743 |
| 60050 | රක්ෂණ | 6,896,863 | 7,907,244 |
| 60060 | කාර්යාල පරිශ්‍රය හා උපකරණ නඩත්තුව | 4,700,118 | 4,387,206 |
| 60070 | විදුලිය සඳහා ගෙවීම් - ප්‍රධාන කාර්යාලය | 1,354,857 | 1,793,010 |
| 60072 | විදුලිය සඳහා ගෙවීම් - නිල නිවාස | 24,949 | 26,450 |
| 60080 | සේවක සුභසාධනය | 4,762,216 | 4,954,163 |
| 60090 | ආරක්ෂක ගාස්තු | 2,322,300 | 2,046,959 |
| 60110 | පරිගණක වියදම් | 520,190 | 813,331 |
| 60140 | බංගලා නඩත්තු- මෝදර | 17,520 | 57,692 |
| 60170 | පරිවර්තන ගාස්තු | 169,628 | 190,596 |
| 60210 | ජල පරිභෝජනය - ප්‍රධාන කාර්යාලය | 180,000 | 180,000 |
| 60220 | ජල පරිභෝජනය - නිල නිවාස | 38,497 | 21,927 |

| | | | |
|---|---|---|---|
| 61010 | දුරකථන ගාස්තු | 2,210,467 | 2,272,408 |
| 61020 | තැපැල් හා විදුලි පණිවුඩ ගාස්තු | 5,065 | 25,370 |
| 61040 | අන්තර්ජාල/ වි.තැපැල් ගාස්තු | 2,223,117 | 2,580,924 |
| 62000 | විදේශ ගමන් හා වියදම් | - | 610,043 |
| 62010 | දේශීය ගමන් | 4,835,293 | 3,464,925 |
| 62030 | වාහන නඩත්තුව | 3,597,727 | 4,247,781 |
| 62040 | ගමන් බිමන් හා යැපීම් දීමනා | 54,700 | 83,400 |
| 63010 | සංග්‍රහ | 134,976 | 190,669 |
| 63020 | දැන්වීම් | 2,670,056 | 2,664,015 |
| 63040 | රාජ්‍ය ප්‍රදර්ශණ වියදම් | - | 72,950 |
| 63060 | වාර්ෂික ලියාපදිංචි ගාස්තුව | 41000 | 271,860 |
| 64000 | අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු | 1,097,000 | 225,560 |
| 64010 | විගණකවරුන්ගේ ගාස්තු | 741,000 | - |
| 64020 | වෘත්තිය වෙදින්ට ගෙවීම් හා නෛතික ගාස්තු | 637,400 | 953,910 |
| 64060 | ටෙන්ඩර් කමිටුවේ දීමනා හා වියදම් | 556,000 | 846,000 |
| 65010 | විවිධ වියදම් | 287,162 | 104,226 |
| 65040 | පරිත්‍යාග | 32,500 | 112,500 |
| 65800 | ක්ෂය වීම් | 5,432,414 | 5,277,432 |
| 70000 | බැංකු ගාස්තු | 3,552,427 | 3,981,429 |
| 70030 | අයිරා පොලී | 203 | - |
| 70050 | මුද්දර බදු වියදම් | 41,925 | 50,100 |
| | ජීවගණක උපකල්පනයක් වෙනස්වීම මත උද්ගත වූ පාඩුව | (2,666,471) | (9,587,688) |
| | | 215,875,765 | 216,649,745 |